විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

දිස්ත්‍රික් ලේකම් කාර්යාල

පටුන

			පිටු අංක.
1.	විධායක සාරාංශය		2
2.	මුලාෳ ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය		3
3.	දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල නිරීක්ෂණ		
	3.1	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	6
	3.2	අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	11
	3.3	බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	15
	3.4	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	18
	3.5	කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	26
	3.6	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	30
	3.7	ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	37
	3.8	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	43
	3.9	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	53
	3.10	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	74
	3.11	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	77
	3.12	කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	82
	3.13	කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	87
	3.14	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	95
	3.15	මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	103
	3.16	මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	111
	3.17	නුවර එළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	120
	3.18	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	126
	3.19	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	130
	3.20	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	139
	3.21	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	143
	3.22	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	145
	3.23	යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	150
	3.24	මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	156
	3.25	මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	160

1. විධායක සාරාංශය

2021, 2022 සහ 2023 වර්ෂවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හා ඒවා යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 ක මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ඇතුළත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ට අදාළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. එසේ විගණනය කරනු ලබන මූල්‍ය ප්‍රකාශන හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන නිරීක්ෂණයන් හා මාගේ නිර්දේශයන් ඒ ඒ වර්ෂවල දී පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එම වාර්තාවල ඇතුලත් මාගේ නිරීක්ෂණයන් හා නිර්දේශ අතරින් තවදුරටත් නොවිසඳී ඇති පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කළ යුතු යැයි මා අදහස් කරන වැදගත් නිරීක්ෂණයන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341 ක් ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැය ශීර්ෂ සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන අතර වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂයන් සඳහා වෙන්කරන ප්‍රතිපාදනයන් ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වැය කිරීම ද සිදු වේ. එසේ වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන උපයෝගී කර ගෙන ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කරමින් විවිධ සංවර්ධන හා සුබසාධන වැඩසටහන් ක්‍රියාවට නංවමින් ජනතාවට අවශ්‍ය කරන සේවාවන් හා පහසුකම් සැපයීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු වේ. දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වන කටයුතු මෙහෙය වීම, සමාජ සුබසාධන ප්‍රතිලාභ ගෙවීමේ කාර්යයන් සඳහා සහාය වීම, රජයේ ඉඩම් සම්බන්ධ කටයුතු, ආපදා සහන සේවා කටයුතු සිදු කිරීම වැනි කාර්යභාරයක් ද ඇතුලත්ව වෙනත් රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් වෙනුවෙන් සේවා සැපයීමේ නියෝජිත කාර්ය ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදු කරනු ලබයි. මෙම විෂය ක්ෂේත්‍රයන් පරීක්ෂාවේ දී අනාවරණය වූ නිරීක්ෂණ ද ඇතුලත්ව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී 2021,2022 හා 2023 වර්ෂවල පාර්ලිමේන්තුවට වාර්තා කළ එහෙත් තවදුරටත් විසඳී නොමැති විගණන නිරීක්ෂණයන් ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ මෙම ත්‍රෛවාර්ෂික තත්ත්ව වාර්තාවේ දක්වා ඇත.

2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලිමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

අහිතකර මතය

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

මතය ව්‍යාවනය කිරීම

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙළි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල මතය පිළිබඳ විස්තර

2021, 2022 සහ 2023 වසර සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

	2021	2022	2023
තත්ත්වාගණනය නොකල	03	03	02
තත්ත්වාගණනය කල	22	22	23
අහිතකර	-	-	-
වියාචනය	-	-	-
මතය තවමත් තීරණය කර නොමැති ගණන	-	-	-
මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන	-	-	-

	නම	2021	2022	2023
1.	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
2.	අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ
3.	බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
4.	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
5.	කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
6.	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
7.	ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය නොකළ
8.	හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
9.	කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
10.	මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
11.	කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
12.	කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

13.	කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
14.	මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
15.	මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
16.	මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
17.	නුවර එළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
18.	පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ
19.	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
20.	රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
21.	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
22.	වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය නොකළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
23.	යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
24.	මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ
25.	මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ	තත්ත්වාගණනය කළ

3. දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධයෙන් වන විගණන නිරීක්ෂණ

3.1 අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,625,116,050	3,459,491,085	165,624,965	තත්ත්වාගණනය කළ
2022	3,921,985,477	3,842,420,658	79,564,819	තත්ත්වාගණනය කළ
2023	7,596,175,528	7,524,581,657	71,593,871	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	දමන, අක්කරපත්තු හා කල්මුණ යන ප්‍රදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුවලට අදාළව රු.24,538,440ක බදු මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.	2023	දීර්ඝකාලීන හිඟබදු කුලී කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය.	විවිධ ගැටලු හේතුවෙන් දීර්ඝකාලීන හිඟබදු වටිනාකම අය කිරීමේ දී බාධාවන් සිදු වී ඇති බවට ඔබ වෙත දන්වමි.	2024 සැප්තැම්බර් 30 දිනටත් නිර්දේශය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වී නොතිබුණි.
2.	අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණ ද 2024 මැයි 07 දින වන විටත් ඒ පිළිබඳව ඉදිරි පියවර ගෙන නොතිබුණි.	2023	සිදු වී ඇති පාඩුවට වගකිව යුතු පාර්ශවයකින් අය කිරීමට හෝ වෙනත් අදාළ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වීම.	පරීක්ෂණ මණ්ඩල තීරණය 2023 ජූලි 06 දින දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් සිදුකර විනය ක්‍රියාමාර්ගයක් ගෙන අවසන් නොමැති නිසා මු.රෙ.104(4) අවසන් පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම නිම කර නොතිබුණි.

3.	2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න් 1% ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සත්‍ය වශයෙන් දරන ලද වියදම නොසලකා හැර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ	2023	චක්‍රලේඛය ප්‍රකාරව සත්‍ය වශයෙන් දරන ලද පරිපාලන වියදම් පමණක් නිසි අනුමැතියකින් යුතුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු වීම.	අම්පාර දිස්ත්‍රික්කය තුළින් වී මෙට්‍රික් ටොන් 30000ක් මිලදී ගත යුතු බවට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව දැනුම් දී තිබූ අතර වී මිලදී ගෙන පැය 24ක් ඇතුළත අදාළ ගොවි මහතාගේ ගිණුමට මුදල් බැර කළ යුතු විය. මෙය ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියක් වූ අතර රු.මිලියන 270ක වටිනාකමින් යුත් වී තොගයක් මිලදීගෙන ගොවීන් වෙත ගෙවීම් කිරීමට සිදු විය. වී මෝල් හිමියන් තෝරා ගැනීම, ඔවුන් ලියාපදිංචි කිරීම, ගොවියන් හඳුනා ගැනීම, ඔවුන්ගෙන් මිලදී ගනු ලබන වී ප්‍රමාණය තීරණය කිරීම, වාර්තා සකස් කිරීම, බැංකු වෙත ගෙවීමට යොමු කිරීමට සිදුවීම, මෙම කාර්යයන් සඳහා රාජකාරි වේලාවෙන් බැහැරව රාජකාරි කිරීමට සිදුවීම, නිරන්තරයෙන් ක්ෂේත්‍රයට යාමට සිදුවීම, මෙම කටයුතු සඳහා පෞද්ගලික ජංගම දුරකථන ආදිය යොදාගැනීමට සිදුවීම යන කරුණු මත පූර්වගාමී දිස්ත්‍රික් ලේකම් විසින් සංවර්ධන මූල්‍ය	නිර්දේශය පරිදි කටයුතු කර නොතිබුණි.

	වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාල නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර තිබුණි.			දෙපාර්තමේන්තුව විමසා ලද උපදෙස් අනුව කමිටුවක් පත්කර එහිදී එළඹි තීරණ මත මෙම ගෙවීම් සිදුකර ඇති අතර ගෙවීමට ප්‍රථම අංශ ප්‍රධානින්ගේ හා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ ලබාගෙන ඇත.	
4.	අඬ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාශයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 05ක කාලයක සිට රඳවාගෙන තිබුණි.	2023	නියමිත කාලය තුළ වැඩ අවසන් කර තැන්පතු ගිණුම නිරවුල් කළ යුතු වීම.	මෙම මුදල අඬ්ඩාලච්චේන අක්/අල්/අර්හම් පාසලට අදාළව පෞද්ගලික ඉඩමක් පවරා ගැනීමේ කටයුත්ත සඳහා තැන්පත් කර ඇත. අදාළ ඉඩම සඳහා පවරා ගැනීමේ කටයුත්ත සඳහා අධික කාලයක් වැය වන පියවර කිහිපයකින් සමන්විත කාර්යයකි. එම සෑම පියවරක් සඳහාම වෙන වෙනම ඉඩම් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතුව ඇත. තවද මිනින්දෝරු සැලැස්ම ලැබීමේ ප්‍රමාදයක් ඇති අතර සියළු පියවරයන් සම්පූර්ණ වූ	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම නිම කර නොතිබුණි.

				පසු ගෙවීම් කර අදාල ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් දැනුම් දී ඇත.	
5.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් පසුගිය වර්ෂ 22කට අධික කාලයක සිට අලුත්වැඩියා සිදුකිරීම සඳහා ගරාජයකට භාර දී තිබුණත්, එය අලුත්වැඩියා කිරීමට හෝ ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.	2023	මුදල් අමාත්‍යාංශයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද 2020 ඔක්තෝබර් 02 දිනැති හා අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව භාවිතයට ගත නොහැකි රථවාහන කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වීම.	මෙම ලොරි රථය දිරා ගොස් ඇති බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රැගෙන ඒම අපහසු වී ඇති බැවින් එම ස්ථානයේදීම වෙන්දේසි කිරීමට තීරණය වි ඇත. මෙම ලොරි රථය පුනරුත්ථාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති බැවින් වත්කම් චක්‍රලේඛ 03/2008 අනුව අයිතිය දිස්ත්‍රික් ලේකම් නමින් පවරා ගත යුතුවේ. පුනරුත්ථාපන අමාත්‍යාංශයක් මේ වන විට නොමැති අතර එම විෂය කටයුතු කරනු ලබන අමාත්‍යාංශය හඳුනා ගැනීම දුෂ්කර වි ඇත.කෙසේ වෙතත් මෙම රථය පවරා ගැනීම සම්බන්ධ ඉල්ලීම අධිකරණ හා බන්ධනාගාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම නිම කර නොතිබුණි.
6.	2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් වී	2023	අයකර ගත යුතුව සහල් ප්‍රමාණය කඩිනමින් අයකර ගැනීමට හා එසේ සහල් ලබා නොදෙන වී	මෙම වැඩසටහන යටතේ සහල් මෝල් හිමියන් භාරයේ ඉතිරිව පැවති සහල් තොග සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ	2024 ඔක්තොම්බර් 02 දින වන විට අදාළ සහල් මෝල් හිමියන් විසින් සහල් කි.ග්‍රෑ.1,193,493.89 ක ප්‍රමාණයක් ලබා

මිලදීගෙන අඩු ආදායම්ලාභීන් වෙත සහල් ලබා දීමෙන් අනතුරුව සහල් මෝල් හිමියන් භාරයේ පැවති රජයේ වී තොග සහල් කර අලෙවි කිරීම සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 ජූලි 17 දිනැති හා අංක DFD/MD/GPPP/PD/ Maha/2022/23 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඉතිරි වී තොග සම්බන්ධයෙන් 2023 සැප්තැම්බර් මස සිදුකරන ලද පළමු ටෙන්ඩරය අනුව තෝරාගත් ගැනුම්කරු හට සහල් අලෙවි කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07ක් යටතේ තෝරාගෙන තිබූ වී මෝල් 24ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබූ රු.170,122,703ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,226,373ක් 2024 මැයි 05 දින වන විටත් සැපයුම්කරු වෙත ලබා දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදල් ලබාදීමට කටයුතු කර නොතිබුණි.	මෝල් හිමියන් සම්බන්ධයෙන් කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු වීම.	අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DFD/MD/GPPP/PD/ Maha/2022-23 හා 2023 ජූලි 17 දිනැති ලිපියට අනුව ප්‍රසම්පාදන කටයුතු හරහා අලෙවි කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව පළමු අදියර යටතේ තෝරාගන්නා ලද ගැනුම්කරුවන් වෙත සහල් අලෙවි කිරීමේ කටයුතු සිදුකර ලද අතර, 2024 මැයි 20 දින වන විට අදාළ සහල් මෝල් හිමියන් විසින් සහල් කි.ග්‍රෑ.1,226,372.99 ක ප්‍රමාණයක් ලබා දීමට ඉතිරිව ඇති අතර, එම සහල්වල වටිනාකම රු.170,122,703.38කි.	දීමට ඉතිරිව ඇති අතර, එම සහල්වල වටිනාකම රු.165,571,452.66 කි. අදාල සහල් මෝල හිමියන් විසින් සහල් තොග ලබා නොදීම සම්බන්ධව මේ වන විට අම්පාර පොලීසියේ පැමිණිල්ලක් ගොනු කර ඇති අතර අපරාධ විමර්ශණ ඒකකය විමර්ශණ කටයුතු සිදුකරමින් පවතී.

3.2 අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධ රු.	මතය
2021	4,325,791,013	326,268,036	3,999,522,977	තත්ත්වාගණනය කළ
2022	4,459,191,794	139,388,112	4,319,803,682	තත්ත්වාගණනය කළ
2023	4,565,507,795	167,897,602	4,397,610,193	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	වී මිලදී ගැනීම සඳහා වර්ෂ 2001 ත් 2006 ත් අතර කාලසීමාව තුළ භාණ්ඩාගාරය විසින් ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් පියවිය යුතු ශේෂය රු.32,247,247 ක් විය.	2022	අදාළ පාර්ශව වෙතින් මුදල් අයකර ගෙන භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කළයුතුය.	ශ්‍රී ලංකා සමූපකාර සංගමයෙන් අයවිය යුතු රු.3,485,983 ක මුදල සඳහා වාර්තාවක් ලබා ගැනීමටත් ගොවිජන දිස්ත්‍රික් කාර්යාලයට අදාළව රු.2,120,000 ක් කපා හැරීමටත් ඉල්ලුම් කර ඇත. ගොවිජන සංවර්ධන සභා 02 ක් සහ විවිධ සේවා සමූපකාර සමිති 03 ක් සඳහා නඩු පැවරීමද නොච්චියාගම විවිධ සේවා සමූපකාර සමිතිය ඈවර කිරීමෙන් පසු අය කිරීමටත්, එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය වෙතින් වාර්තාවක් ලබා ගැනීමටත් කටයුතු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දිනවන විට තව දුරටත් අයවිය යුතු ශේෂය රු.31,187,247 ක් විය.
2.	කෝමාරිකා ව්‍යාපෘතියට අදාළව මුදල් අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා විසින්	2023	ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළයුතු විම.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමක් නොමැති බව	නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත.

	අමාත්‍ය මණ්ඩලයට 2021 අගෝස්තු 27 දින ඉදිරිපත් කර අනුමත කර ගත් යෝජනාවට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වගා ක්‍රමය යටතේ අපනයනය සඳහා කෝමාරිකා ශාකයෙන් ඖෂධීය නිෂ්පාදන කර්මාන්තයක් ආරම්භ කිරීම සහ සමස්ථ ආයෝජනය හා මූලික ආයෝජනය පිළිවෙලින් ඇ.ඩොලර් මිලියන 783 ක් හා 300 ක් ලබාගැනීම අරමුණු වුවද, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී වසර 02 ක පමණ කාලයක් ගත වී තිබුණද, එම අරමුණු කිසිවක් ඉටු වී නොතිබුණි.			කාරුණිකව දන්වා සිටිමි.	
3.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂිකාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබා දී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුලුනු ඉදිකිරීම සඳහා වාණිජ කාර්යයක් වෙනුවෙන් භාවිතා කිරීමට එම ඉඩම්වලින් කොටස	2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉදිරි කටයුතු කරමින් පවතී	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ක් බැහැර කර ඇති අවස්ථා වලදී 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ vi කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක් තුළ පිහිටා ඇති සම්ප්‍රේෂණ කුලුනු 139 ක් සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.				
4.	කළු ගල් කැණීම් වෙනුවෙන් රජයේ ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂක ජනරාල් විසින් නිකුත් කර ඇති 2021 පෙබරවාරි 25 දිනැති අංක 34/2216 දරන 2021 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ගාස්තු ගෙවීමේ දී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය වෙත රාජ්‍ය භාගය ගෙවන	2022	අදාළ මුදල් කඩිනමින් අයකර ගත යුතුය.	හිඟ ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් නිරන්තරව ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර අයකිරීම සඳහා ඉදිරියේදී අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට තීරණයකට එළඹීට කටයුතු කර ඇත.	2024 අප්‍රේල් 30 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක අයවිය යුතු මුළු හිඟ ගාස්තුව රු.386,411,749 ක් වන අතර, ඒ තුළ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතු අංක L2/1/89/චක්‍රලේඛ/2022 මඟින් ලද උපදෙස් පරිදි ප්‍රාදේශීය

ලද කළු ගල් කියුබ් ප්‍රමාණයන් හා සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක කළු ගල් කැණීම් වෙනුවෙන් අයවිය යුතු රජයේ ගාස්තුව රු.147,298,661 ක් විය.		ලේකම්වරුන් විසින් 2024 අප්‍රේල් 30 දිනට අයකර ගත යුතු හිඟ මුදල රු.1230,641,681 ක් විය.

3.3 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,846,555,657	245,445,556	2,601,110,101	තත්ත්වාගණනය කළ
2022	2,877,042,385	199,840,103	2,677,202,282	තත්ත්වාගණනය කළ
2023	2,969,501,007	140,338,794	2,829,162,213	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
1.	රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අනතුරට ලක් වී 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 මාස 05 ක් ගත වී තිබුණද රු.6,349,333 ක් වූ අලාභය පියවා ගැනීම සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021	මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අලාභය සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	මුදල් රෙගුලාසි පරිදි පරීක්ෂණය පවත්වා ඇත.	නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි.
2.	බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම ශක්ති ජනතා සමිති 160 ක් සතු රු.44,898,005 ක අරමුදල් නිසි පරිදි කාර්යක්ෂමව ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව බැංකු ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය.	2023	ග්‍රාම ශක්ති ජනතා සමිති සතු අරමුදල්, ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා කාර්යක්ෂමව යෙදවිය යුතුය.	අක්රිය සමිති සතු මුදල්, සක්රීය සමිති වෙත මාරු කරන ලෙස ප්රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

3.	ඌව පරණගමප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2010 අගෝස්තු 25 දින අනතුරට පත් වී තිබුණු අතර තක්සේරු ගත අලාභය වූ රු.500,000 ක මුදල 2022 මාර්තු 21 වන විටද අයකරගෙන නොතිබුණු අතර වාහනය අළුත්වැඩියා කර ධාවන තත්ත්වයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර වර්ෂ 12 කට අධික කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ රඳවා තිබුණි.	2022	අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කල යුතුය. තක්සේරු අලාභය වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	2019 මැයි 15 දින තක්සේරු වාර්තාවක් ලබා ගත් බවත් අනතුරෙන් සිදුවූ අලාභ හානියට වගකිව වුතු රියදුරු සේවය හැරගොස් ඇති බවත් එම හානිය අයකර ගැනීම සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇති බවත් දන්වා ඇත.	අපහරණය කර ඇතත් අලාභය අයකරගෙන නොතිබුණි.
4.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් විවිධ ණය වැඩසටහන් යටතේ සමෘද්ධි ලාභීන් 4976 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු.219,692,070 ක් ණය ශේෂ කල් පසුවී තිබුණු අතර ණයලාභීන් 989 ක් වෙත ලබාදෙන ලද ණය මුදලින් රු. 42,997,627 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි. මෙම හිඟ ණය අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021	ණය වාරික නියමිත කාලයේදී අයකර ගත යුතුය.	හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ණය වාරික අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණු අතර සොරණාතොට, කන්දකැටිය, හාලිඇල, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
5.	මීගහකිවුල හා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ අනවසර අල්ලා ගැනීම්	2023	සුදුසු ආකාරයට ප්‍රතිපාදන සලසා ගෙන නෙරපීමේ නියෝග	පිළිගනිමි. බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනවසර අල්ලා ගැනීම්	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	සම්බන්ධයෙන් සන්තකය ආපසු ලබාගැනීම සඳහා ලැබී තිබූ නෙරපීම් නියෝග 21 ක් ලැබී මාස 9 ත් වසර 5 ත් අතර කාලයක් ගතවී ඇතත් එම නියෝග ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රජයේ දේපල අයථා පරිහරණයකට ඉඩකඩ සැලසීමක් සිදුවී ඇති බව නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.		ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය.	සම්බන්ධ පුද්ගලයින් මුදල් ගෙවීමට ඉදිරිපත් නොවුව හොත් සන්තකය ආපසු ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කරමි.	
6.	කන්දකැටිය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා 2022 මැයි 20 හා 21 වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.4,555,000 ක් වූ ගම්මිරිස් වියලන යන්ත්‍ර 02 ක් 2024 මාර්තු 31 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි.	2023	විශාල වටිනාකමක් සහිත මෙම යන්ත්‍රවල උපරිම ධාරිතාවයම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු සැලැස්විය යුතුය.	ගම්මිරිස් අස්වැන්න අඩුවීමෙන් යන්ත්‍රය උපයෝගී කරගෙන අපේක්ෂිත පරිදි ගම්මිරිස් වියලා ගැනීමට නොහැකි විය. අපනයන ව්‍යාප්ති නිලධාරි විසින් 2024 දී සකස් කල විකල්ප භෝග වියලීමේ සැලැස්ම අනුව ව්‍යාපෘති යෝජනා සකස් කර එම කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4 මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	**මුළු වගකීම් රු.**	**ස්කන්ධය රු.**	**මතය**
2021	2,679,582,048	99,513,306	2,580,068,742	තත්ත්වාගණනය කළ
2022	2,790,036,333	88,107,922	2,701,928,411	තත්ත්වාගණනය කළ
2023	3,001,624,714	89,949,459	2,911,675,255	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1.	නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ උපදේශන සේවාව සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් සහ නැගෙනහිරය පළාත් සභාවේ ප්‍රධාන ලේකම් අතර අවබෝධතා ගිවිසුම (MOU) 2014 ඔක්තෝබර් 23 දින අත්සන් කර තිබූ අතර උපදේශන ක්‍රියාවලියේ විවිධ ප්‍රමාදයන් හේතුවෙන් 2015 ඔක්තෝබර් 08 දින සිට අවබෝධතා ගිවිසුම අවසන් කර තිබුණි. දිස්ත්‍රික් ලේකම්වරයා විසින් උපදේශකවරයාගේ වරද නොසලකා ගාස්තුවෙන් සියයට 40 ක් හෙවත් රු. මිලියන 7.2 ක් දක්වා උපදේශකවරයාට ගෙවා තිබුණි.	2021	ලංසු ලේඛනයේ ඇති කොන්දේසි අනුගමනය කර ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.	මධ්‍යම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තු විසින් සකස් කරන ලද බිල්පත් ප්‍රමාණය පිළිගෙන ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වා නිරදේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

2.	ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශයකින් තොරව හා වැලි කැණීමේ කටයුතු කිරීම සඳහා ප්‍රදේශය තුළ ගංගාවක් පිහිටා නොමැති තත්ත්වයක් යටතේ කෝරළේ පත්තු දකුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති කිරාන් බටහිර ග්‍රාම නිලධාරී කාර්යාලය මගින් ගංගා වැලි ගැනීම් බලපත්‍රයක් නිකුත් කර තිබුණි. තවද, කැණීම් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන වලට අනුව බලපත්‍රය වලංගු වන්නේ ගංගාවලින් වැලි ගැනීම් කටයුතු අදාළ බල ප්‍රදේශය තුළ සිදුකිරීම සඳහා පමණි. එසේ වුවත් මෙම බලපත්‍රය උපයෝගී කරගෙන භූමියෙන් වැලි ගැනීම් කටයුතු සිදුකර තිබුණි. එසේම අනුමත කරන ලද ව්‍යාපෘතියක් නොමැතිව වැලි කියුබ් 1,400 ක් මාස 02 ක් ඇතුළත අලෙවි කර තිබුණි.	2022	වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ කිරීමට අදාලව ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය.	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
3.	කෝරළේ පත්තු දකුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පිහිටි වැලිආරු හා මාදුරුඔය ගංගා ඉවුරු ආශ්‍රිතව හා මෙම ස්ථානවලින් බැහැරව පිහිටි මුල්ලිවන්කම නිරයිඩායි හා වාවල්	2022	මෙකී නීති විරෝධී වැලි ගැනීම් කටයුතු නැවතීම සඳහා ශක්තිමත් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව පියවර ගැනීමට නියමිතය.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	නිරයිඩායි යන ප්‍රදේශවල කැණීම්කර නීති විරෝධීව වැලි ලබාගෙන තිබුණි. මෙම නීති විරෝධී කැණීම් කටයුතු හේතුවෙන් විශාල පරිසර හානියක් සිදුව තිබුණු අතර ගංගාවේ ස්වභාවික ජල ප්‍රවාහයේ දිශාව පවා වෙනස් වී තිබුණි. එසේ වුවත් මෙම නීති විරෝධී කටයුතු මැඩපැවැත්වීම සඳහා කටයුතු කළ යුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ සම්බන්ධව ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		යුතුය.		
4.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව, වාණිජ නොවන ක්‍රියාකාරකම් කුඩා ප්‍රමාණයේ අරමුණු ලෙස විස්තර කර ඇති අතර ඒවා විකුණුම් අරමුණකින් තොරව ස්වයං අවශ්‍යතා සඳහා භාවිතා කරයි. කෙසේ වෙතත්, 2022 ජනවාරි සිට 2023 අප්‍රේල් 30 දක්වා මාස 16 ක කාලය තුළ වැලි කියුබ් 64 ක් සහ පස් සහ බොරලු කියුබ් 508 ක් කැණීම් සහ ප්‍රවාහනය කිරීම සඳහා පුද්ගලයන් 04 දෙනකු හා එක් දින බලපත්‍රයක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය	2023	වැලි ගොඩ දැමීමේ බලපත්‍ර සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපිත කර ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය.	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

විය.

5.	මාර්ගෝපදේශ අංක 04 අනුව මාසයක් සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අවසර දී ඇති උපරිම සීමාව වැලි කියුබ් 02 ක් සහ පස් සහ බොරලු කියුබ් 35 ක් ලෙස නියම කර තිබුණි. කෙසේ වෙතත්, මාසයක් සඳහා අවසර දී ඇති උපරිම සීමාවට පටහැනිව වැලි සහ බොරලු/පාංශු බලපත්‍ර සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් අවස්ථා 03 කදී සහ අවස්ථා 04 කදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිකුත් කර තිබුණි.	2023	පුනර්ජනනීය නොවන සම්පත් සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවසර දී ඇති උපරිම ප්‍රමාණයට සීමා කිරීමට ක්‍රියා කළ යුතුය.	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
6.	කෝරළෙයි පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹුරුමූලයි ග්‍රාම නිලධාරී වසමේ නිවාස යෝජනා ක්‍රමය අසල පොදු කටයුතු සඳහා වෙන්කර ඇති රජයේ ඉඩම් 50ක් ඉඩම් නියෝග අංක 83 සිට 88 දක්වා හා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව ඉඩම් කච්චේරියේ රඳවා තෝරා නොගත් පුද්ගලයින් 50 දෙනෙකුට පවරා තිබුණි. තවද, ඉහත රජයේ ඉඩම් නව පවරාදීම් සඳහා	2023	රජයේ ඉඩම් අන්සතු කිරීම සම්බන්ධයෙන් නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතු අතර ඉඩම් සංවර්ධන ආඥා පනතේ ප්‍රතිපාදන අනුව ඉඩම් අනුසතු කිරීමට කටයුතු කළ යුතුය.	පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ Blocking out Diagram (BOD), දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය සහ පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් ජෙනරාල්වලයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඉඩම් කච්චේරියට කැඳවීමේ අරමුණින් එම පුද්ගලයන්ගේ ඡන්ද නාම ලේඛනය හිතාමතාම කෝරළේ පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුම්පුරුමුලයි ග්‍රාම නිලධාරී කොට්ඨාශයට මාරු කර තිබුණි. ඔවුන්ගෙන් බහුතරයක් එම ඉඩම්වල පදිංචිව සිට නොතිබුණි. වෙන් කරන ලද කොටස් 50 කට වැඩි ප්‍රමාණයක් වැටක් ගසා වෙන්කර ඇති අතර ඔවුන්ට ජීවත් වීමට ප්‍රමාණවත් නොවන තාවකාලික පැල්පත් සකසා ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.				
7.	නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය 2009 වසරේ සිට ආරම්භ කර තිබූ අතර 2016 වර්ෂයේ දී ප්‍රාදේශීය ලේකම්වරයා	2023	ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය.	කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	විසින් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාව ලබාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2017 වර්ෂයේ දී එනම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට (LCR) ගෙවීම සඳහා ඉහත අත්පත් කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරා ගැනීමේ නිලධාරියා මුදල් ගෙවා නොතිබුණි. 2017 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම්වරයා විසින් එවැනි මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 දෙසැම්බර් 31 දින දක්වාත් ඉහත ඉඩම් අත්පත් කරගෙන නොතිබුණි.				
8.	2005 වර්ෂයේ දී තිරායිමඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මන්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ඉඩම් සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ	2023	1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 02 වැනි වගන්තියට අනුව අදාළ අරමුණ සඳහා අත්පත් කරගත් ඉඩම් භාවිතා කළ යුතුය.	කඩිනමින් පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	පනත යටතේ පවරාගෙන තිබුණි. 1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 02 වැනි වගන්තියට අනුව, මන්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිරායිමඩු ග්‍රාම නිලධාරී වසමේ සුනාමියෙන් විපතට පත් වූවන් නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් පවරාගෙන තිබුණද, සුනාමියට ගොදුරු නොවූ රජයේ නිලධාරීන් සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඉඩම් කැබලි 50 ක් ලබා දී තිබුණි. එම අන්සතු කිරීම හේතුවෙන් මෙම ඉඩම් අත්පත් කරගැනීමේ අරමුණ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් උල්ලංඝනය කර ඇත.				
9.	ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද එක් එක් ඉඩම් බලපත්‍ර ඉඩම් දීමනා සඳහා ඉඩම් නියෝග අංක 125 ට අනුව ඉඩම් ලෙජරය නියමිත ආකෘතියට අනුව (LC 12) පවත්වාගෙන යා යුතුය. ඊට අමතරව ඉඩම් නියෝග අංක 126 ට අනුව දිසාපති/ප්‍රාදේශීය ලේකම් හෝ බලයලත් නිලධාරියෙකු විසින් වරික ගෙවීම් ඇතුලත් කළ යුතුය. වාලච්චේන	2023	අංක 125 දරණ ඉඩම් නියෝගයට අනුව කටයුතු කළ යුතුය.	කඩිනමින් පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

කෝරළෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මධ්‍යම ආදායම්ලාභී පවුල් 30 ක් සඳහා එක් අයකුට අක්කර 10 බැගින් ඉඩම් ලබා දී තිබුණද බලපත්‍ර 22 ක් පමණක් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. ඉඩම් ලෙජරයේ එවැනි වාර්තා නොමැති වීමෙන් ඉතිරි 08 දෙනාට බලපත්‍ර නිකුත් කර තිබේද නැද්ද යන්න විගණනයේදී තහවුරු වී නොතිබුණි. මේ නිසා එම ඉඩම් අනවසරයෙන් අත්පත් කරගත් ඒවා නොවන බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

3.5 කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	8,982,349,621	963,922,168	8,018,427,453	තත්ත්වාගණනය කළ
2022	4,764,463,110	463,883,095	4,300,580,015	තත්ත්වාගණනය කළ
2023	5,548,499,247	394,015,515	5,154,483,732	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂ	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් 11 දෙනෙකු පදිංචිව සිටින අතර ඔවුන් ඉවත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවට දැනුම් දී තිබුණද ඊට සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	2021	ඉඩමේ නිරවුල් අයිතිය ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය.	සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ මූලිකවම අදාල අනවසර ඉඩම් තුලින් ඉවත් වන ලෙස අනවසර පදිංචිකරුවන්ට ඉවත් වීමේ දැන්වීම් යොමු කර ඇති අතර ඉන්පසුව ඉවත් නොවුවහොත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.	නිර්දේශ ක්‍රියාත්මක වී නොමැත.
2.	ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරිමට ප්‍රථම ප්‍රාදේශිය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු වුවද, 1999 මාර්තු 03 දින සහ 1999 මැයි 19 දින ආරම්භ කර ඇති පිළිවෙලින් තිඹිරිගස්යාය සහ	2021	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ප්‍රථම එම ලේකම් බල කොට්ඨාශවලට ගැනෙන වසම් හා සිමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතුය.	තිඹිරිගස්යාය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කරමින් සකස් කරන ලද කෙටුම්පත් වාර්තාව ඉදිරි කටයුතු සඳහා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කර නොතිබුණි.				
3.	2022 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වු හානියට වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණද මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණෙන් එම හානි අයකර ගැනිම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණ අතර ගිනි ගැනීමෙන් සිදු වු පාඩුවේ වටිනාකම රු.92,606,688 ක් විය.	2022	පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ කඩිනමින් පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව විනය කටයුතු හා රජයට සිදුවු පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් පූර්ණය කර ගැනීමට හා අනතුරුව හානි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව පොලිස් විමර්ශන කටයුතු සිදු කර ඇති අතර සාර්ථක පිලිතුරක් නොලද හෙයින් ගොනුව කොට්ඨාශයේ ගොනු කර ඇති බව හා මෙම අලාභය කපාහැරීමේ හැකියාව පිළිබඳව උපදෙස් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති අතර අපරාධකරුවන් හඳුනා ගැනීමට ප්‍රථමයෙන් අලාභය කපා හැරීමට කටයුතු කිරීම තුලින් මේ වන විටත් පවත්වාගෙන යනු ලබන අපරාධ විමර්ශන කටයුතු අධෛර්යමත් විය හැකි බවත් පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකර අපරාධකරුවන්ගෙන් අදාල අලාභය අය කර ගැනීමට අදාලව නීති කටයුතු කිරීම වඩාත් සුදුසු බව දැනුම් දි ඇත.	නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
4.	කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාල කුලී ආදායම දිගු කාලයක් තිස්සේ අයකර ගෙන නොතිබු අතර උසාවි නියෝගයට අනුවද	2022	නිල නිවාසවල පදිංචි වී සිටින කුලී නිවසියන් සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම	මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩුවේ සමථකරණයේදී ලබා දුන් මාණික්කාවත්ත ඉඩම වෙනුවට විකල්ප ඉඩමක් ජාතික නිවාස	නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි.

	කටයුතු කර නොතිබුණි			සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට කටයුතු කරන ලෙස සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙතද, එම නඩුවේ සමථ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට අදාල පියවර ගැනීම වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඉතා කඩිනමින් ලබා ගැනීමට සහ එය ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙතද දන්වා ඇති බව.	
5.	විමධ්‍යගත ප්‍රග්ධන අයවැය වැඩසටහන යටතේ 2021 වර්ෂයට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක ක්‍රියාත්මක නොකළ, අඩක් ක්‍රියාත්මක කළ සහ අවලංගු කළ ව්‍යාපෘති 53ක් අතරින් 39 ක් සඳහා භාණ්ඩ හා සේවා ලැබීමට පෙර එයට අදාල වවුචර් හා චෙක්පත් පිළියෙල කර රු.1,674,120ක වියදම් ගිණුම්ගත කර තිබුණි. අදාල ආයතන විසින් භාණ්ඩ සපයා නොතිබීම හේතුවෙන් එම මුදල සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.	2023	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අදාල නීති, රීති හා චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව ක්‍රියාත්මක කළ යුතු අතර, භාණ්ඩ ලැබීමට පෙර වවුචර් පිළියෙල කර චෙක්පත ලිවීම සම්බන්දයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව. භාණ්ඩ හා සේවා ලැබීමට පෙර එයට අදාල වවුවර්පත් පිළියෙල කර චෙක්පත් පිළියෙල කිරීම වරදක් බව පිළිගන්නා බව. 2021 වර්ෂයේදී පැවති කෝවිඩ් ව්‍යවසනයත් සමඟ ඇති වූ ආර්ථික අර්බුධකාරි තත්වය සමඟ ද්‍රව්‍ය මිල ගණන් ඉහල යාම, සැපයුම්වල ඌණතාවය හේතුවෙන් චෙක්පත් ලබා නොදී ඊට අදාල භාණ්ඩ හා සේවා සැපයුම් සිදු නොකිරීමේ තත්වයක් පැනනැගුණද ප්‍රතිලාභීන්ට භාණ්ඩ හා උපකරණ ලබා දීමේ අදහසින් චෙක්පත් ලියා තිබුණද ඊට අදාල සැපයුම් ඉටු කර	නිර්දේශය පරිදි කටයුතු කර නොතිබුණි.

ගැනීමට නොහැකි වුයෙන් ව්‍යාපෘතිවලට අදාලව ලියන ලද චෙක්පත් අවලංගු කර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ බව.

3.6 ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	4,842,705,000	588,448,216	4,254,256,784	තත්ත්වාගණනය කළ
2022	4,968,614,605	420,582,814	4,548,031,791	තත්ත්වාගණනය කළ
2023	5,151,649,363	362,778,719	4,788,870,644	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ට අයත් සමෘද්ධි ප්‍රජා මූල බැංකු 68 මඟින් ණයකරුවන් 669,338 ක් වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 21,598 ක් වූ ණය මුදලින් රු.මිලියන 505.188 ක මුදලක් කල්පසු වූ ණය ලෙස පැවති අතර ණයලාභීන් 3,408 ක් වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 160.755 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි. එම ණය කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. තවද ණයලාභීන් 114,088 ක් සඳහා ගෙවා තිබුණු රු.මිලියන 5,096 ක් හිඟහිටි ණය ලෙස හඳුනාගෙන තිබුණි.	2021	ලබා දී ඇති ණය සම්බන්ධයෙන් පසු විපරම් කර අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය	කල්පසුවූ ණය හා බොල් ණය අය කිරීම සඳහා නඩු හා නීති ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. කොවිඩ් 19 වසංගතය, පොහොර නොමැති වීම, සංචාරක ව්‍යාපාරය අඩපණ වීම, ණය සහන කාල සීමාවන් ලබා දීම වැනි හේතුන් නිසා එය හිඟ හිටි ණය ලෙස පවතී.	2024 ජුනි 30 දිනට සමෘද්ධි බැංකු සංගම් 69ක් මඟින් ණය ලාභින් 713,059 කට රුපියල් මිලියන 28,283ක් ලබා දී තිබූ අතර එයින් රුපියල් මිලියන් 704.9ක් කල් පසු වූ ණය ලෙසද ණය ලාභීන් 4959 ක් වෙත ලබා දී තිබූ රුපියල් මිලියන 340.38 ක් බොල් ණය ලෙසද රුපියල් මිලියන 5,091.09 ක් හිඟහිටි ණය ලෙසද හඳුනාගෙන ඇත.

2.	කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හා සමෘද්ධි බැංකු 68 ක් මඟින් රුපියල් මිලියන 483.56 ක් ප්‍රතිලාභීන්ට ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.	2021	ප්‍රතිපූර්ණය කර ගතයුතු මුදල කඩිනමින් ප්‍රතිපූර්ණය කරගැනීමට පියවර ගත යුතුය.	සමෘද්ධි බැංකු සතු අරමුදල් වලින් රු. මිලියන 483.56 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් සමෘද්ධි දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරන පදනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇත. එහෙත් මෙතෙක් මහා භාණ්ඩාගාරය වෙතින් කිසිදු දිස්ත්‍රික්කයකට මෙම මුදල් ප්‍රතිපූර්ණය කර නොමැත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් රුපියල් මිලියන 483.56ක මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.
3.	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආසන 2000 ක ශ්‍රවණාගාරය ඉදි කිරීමට 2019 වර්ෂයේදී රු.මිලියන 2,656.877 ක ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු අතර රු.මිලියන 874.785 ක් වූ ගෙවා ඇති බිල් හා අතැති බිල් පැවති අතර භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක විය. නිම කළ වැඩවලට ගෙවිය යුතු මුදල රු.මිලියන 238.953 ක් විය.	2021	ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කළ යුතුය.	මෙම විගණන විමසුම, විගණන හා කළමනාකරණ කමිටුවේ දී තීරණය කළ පරිදි ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දන්වා ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
4.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19 කට අදාළව ලියාපදිංචි කරන ලද ග්‍රාමශක්ති ජනතා සමිති 228 න් 2021 දෙසැම්බර් 31 දින වන විට ජනතා සමිති 214 ක් අක්‍රීය	2021	වැඩසටහනේ අරමුණු ක්‍රියාත්මක කිරීම වසර ගණනාවක සිට අඩාල වී ඇති බැවින් හා ඊට නිසි උපදෙස්	අමාත්‍යාංශය මගින් මේ සඳහා සමිති ක්‍රියාකරකම් පිළිබඳව ඉදිරියේ දී යම් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලබනු ඇත. ඒ අනුව, ඉදිරියේදී මෙම සමිති සක්‍රීයකර	මේ වන විට සමිති 228න් සමිති 226ක් අක්‍රිය මට්ටමේ පවතින අතර එම අක්‍රියව පවතින සමිති වල බැංකු තැන්පතු වශයෙන් රුපියල් මිලියන

	මට්ටමේ පැවති අතර එම අක්‍රීයව පවතින සමිතිවල බැංකු තැන්පතු වශයෙන් රු.මිලියන 98.383 ක ශේෂයක් නිශ්ක්‍රීයව පැවතුණි. සියළුම සමිති රාජ්‍ය බැංකුවල තැන්පත් කර ඇති රු.මිලියන 104.240 ක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් නවතා තබා තිබීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.		නොලැබීම නිසා අක්‍රීය බැංකු ශේෂ සම්බන්ධයෙන් කාලෝචිත පියවර ගත යුතුය.	ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතී.	109.35 ක ශේෂයක් නිෂ්ක්‍රියව පවතී.
5.	දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදි කිරීමේ දී, ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 2.3.1 උප ඡේදයට අනුව රු.30,175 කට වඩා වැඩි වැටුපක් ලබන මාණ්ඩලික නිලධරයන් හට වර්ග අඩි 1991 ක ප්‍රමාණයකට රජයේ නිවාස ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව වර්ග අඩි 10,015 ක නිවසක් ඉදිකර තිබුණු අතර 2020 වර්ෂයේ අප්‍රේල් සිට 2021 දෙසැම්බර් දක්වා දිසාපති නිලනිවස සඳහා නඩත්තු වියදම් පමණක් රු. මිලියන 1.504 ක් වී තිබුණි.	2021	ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.	දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරියාගේ නිල නිවස බැවින් ඒ අනුව ගැලපෙන පරිදි සැලසුම් සකස් කර ඇත. දිසාපති නිල නිවසෙහි 2020 අප්‍රේල් සිට 2021 දෙසැම්බර් දක්වා ජලය, විදුලිය, වරිපනම් හා ආරක්ෂක ගාස්තු සඳහා රු.1,504,688 ක වියදමක් දරා ඇති අතර ඉන් රු.1,361,662 ක් වියදම් වී ඇත්තේ ආරක්ෂක සේවාව වෙනුවෙන් බව කාරුණිකව දන්වමි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
6.	බටගන්විල දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිරිපස ගේබියන් රුඳවුම් බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.මිලියන 8.025 ක් වැය කර තිබුණි.	2021	සිදුවූ හානිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු නිලධාරීන්ගෙන්	ගොඩනැගිලි පර්යේෂණායතනයේ වාර්තාව අනුව දිසාපති නිල නිවස පවතින භූමියේ ජලය බැසයාම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම නිර්දේශ	නිර්දේශය පරිදි කටයුතු කර නොතිබුණි.

	ගේබියන් රුඳවුම් බැම්ම ඉදිකිරීමට මත්තෙන් නිල නිවස පිහිටි භූමියෙහි ඇතිව තිබූ නායයාමෙන් අනතුරුව 2018 මැයි 15 දින ගොඩනැගිලි පර්යේෂණායතනය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකොට තිබුණු අතර වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. එහි සඳහන් නිර්දේශවලට අනුගත වීමෙන් තොරව ගේබියන් බැම්ම ඉදිකිරීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 24, 25 දෙදින තුළ බැම්මේ කොටසක් පෙරලීගොස් බැම්මට හානි සිදුවී තිබුණි.		හානිය ප්‍රතිපූර්ණය කර ගත යුතුය.	කර ඇත. නමුත් ඒ වන විට ගේබියන් බැම්ම ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඉහත NBRO වාර්තාවේ නිර්දේශයක් වූ කාණු පද්ධතිය සකස් කිරීමේ කටයුතු දිසාපති නිල නිවස ඉදි කිරීමත් සමඟ සිදු කළයුතු වූ බැවින් ඒ අනුව කාණු පද්ධතිය ඉදි කිරීම සිදු කර ඇත. මෙම ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතින අතරතුර ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් පස් කඩා වැටී බැම්මේ කොටසකට හානි සිදුවී ඇත.	
7.	අදාළ ගේබියන් බැම්ම පෙරලී යාමෙන් පසු එය යථා තත්ත්වයට පත්කිරීම සම්බන්ධයෙන් 2020 අප්‍රේල් 10 දින රු.486,000 මුදලක් අයකරමින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබාදුන් වාර්තාවට අනුකූලව හා එහි නිර්දේශ අනුව බැම්ම නැවත පිළිසකර කිරීමේ කටයුතු ගේබියන් බැම්මට හානි සිදුවී වර්ෂ 2 යි මාස 06 කට වැඩි කාලයක් පසුවී තිබුණද, අවසන්කර නොතිබුණි.	2021	සිදුවූ හානිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු නිලධාරීන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතුය.	බැම්ම යථා තත්වයට පත්කිරීම සඳහා කොන්ත්‍රාත්කරු කිහිපවතාවක් දැනුවත් කර ඇත. නමුත් ඔහු වැඩ ආරම්භ කරන ලද්දේ 2022 වර්ෂයේ ජනවාරි මාසයේ වන අතර ගේබියන් බැම්මේ කොටසක් පමණක් නැවත සකස් කර ඇත	අමාත්‍යාංශ මට්ටමින් නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් පත් කර මු.රෙ.104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා නිර්දේශ 03 කින් යුත් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඉදිරි කටයුතු නිම කර නොතිබුණි.

8.	2004 දෙසැම්බර් 26 දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ පුද්ගලයන්හට ගෝනාපිනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිවාස ප්‍රතිලාභීන් 26 දෙනෙකුට දීමනා පත්‍ර ලබා දී නොතිබුණි.	2021	මේ දක්වා දීමනා පත්‍ර ලබා දී නොමැති පවුල් සඳහා පරීක්ෂණ පවත්වා සුදුසු පුද්ගලයන්ට දීමනා පත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය.	2022 මාර්තු 03 දිනැතිව සිදු කරන ලද ජංගම සේවය යටතේ දැනට පදිංචිකරුවන් කාර්යාලය වෙත කැඳවා 2008/04 චක්‍රලේඛය අනුව මූලික පරීක්ෂණ පවත්වා ඇත. ඔවුන් සඳහා දීමනා පත්‍ර සකස් කිරීමේ කටයුතු ආරම්භකර ඇති අතර එය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි.	එක් දීමනා පත්‍රයක් හිමිකරුවකු වෙත භාර දී ඇති අතර තවත් දීමනා පත්‍ර 4ක් පමණක් සකස් කර තිබුණි.
09.	2004 දෙසැම්බර් 26 දින සිදුවූ සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන්ට ඔප්පු ලබා දීමේදී අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ නිවාස ලාභීන් 319 කින් 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඔප්පු ලබා දී තිබුණේ 105කට පමණි.	2022	මෙම කටයුතු කඩිනමින් නිම කළ යුතුය.	ඉතිරි ඔප්පු ලබා දීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ඉටු කරමින් පවතී.	2024 සැප්තැම්බර් 30 දිනට 138 දෙනෙකු සඳහා පමණක් ඔප්පු ලබා දී නොමැත.
10.	බදු අනුමැතිය ලබා ගැනීම සඳහා බදුකරුවන් 36 දෙනෙකුට අදාල ලිපි ගොනු හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 21 දින වන විට වසර 1 සිට වසර 6 දක්වා කාලයක් ඉක්ම ගොස් තිබුණද	2023	කඩිනමින් බදු මුදල් අය කරගෙන රජයට ආදායම අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	බදුකරුවන් දෙදෙනෙකු සම්බන්ධයෙන් බදු අනුමත ලිපි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර ඉතිරි බදුකරුවන් 34 දෙනා සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත සිහි කැඳවීමේ ලිපියක් යොමු කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දිනට බදුකරුවන් 8 දෙනෙකුගෙන් පමණක් බදු අයකර තිබුණි.

	බදු අනුමැතිය ලැබී නොතිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝම්බර් 22 දිනැති අංක 2021/06 දරණ චක්‍රලේඛය ප්‍රකාරව දළ තක්සේරුවක් පදනම් කර ගනිමින් නියමිත ප්‍රතිශතයන්ට අනුව වාර්ෂික බදු මුදල් ගණනය කර නොතිබුණි.				
11.	රත්ගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.250,000 කට මාසික තක්සේරු කුලිය ලබා දී තිබියදී ඒ පිළිබඳව නොසලකා හැර ප්‍රාදේශිය ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් විසින් ලබා දුන් කුලී වටිනාකම පදනම් කර ගනිමින් මාසික කුලිය රු.325,000 බැගින් වසර 4 ක් දක්වා කුලියට ගැනිමට ගිවිසුම් ගත වී තිබුණි. මේ ලෙසටම බදු ගැනීම පිළිබඳව කොන්ත්‍රාත්කරු වෙත දැනුම් දිමටත් ප්‍රථම පැරණි ගොඩනැගිල්ලෙන් ගලවා ඉවත් කරන ලද බෙදා වෙන් කිරීම් (Partition) කොටස්	2023	රජයේ තක්සේරුව හෙලිදරව් නොකර මෙම කටයුත්ත සිදු කළ බව විගණනයේදී නිරීක්ෂණය වූ බැවින් මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.	රජයේ තක්සේරු වටිනාකමට ගොඩනැගිල්ල ලබා දිමට නොහැකි බැවින් ස්වාධින කමිටුවක් පත් කර බදු කුලිය නැවත තක්සේරු කොට අදාල ගොඩනැගිල්ල බදු ගත් බව දන්වා තිබුණි. මේ ලෙසටම බදුකරු සමඟ පැවති අන්‍යොන්‍ය එකඟතාවය මත පැරණි ගොඩනැගිල්ලෙහි ඉවත් කරන ලද බෙදා වෙන් කිරීම් නව ගොඩනැගිල්ලෙහි ගබඩා කරන ලද බව.	පරීක්ෂණයක් පවත්වා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

සහ පළාත් සභාව
වෙතින් ලබාගත්
ලිපිගොනු සහ
කැබිනට් නව
ගොඩනැගිල්ල වෙත
ගෙනගොස් තිබුණි.

3.7 ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධයෙ රු.	මතය
2021	5,809,732,879	250,042,338	5,559,690,541	තත්ත්වාගණනය නොකළ
2022	6,525,777,851	1,945,310,899	4,580,466,952	තත්ත්වාගණනය නොකළ
2023	7,196,572,495	1,031,319,122	6,165,253,373	තත්ත්වාගණනය නොකළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	මියගිය බව දැනුම් දීමට ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතුන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුල ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මගින් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයින් 419 දෙනෙකු සඳහා එකතුව රු.40,518,538ක් වැඩිපුර ගෙවා තිබුණි.	2021 2022 2023	වැඩිපුර ගෙවීම් කඩිනමින් ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතුය.	2024 නොවැම්බර් 30 දිනට පෙර අයකර ගැනීමට හෝ අදාල පාර්ශව දැනුවත්කර, අයකර ගැනීමට බලාපොරොත්තු වේ.	2024 ජූලි 31 දිනට තවදුරටත් රු.2,407,045 ක ශේෂයක් අයකර ගැනීමට පැවතුණි.
2.	මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වු සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව නිලධාරින් 04 දෙනෙකුගෙන් සමානව රු.270,561 ක් බැගින්	2021 2022 2023	අලාභය අයකිරීමට කටයුතු කළයුතු අතර අයකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි	2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වු මුදල් වංචාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු අලාභයෙන් රු.42,275ක මුදලක් අයවී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා අදාල නිලධාරින්ට	2024 සැප්තැම්බර් 30 දිනට අලාභයෙන් රු.84,550ක මුදලක් පමණක් අයවී ඇති අතර ඉතිරි මුදල් අයවී නොතිබුණි.

	අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබූ අතර 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අදාල අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ද 2023 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අලාභය අයකරගැනීමේ නියෝගය පරිදි 2023 දෙසැම්බර් 31 දිනට පෙර රජයට සිදුවී ඇති අලාභය වන රු.1,082,245ක වංචාවට වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමසේ 2023 දෙසැම්බර් 31 දිනට පෙර අයකර ගතයුතු බවට නියෝගකර තිබුණද එදිනට රු.42,275ක් පමණක් අයවී තිබුණි.		ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය.	හා ඔවුන් සේවය කරන ආයතන වලට නිරන්තර දැනුවත් කිරීම් සිදු කර ඇත.	
3.	මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2011 පෙබරවාරි 10 සිට 2013 ජූලි දක්වා කාලපරිච්ඡේදයේ ලැබුණු නොගෙවන ලද මහජනාධාර මුදල් රු.1,441,400ක් නිලධාරිනියක විසින් සාවද්‍ය පරිහරණයට අදාලව 104(4) වාර්තාව ප්‍රකාරව එම මුදල හා සියයට 2 ක	2021 2022 2023	බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක WP/ADM/09-34/F1/101 හා 2021 ජූලි 26 දිනැති ලිපිය අනුව රු.1,470,268ක මුදල සමාන වාරික් 03 කින් අයකිරීමට කටයුතු කළ	බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/ADM/09-34/F1/101 හා 2021 ජූලි 26 දිනැති ලිපිය අනුව රු.1,470,268ක මුදල සමාන වාරික 03 කින් අය කළ යුතු බව එවකට සිටි දිස්ත්‍රික් ලේකම්ගේ අංක ගම්/දිලේ/5/මිනු/මුව හා 2021 අගෝස්තු 06 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය ලේකම් ජාඇල	2024 සැප්තැම්බර් 30 දින වන විටත් අදාල අයකිරීම් කටයුතු සිදු කර නොතිබුණි.

	අධිභාර මුදලක් අයකරන ලෙස ප්‍රධාන ලේකම්ගේ 2021 ජුලි 26 දිනැති ලිපියෙන් උපදෙස් දී තිබුණ ද 2023 නොවැම්බර් 08 දින වන විටත් අය කර තිබුණේ රු.84,840ක මුදලක් පමණි.		යුතුය.	වෙත දන්වා ඇත. මෙම නිලධාරිනිය මේ වන විට විශ්‍රාම ගොස් ඇත. අයකර ගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.	
4.	මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.8,202,635ක් වියදම් කර ඉදිකර තිබූ සේවා පියස් 10ක් අඩක් නිමකර භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.	2022 2023	ඉදිකිරීම් නිමකර ඵලදායී කාර්යක් සඳහා යොදාගත යුතුය.	සියලුම සේවා පියස් හා නිල සෙවන කාර්යාලවල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, අදාල ඇස්තමේන්තු 2024 වර්ෂයේ අයවැය යෝජනා වෙත ඇතුළත් කර ඇති බව එම අමාත්‍යාංශය දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතුබුණි.
5.	මිනුවන්ගොඩ නාලන්දා පිරිමි පාසලෙහි නල ළිදක් ඉදිකර ජල පොම්පාගාරයක් සවිකර පානීය ජලය ලබා දීම සඳහා රු.800,714ක වියදමක් දැරීමෙන් පසු ව්‍යාපෘතිය මුළුමනින්ම අතහැර දමා තිබීම හේතුවෙන් එම මුදල් නිෂ්ඵල වියදමක් වී තිබුණි.	2022	ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව.	ජල සාම්පල් පරීක්ෂාවෙන් පසුව කඩිනමින් නලළිඳ භාවිතයට ගැනීමට බලාපොරොත්තු වේ.	ජල සාම්පල් පරීක්ෂාවෙන් පසුව අසාර්ථක ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත.
6.	මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ	2023	ඉදිකිරීම් අවසන් කර ඵලදායී කාර්යකට	ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කිරිම සඳහා අනුමත	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ඌරුවල බටහිර කෘෂි උපකරණ ගබඩා සංකීර්ණයේ රු.481,086 ක් වියදම් කර 2020 වර්ෂයේ ඉදිකල ගොඩනැගිල්ලේ ඉහල මහල බිත්ති බැද කපරාදු කිරීම,පඩිපෙළ සඳහා අත්වැටක් සැපයීම,වැනි කාර්ය ඉටුනොකිරීම නිසා අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකි වී තිබුණි.		යොදාගත යුතු බව	ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොමැත. ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන මුදල යටතේ ඇස්මේන්තුගත වැඩ කොටස් නිම කර ඇත. අදාල වැඩසටහන එම වර්ෂයෙන්ම නිම වූ අතර වැඩ අවසන් නොකළ කොටස් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් ද සිදු නොවුණි.	
7.	මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිරිකිත්ත නැගෙනහිර සේවා පියසක් සඳහා කාමර 03 ක් ඉදිකිරීම සඳහා 2022 වර්ෂයේ රු.290,478ක් වියදමක් දරා ඇතත් ගොඩනැගිල්ලේ ජනෙල් දොරවල් දමා භාවිතයට ගතහැකි තත්වයට පත්කර නොතිබුණි.	2023	ඉදිකිරීම් අවසන් කර ඵලදායී කාර්යකට යොදාගත යුතු බව	අදාල ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන මුදල යටතේ ඇස්තමේන්තුගත වැඩ කොටස් නිම කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
8.	ගම සමග පිළිසඳරක් 2022 යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 367, නාගොඩ ග්‍රාම නිලධාරී වසමේ ක්‍රීඩා පිට්ටනිය අසල ඉඩමේ බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර තිබූ රු.1,200,000න් 336,821ක් වියදම් කර කොන්ක්‍රීට් කණු 10 ක් පමණක් ඉදිකර අතරමග නවතා දමා	2023	ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කලයුතු බව.	ව්‍යාපෘතියේ වටිනාකම රු.1,200,000ක් විය. නිම කළ වැඩ කොටස් වන කොන්ක්‍රීට් කණු 10 ඉදි කිරීම සඳහා රු.336,821ක මුදලක් ගෙවා ඇත. දෙවන කාර්තුවේ මුදල් වෙන් නොකිරීම නිසා ඉතිරි වැඩ අවසන් කිරීමට නොහැකිව ඇති බව දන්වමි.	ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉතිරි වැඩ අවසන් කර නොතිබුණි.

	තිබුණි.				
9.	වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ , දැල උතුර මාතෘ සායන ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම 2020 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ලද රු.500 000ක ප්‍රතිපාදන හා 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ලද රු.400 000ක ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.491,091ක් හා රු.388,242ක් උපයෝජනය කර මෙම ගොඩනැගිල්ලේ අත්තිවාරම දමා ගඩොලින් වහල මට්ටම දක්වා පමණක් ඉදිකර ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දැමීමෙන් වැයකරන ලද මුදල ද නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	2023	කඩිනමින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ව්‍යාපෘති නිමකර භාවිතයට ගතහැකි තත්වයට පත්කළ යුතු බව.	ගොඩනැගිල්ල අත්තිවාරම් දමා ගඩොලින් වහල මට්ටම දක්වා ඉදිකර ඇත. ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් දැනට වැඩ නතර වී ඇත. ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
10.	2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්වර්ණාභරණ හා පිත්තල නිමැවුම්කරුවන් සඳහා භාවිතා කිරීමට හා පුහුණු වැඩසටහන් පැවැත්වීමට	2023	වත්කම් භාවිතයට ගතහැකි තත්වයට පත්කර ඵලදායීව යොදාගතයුතු බව.	ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ලිඛිතව ඉදිරිපත් කළ අතර, එයට පිළිතුරු ලෙස මාස කිහිපයක් තුලදී ජල විදුලිය සහිත අංගසම්පූර්ණ ගොඩනැගිල්ල සකස් කරදෙන බවට අත්තනගල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව	2024 සැප්තැම්බර් 30 දින වන විටත් අවම යටිතල පහසුකම් වන ජලය, විදුලිය සපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	රු.2,925,000ක වියදමක් දරා අත්තනගල්ල ප්‍රාදේශීය සභාව සතු බෝනැගල වසමේ ක්‍රීඩා පිටිය සහිත භූමියේ මහල් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 02 කට වඩා ගත වී තිබුණ ද භාවිතයට ගෙන නොතිබුණි. එසේම අවම යටිතල පහසුකම් වන ජලය, විදුලිය සපයා ගැනීමට නොහැකිවී තිබුණි.			විසින් එකඟතාව පළකර ඇති බව දන්වමි.	
11.	අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ව්‍යාපෘති අංක ATT/RIDP/16/146/3/ 2017 යටතේ අඩක් නිම කර තිබූ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැඩ නිමකිරීම වෙනුවෙන් “2020 සපිරි ගමක් වැඩ සටහන” යටතේ රු1,980,171ක් වැය කර තිබුණි. අදාළ බහුකාර්යය ගොඩනැගිල්ලේ සැලසුම අනුව 2023 ජූලි මස වන විට ශරීර සුවතා මධ්‍යස්ථානය සහ ඊට යාබද කාමර 03 හි බිත්ති බැද වහලය නිමකර ඇතත් භාවිතයට ගතහැකි මට්ටමකට අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ බැවින් වැයකළ මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.	2023	ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කලයුතු බව	ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන- 2017 හා සපිරිගම වැඩසටහන - 2020 යටතේ ඉදිකර ඇත. මෙම වසරේ ද පළාත් සභා වැඩ සටහන, විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ මුදල් වෙන් කර ඇත. ඒ අනුව පවතින අඩුපාඩු සකස් කර ගැනීමට නියමිතය. ඉදිරියේදි අදාල ඉදි කිරීම් අවසන් කර ඵලදායි ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වේ.	2024 සැප්තැම්බර් 30 දින වන විට ශරීර සුවතා මධ්‍යස්ථානය භාවිතයට ගතහැකි මට්ටමකට අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.

3.8 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	5,978,609,705	243,734,676	5,734,875,029	තත්ත්වාගණනය කළ
2022	20,959,895,066	130,259,276	20,829,635,790	තත්ත්වාගණනය කළ
2023	6,274,665,277	73,929,848	6,200,735,429	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	අනුමත ඇස්තමේන්තුව අනුව, මාර්ගයේ පාදම මිලිමීටර 100 ක ඝනකමකින් යුක්තව ABC ඇතිරිය යුතු වුවද මිලිමීටර 90 ක ඝනත්වයට සිදුකර තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක කොන්ත්‍රාත්කරුවන්ට නියමිත ප්‍රමිතියට සිදු නොකළ මාර්ග සඳහා සැලසුම් සකස්කර රු.4,112,657 ක් ගෙවා තිබුණි.	2021	ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළයුතුය.	ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තා කර නැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
02.	අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැණීම් බලපත්‍රකරුවකුගේ වාර්තා අනුව කැණීම් කරන ලද මුළු කළුගල් කියුබ් ප්‍රමාණය කියුබ් 173,586.2 ක් වූ අතර, කැලෑ ආඥා පනත ප්‍රකාරව බලපත්‍රකරුගෙන්	2021	කැලෑ ආඥා පනත යටතේ නිකුත් කරන ලද අංක 1600/18 දරන 2009 මැයි 06 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 10(1) ඡේදය ප්‍රකාරව කටයුතු	නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	අයකර ගත යුතු එකතුව රු.173,586,200 ක් වූ රජයේ ගාස්තු අයකරගෙන නොතිබුණි. කෙසේ වුවද, බලපත්‍රලාභියා විසින් කැණීම් කරන ලද මුළු කළුගල් කියුබ් ප්‍රමාණය කොපමණද යන්න හදුනාගැනීමට විශේෂඥ වාර්තාවක් ලබාගත යුතු බවත්, ඊට අනුකූලව තවදුරටත් අයකළ යුතු රජයේ ගාස්තු ප්‍රමාණය හදුනාගත යුතු බව නිරීක්ෂණය විය.		කළයුතුය.		
03.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් නිකුත් කර තිබුණු කැණීම් බලපත්‍රයේ කොන්දේසිවලට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුපුරණ ද්‍රව්‍ය අවසර බලපත්‍රයන් යටතේ 2011 වර්ෂයේ සිට මේ දක්වා විදුලි ඩෙටොනේටර් 27,100 ක් අවිධිමත්ව නිකුත් කර තිබුණි.	2021	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් නිකුත් කර තිබුණු කැණීම් බලපත්‍රයේ කොන්දේසිවල ට අනුකූලව කටයුතු කළයුතුය.	ගෙන ඇති ක්‍රියාමාර්ගය පිළිබඳව වාර්තා කර නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
04.	2019 පෙබරවාරි 11 දිනැති අංක 19/0549/101/030 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ණය සහන ලබාදීමේ වැඩසටහන යටතේ	2022	අප්‍රමාදව නියමිත කාලය තුලදී ණය ආපසු අයකර ගත යුතුය.	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර සහල් මෝල්හිමියන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් ණය අයවී නොතිබුණි.

	මාස 06ක සහන කාලයකින් ආපසු ගෙවීමට පාර්ශවයන් 10ක් වෙත ලබාදී තිබුණු රු.38,000,000ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.22,638,517 ක් හිඟව පැවතුණි.				
05.	ලුණුගම්වෙහෙර නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත් ආයතනයක් විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා අඩු රු.113,816,772ක මිලක් ඉදිරිපත්කර තිබුණු අතර, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම ආයතනය ඉදිරිපත් කර තිබුණු ලංසු සුරක්ෂණය ප්‍රමිතගත නොවන බව දක්වා එම ලංසුව ප්‍රතික්ෂේප කර තිබුණි. එසේ වුවද, එය 2006 රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.8(ඇ) වගන්තිය අනුව ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට තරම් හේතුවක් නොවන බැවින් සහ 7.9.2 (ග) වගන්තිය අනුව, ලංසුවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් ලංසුකරුගෙන් කරුණු පහදා ගැනීම සඳහා	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවන බව සහතික වන ආකාරයට කටයුතු කළයුතු අතර, සිදුවී ඇති පාඩුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතුය.	ක්‍රියාමාර්ග වාර්තා කර නොමැත.	පාඩුව අයකරගෙන නැත.

	ඉල්ලීමක් කළහැකි වුවත්, එසේ කටයුතු නොකර, එකී ලංසුව ප්‍රතික්ෂේප කර, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11.05ක වැඩිමිලක් සහිතව රු.127,587,772 ක මිලක් ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත් සමාගමකට පිරිනැමීම තුලින් රජයට රු.13,771,092ක පාඩුවක් සිදුවී ඇති බව නිරීක්ෂණය විය.				
06.	අඟුණුකොළපැලැස්ස නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම - II අදියර යටතේ රු.202,233,895ක ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11.06ක මිල වැඩිවීමක් සහිතව මධ්‍ය ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම ඉදිරිපත් කළ රු.224,616,800ක මිල ගණන් යටතේ සෘජුවම එම සමාගමට පැවරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවී තිබුණි. එසේ වුවද, වෙන් කරනු ලබන සංශෝධිත ප්‍රතිපාදන මත නැවත සකස් කළ රු.58,658,156ක ඉංජිනේරු ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට	2023	අමාත්‍ය මණ්ඩලය නිර්දේශ කළ මිල වැඩිවීම් සීමාව ඉක්මවා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා නොගෙන පැවරීමට වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියාමාර්ග වාර්තා කර නැත.	ක්‍රියාමාර්ග ගෙන නැත.

	30.5ක මිල වැඩිවීමක් සහිතව රු.76,604,246 කට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත දිස්ත්‍රික් ලේකම් විසින් කොන්ත්‍රාත්තුව පවරා තිබුණු නමුත්, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටු සහ අමාත්‍ය මණ්ඩල නිර්දේශ ලබාගෙන නොතිබුණි.				
07.	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 (අ) ඡේදය අනුව, වටිනාකමින් අඩු, වහාම ලබාගත හැකි භාණ්ඩ, සම්මත පිරිවිතර ඇති වටිනාකම අඩු භාණ්ඩ මිලදී ගැනීම සඳහා වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යොදා ගත හැකි වුවද, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වර්ෂයේදී එකතුව රු.5,265,824 ක්වූ ජල පොම්ප 118ක් මිලදී ගැනීමේදී හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තරුණ කෘෂි ව්‍යවසායකත්ව නියමු ව්‍යාපෘතිය සඳහා එකතු වටිනාකම රු.63,787,698ක් වූ භාණ්ඩ මිලට ගැනීමේදී ජාතික තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය යොදා	2023	ව්‍යාපෘති සඳහා මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුව වඩාත් සුදුසු ප්‍රසම්පාදන ක්‍රමය තෝරා ගත යුතු අතර, මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් කඩකිරීම සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කරමින් ඉදිරි කටයුතු සිදුකරන ලෙස දැනුවත් කිරීම.	විධිමත් පරීක්ෂනයක් පවත්වා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ කඩකළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ගෙන මිල කැඳවා තිබුණි.				
08.	2020 මාර්තු 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා වූ අතිරේක අංක 35 අනුව, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සඳහා වන අධිකාරි සීමාවන් පිළිවෙලින් රු.මි. 10ක් හා රු. මිලියනයක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ලුණුගම්වෙහෙර, කටුවන හා බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකී සීමාවන් අභිබවා අවස්ථා 22 කදී රු.72,079,992ක් වටිනා උපකරණ මිලට ගෙන තිබුණි.	2023	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව නිලධාරීන් කටයුතු කළ යුතුය.	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මින් ඉදිරියට මෙම සීමාවන් පිළිබඳව වඩාත් සැලකිලිමත්ව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් විෂය නිලධාරීන්ට ලබා දී ඇති බව.	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පමණක් අවශ්‍ය උපදෙස් විෂය නිලධාරීන්ට ලබා දී ඇති බව දන්වා ඇත. අනෙකුත් ආයතන ක්‍රියාමාර්ග ගෙන නොමැත.
09.	මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ 2023/2024 වර්ෂය සඳහා පවිත්‍රතා සේවා සැපයීමේ කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ දකුණු පළාත් නියෝජ්‍ය කම්කරු කොමසාරිස් නිර්දේශ කර තිබුණු, අවම මිල ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුගේ ලංසුව ප්‍රතික්ෂේප කර 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.2	2023	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව නිලධාරීන් කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කිරීමෙන් සිදුවූ පාඩුව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	ඡේදයට අදාළ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 7.9.2 (ඔ) ඡේදය යටතේ දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු නොකර, අවම තුන්වන මිල ඉදිරිපත් කළ ආයතනය තෝරා ගැනීම හේතුවෙන් රු.1,871,829ක පාඩුවක් සිදුවී තිබුණි.				
10.	හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021 යටතේ කැලියපුර මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන්ගේ සමිතිය සඳහා රු.769,000ක් වැයකර මිලදීගත් යන්ත්‍රයේ පිරිවිතර, ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාව සමඟ නොගැලපීම හේතුවෙන් හා නැවත නැවතත් දෝෂයන්ට ලක්වීම නිසා 2023 ජූලි මාසයේ සිට එම යන්ත්‍රය භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොමැති බවත්, යන්ත්‍රය සඳහා දරන ලද රු.769,000ක මුදල නිෂ්කාර්ය වියදමක් වී ඇති බවත් නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගතයුතුය.	ගිවිසුම් කාලය ඉකුත්ව ඇති බැවින් අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තුවක් සැපයුම්කරු විසින් ඉදිරිපත්කර ඇති බවත්, ඒ සම්බන්ධව කර්මාන්තයේ නියුතු සමිති සමඟ සාකච්ඡා කර ඉදිරි පියවර ගනු ලබන බව.	යන්ත්‍රය අක්‍රීය තත්ත්වයේ පවතී. ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොමැත.
11.	2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ සහ වී	2023	වී මිලදී ගැනීම් සම්බන්ධයෙන් භාණ්ඩාගාර	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම කපා හැරීම

	තොග බැහැර කිරීමේ වැඩසටහනට අදාළ භාණ්ඩාගාර ලේකම්ගේ අංක DFD/2023-I දරන 2023 පෙබරවාරි 09 දිනැති චක්‍රලේඛයේ 2.3.5 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් වී තොගවල සත්‍ය තෙතමන ප්‍රතිශතය වෙනුවට සියලු වී තොගවල තෙතමන ප්‍රතිශතය සියයට 22 ලෙස තීරණය කර තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු සෑම තෙත වී කිලෝග්‍රෑම් 100 කින් කිලෝග්‍රෑම් 12.5 බැගින් වී කිලෝග්‍රෑම් 10,340,983 කින් වී කිලෝග්‍රෑම් 1,292,623 ක් තෙතමනය සඳහා කපා හැරීමට කටයුතු කර තිබුණු අතර එසේ කපා හැර තිබුණු වී වල ගැනුම් වටිනාකම රු.113,750,824 ක් වී තිබුණි.		ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.		සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර නොමැත.
12.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10ක් විසින් විශ්‍රාමිකයින් 29 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද එකතුව රු.6,025,880ක මුදලින් රු.3,407,938ක විශ්‍රාම වැටුප් 2023 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවතුණි.	2023	වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩිපුර විශ්‍රාම වැටුප් ගෙවීම අයකර ගැනීමට පියවර ගන්නා ලෙස දැනුම් දී ඇති බව.	2024 ජූලි 31 දිනට විශ්‍රාමිකයන් 06 දෙනෙකුගෙන් වැඩිපුර ගෙවීම් අයකරගෙන ඇත. ඉතිරි 23 දෙනාගෙන් තවදුරටත් රු.2,757,730ක මුදලක් අයවීමට ඇත.

13.	හම්බන්තොට පරිපාලන සංකීර්ණයට යාබදව ඉදිකර ඇති රජයේ නිවාස 12 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන ජල සැපයුමෙන් සපයන ලද ජලය වෙනුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 09 ක් අතර කාලපරාසයට අදාළව 2023 ජුනි 13 දිනට එකතුව රු.1,905,190ක ජල ගාස්තු අයකරගෙන නොතිබුණි.	2023	නියමිත පරිදි ජල ගාස්තු අයකරගත යුතුය.	වාර්තා කර නොමැත.	ජල ගාස්තුව 2024 සැප්තැම්බර් මාසය වන විටත් අයවී නොතිබුණි.
14.	හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු හම්බන්තොට වාණිජ කලාපයට ඉඩම් පවරා ගැනීම වෙනුවෙන් පදිංචිකරුවන් 112 දෙනෙකුට නිවාසද, 07 දෙනෙකුට නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම්ද ලබාදී වසර 17කට ආසන්න කාලයක් ගතවී ඇතත්, එම දේපලවලට හිමිකම් කීම සඳහා විධිමත් ලියවිල්ලක් ලබාදී නොතිබුණි.	2023	දේපල සඳහා හිමිකම්පතක් ලබාදිය යුතුය.	වාර්තා කර නොමැත.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් ඉඩම් හිමියන්ට හිමිකම් පත්‍ර ලබා දී නොතිබුණි.
15.	තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2019, 2020, 2022 හා 2023 වර්ෂවල ඉඩම් කච්චේරිවලින් හඳුනාගත් අයදුම්කරුවන් 35 දෙනෙකු වෙත සකස්කර තිබුණු බලපත්‍ර හා ගැනුම් මිල	2023	නිකුත් කර ඇති බලපත්‍ර අදාළ බලපත්‍රලාභීන්ට ලබාදීමට කටයුතු කළ යුතුය.	ඉඩම් බලපත්‍ර හා ගැනුම් මිල බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කර රැගෙන යන ලෙස ග්‍රාම නිලධාරීන් මඟින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීමට කටයුතු කරන බව.	ගැනුම් මිල මත සකස් කර තිබූ බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

මත ලබාදීමට සකස්කර තිබුණු බලපත්‍ර 08ක් 2023 නොවැම්බර් 06 දින වන විටත්, බලපත්‍රලාභීන් වෙත බෙදාදීමට කටයුතු නොකිරීමෙන් රජයට අයවිය යුතු ආදායම්ද අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.

3.9 කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,484,342,608	467,133,878	3,017,208,730	තත්ත්වාගණනය කළ
2022	3,228,190,024	345,324,668	2,882,865,356	තත්ත්වාගණනය කළ
2023	3,324,642,778	205,871,887	3,118,770,891	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැසේජ ටයිල් කිරීමට අදාල කොන්ත්‍රාත්කරුට ගෙවීමට රු.4,810,840 ක අතැති බිල්පත් ගෙවීමට පවතින බව භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණ ද 2022 මාර්තු 28 දක්වාත් ටයිල් ඇල්ලීම සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2021	අවිධිමත් ගණුදෙනු අනුමත කළ, නිර්දේශ කළ හා සහතික කළ නිලධාරින් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වා විනයානුකූල පියවර ගැනීමත් රාජ්‍ය මුදල් අවභාවිතයක් වී ඇතිනම් ඒවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිලධාරීන්ගේ කාර්ය බහුලතාවය මත අතපසු වීමකින් අතැති බිල් පත් වාර්තාවට මෙම අයිතමය ඇතුළත් වී ඇති බව දන්වා ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
2.	මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ workstation සකස් කිරීමේ කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කිරීම කර නොතිබිය දී හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	2021	අවිධිමත් ගණුදෙනු අනුමත කළ, නිර්දේශ කළ හා සහතික කළ නිලධාරින් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ	මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල විවෘත කිරීමට අදාළව ප්‍රමුඛ ස්ථානය දුන් කටයුත්තක් බව දන්වා ඇත .අනෙකුත් ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කිරීම අවලංගු කර ඇති බව	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	හා මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය සඳහා ජෙනරේටරයක් සපයා සවිකිරීමේ ව්‍යාපෘතිය දිස්ත්‍රික් ලේකම් විසින් අවලංගු කර තිබිය දී එම ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ලෙස පිළිවෙලින් රු.5,000,000 ක්, රු.4,878,865 ක් හා රු.3,602,880 ක අතැති බිල්පත් ගෙවීමට පවතින බව භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි.		පවත්වා විනයානුකූල පියවර ගැනීමත් රාජ්‍ය මුදල් අවභාවිතයක් වී ඇතිනම් ඒවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වාර්තා කර ඇත.	
3.	මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වී ඇති රු.7,022,668 ක විශ්‍රාම වැටුප් වංචාවක් අනාවරණය කරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2021 මැයි 01 දින මූලික විමර්ශනයක් පවත්වා තිබුණ ද මෙම විශ්‍රාම වැටුප් වංචාව පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.	2021	අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු බව හා මුදල් අවභාවිතා කළ නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව	විශ්‍රාම වැටුප් වංචාව පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළි දරව් කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන බව වාර්තා කර ඇත.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අදාල නිලධාරින් සම්බන්ධව විනය පරීක්ෂණයක් මේ වන විට පවත්වාගෙන යනු ලබයි.
4.	මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ දෙවන මහල පුලුල් කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ පහත කරුණු නිරීක්ෂණය විය . 2021 දෙසැම්බර් 31	2021	අපැහැදිලි රේට හා සාවද්‍ය තොරතුරු ඇතුළත් ලේඛන මත ගෙවීම් කිරීමට අදාළ අනුමැතිය, නිර්දේශය හා සහතික කළ	ගොඩනැගිල්ලේ ඉදිරි පැවැත්ම සලකා බලා නව ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කළ බවත් අමුද්‍රව්‍ය හිඟ වීමමිල , උච්චාවචනයහේතුවෙන් යම් ප්‍රමාදයක් සිදු වූ බවත්, 2022 ජුනි 02 දින වන විට ඉදිකිරීම්	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	දිනට කර්මාන්තයේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතියදීත් සියයට 100 ක කර්මාන්තයේ වැඩ නිම කළ බවට දක්වමින් රු.6,716,962 ක වවුචර් පිළියෙල කර 2021 දෙසැම්බර් 31 දින රු.2,000,025 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර, ඉතිරි රු.4,716,937 ගෙවීම සඳහා තවත් වවුචරයක් පිළියෙල කර එය ගෙවිය යුතු බිල් ලෙස භාණ්ඩාගාරයට වාර්තා කර තිබීම.		සියළු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව පරීක්ෂණ පවත්වා අදාළ පරිදි විනයානුකූල පියවර ගත යුතු බව හා වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගත යුතු බව.	සාර්ථකව නිමකර ඇති බවත් වාර්තා කර තිබුණි.	
5.	මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ඉතිරි වැඩ කර්මාන්තය රු.53,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ඉටුකර තිබුණු අතර එහිදී සියලුම අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ වෙනුවෙන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ලිඛිත ඉල්ලීම්, වගකිව යුතු නිලධාරින්ගේ නිර්දේශ නොතිබුණි. කර්මාන්තය නිම කිරීමට අදාළව වැඩ අවසන් කළ බවට වාර්තාවක්, වෙනස්	2022	මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම වැඩ විෂයයන් තුල “Provisional Sum” ලෙසින් සඳහන් කර වැඩ අයිතම කිහිපයක් ඇති බව හා ඒවා කාර්යය නිම කිරීමෙන් මිනුම් ලබා ගෙන ගෙවීම් පසුව කිරීමට ඇති අයිතමයන් වන බව .දිනක ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.05 ක් විය යුතු අතර, ප්‍රමාද දෝෂයකින් එම ප්‍රතිශතය සියයට 0.025 ක් ලෙසින් සටහන්ව ඇති බව. මේ කාලයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ටෙන්ඩරය විවෘත කළ දින සිට ආරම්භ කිරීමට ලබාදුන් දිනය දක්වා ම පැවතියේ අයහපත් කාලයක් නිසා	දිස්ත්‍රික් ඉංජිනේරු හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් පරීක්ෂණයක් සිදුකර As Build Drawings ලබාගැනීමට යටත්ව අනෙකුත් සුළු අඩුපාඩු නොසලකා හැරීමට තීරණය කර ඇත. එහෙත් විගණන නිරීක්ෂණ බොහොමයක් මෙම පරීක්ෂණයේදී ද පිළිගෙන තිබුණ ද ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

කිරීමට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම්, වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම්, විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක්, වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරුගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි. එසේම ඉදිකිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාලව වැඩ විෂයන් 54 ක් අත්හැර තිබූ අතර එම අත්හළ වැඩ වල මුළු වටිනාකම රු.5,673,089 ක් විය. එසේම දිනක ප්‍රමාද ගාස්තුව රු.7,650 ක් අඩුවෙන් දක්වා ගිවිසුම් ප්‍රකාරව අයකලයුතු , රු.3,650,016 ක ප්‍රමාද දඩ මුදල් අයකර නොතිබුණු අතර ප්‍රසම්පාදන කමිටුව මගින් 2021 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කිරීම් කර තිබුණද කාලය දීර්ඝ කිරීම් සිදුකරන විට වැඩ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබීම මත මෙන්ම දිස්ත්‍රික් ඉංජිනේරු අංශය විසින් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම නිසාද එකී	යම් යම් ප්‍රමාදවීම් සිදු වූ බව

	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් විගණනයේදී පිළිගත නොහැකි විය.				
6.	අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ එක් ව්‍යපෘතියක්වූ හඳුන්කුරු නිෂ්පාදන ව්‍යපෘතිය සඳහා රු.1,367,250 ක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රගතිය ලෙස දිනකට එක් ප්‍රතිලාභියෙකු විසින් බෙහෙත් කිලෝ 8 ක හඳුන්කුරු නිෂ්පාදනය ඉලක්ක කර තිබුණි. ඒ අනුව මාසිකව එක් ප්‍රතිලාභියෙකු හඳුන්කුරු 224,000 ක් නිෂ්පාදනය කළ යුතු වුවද 2022 සැප්තැම්බර් 30 දිනට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එකී නිෂ්පාදන ඉලක්කය ළඟා කර ගැනිමට කිසිවකු සමත් වී නොතිබුණි. 2023 පෙබරවාරි 09 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව සහ ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 30 දෙනාගෙන් 16 දෙනෙකුම එනම්,	2022	ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබිම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය.	නව ප්‍රතිලාභීන් හඳුනාගනිමින් නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.	මැෂින් කිහිපයක් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය පරිදි නව ප්‍රතිලාභීන් වෙත පවරාදීම පමණක් සිදුකර ඇත.

	සියයට 53 ක් හඳුන්කූරු නිෂ්පාදන කටයුතු නතර කර තිබුණි. අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුව, රෝගාබාධ, වෙළඳ පොළ සොයාගැනීමේ දුෂ්කරතාවය හා නිසි සම්බන්ධීකරණයක්, මෙහෙයවීමක් හා පාලනයක් නොමැති වීම ඇතුළු හේතුන් මත ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 කටත් වඩා වැඩියෙන් නිෂ්පාදන නවතා තිබීම මත අදාල ව්‍යාපෘතිය මේ වන විට අසාර්ථක තත්ත්වයට පත්ව තිබුණු අතර දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතින ප්‍රතිලාභීන්ගේද ප්‍රගතිය අපේක්ෂිත පරිදි සතුටුදායක මට්ටමක නොපැවතුණි.				
7.	ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපාරික විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභින් 61 දෙනෙකු සඳහා රු.6,100,000 ක මුදල් ප්‍රතිලාභ ලබා දී තිබුණු අතර ව්‍යාපෘති වාර්තාවට අනුව පළමු අදියර යටතේ මාළු ටැංකි සාදාගැනීමට අදාල භූමිය සකස් කළ පසු දිරි ගැන්වීම් මුදලින්	2022	ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබිම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන් ට එරෙහිව කටයුතු කළ යුතුය.	ප්‍රතිලාභීන් 09 දෙනෙකු සඳහා වැඩ අවසන් කිරීමට උපදෙස් ලබාදෙන ලදි. ප්‍රතිලාභීන් දෙදෙනෙකු ඇස්තමේන්තු සැලසුම් අනුව කටයුතු කර නොතිබුණු බැවින් ඒ පිළිබඳව සංවර්ධන නිලධාරීන් මගින් දැනුවත් කර ඇත. එක් ප්‍රතිලාභියෙකුගෙන් මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කර ඇත.	මේ වන විටත් ටැංකි සාදා මාළු තැන්පත් කර නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 06 දෙනෙක් වන අතර ප්‍රතිලාභීන් දෙදෙනෙකු පමණක් රු.115,000 ක් ආපසු ගෙවා ඇත.

සියයට 50 ක් ගෙවීම හා දෙවන අදියර යටතේ ටැංකි සකස් කර අවසන් වීමෙන් පසු මසුන් තැන්පත් කිරීමේදී ඉතිරි රු.50,000 බැගින් මුදල් නිදහස් කරන බව දක්වා තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය මගින් සකස් කරන ලද භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව ප්‍රතිලාභීන් 27 දෙනෙකු ම මාළු ටැංකි සකස් කර තිබුණද මසුන් ටැංකිවලට දමා ව්‍යාපෘතිය ආරම්භ කරන මට්ටමට එම ටැංකි පත් කර නොතිබුණු අතරම මසුන්ද තැන්පත් කර නොතිබුණි.

එසේ වුවද එම ප්‍රතිලාභීන් සඳහා නියමිත අවශ්‍යතාවයන් සපුරාලීමෙන් තොරව රු.50,000 බැගින් රු.1,350,000 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘතියේ සඳහන් අදාල අවම අවශ්‍යතාවයන්වත් සපුරාලීමෙන් තොරව ප්‍රතිලාභීන් 02 දෙනෙකුට එක් අයෙකුට රු.100,000 ක් බැගින් රු.200,000 ක් ගෙවා තිබුණි. විගණනය විසින් අදාල ග්‍රාම නිලධාරි වසම්වල සිදුකළ නියැදි භෞතික පරීක්ෂාවේදී සම්පූර්ණ

	ප්‍රතිලාභ මුදල් ලබාගත් ප්‍රතිලාභීන් 17 දෙනෙකුම අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ නොකර මාලුටැංකි ඉදිකිරීම් විවිධ මට්ටම් යටතේ අත්හැරදමා තිබුණු අතර අදාල වගකිවයුතු නිලධාරින් මේ පිළිබඳව සිය අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යාම තුලින් ව්‍යාපෘතිය තුලින් අරමුණු කල ඉලක්ක ලභාකර ගත නොහැකි වී තිබුණි.				
8.	2019 මැයි 30 දිනැති අංක 02/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06 ඡේදය ප්‍රකාරව මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය යාවත්කාලීන නොකිරීම මත මතුගම, බේරුවල, දොඩන්ගොඩ හා බුලත්සිංහල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2023 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් 18 දෙනෙකු වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.613,072 ක මුදලක්	2023	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය .	මිය ගිය විශ්‍රාමිකයන්ගේ අධිහාර මුදල් බැංකු මගින් කඩිනමින් ගෙන්වා ගැනීමට උපදෙස් ලබාදී ඇති අතර අධිහාර ලේඛනයේ අදාල අයවීම් සම්බන්ධයෙන් කඩිනමින් සටහන් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	රු.95,957 ක් පමණක් මෙතෙක් අයවී ඇති අතර තවදුරටත් අයකර ගත යුතු මුදල රු.517,115 කි.

	පැවතුණි.				
9.	සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද එහි 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ඇතුලත් වියයුතු විස්තරාත්මක තොරුතුරු ඇතුලත් කර නොතිබුණු අතරම චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙතින් අනුමත කරවාගෙන ද නොතිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව විස්තරාත්මකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට හා අනුමත කරගන්නා ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට සටහන් තබා ගන්නා ලද බව.	නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි.
10.	මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.8,723,174 ක් වැය කර ක්‍රියාත්මක කර තිබුණු ගොටුකොළ ආශ්‍රිත නිෂ්පාදිත සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය යටතේ, 2017 වර්ෂයේදී ජාතික ආහාර වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී එහෙත් වසර 05 තිස්සේ භාවිතා කර නොතිබුණු, වටිනාකම විගණනයට ඉදිරිපත් නොවූ ආහාර විජලන යන්ත්‍රයක් හා ද්‍රව්‍ය කුඩු	2023	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය .	සෞභාග්‍යා සමිතියේ සාමාජිකයන්ට නැවත ISO වැනි තත්ත්ව සහතික ලබාදී ගොඩනැගිල්ලේ අඩුපාඩු අවසන් කර නිෂ්පාදන ආරම්භ කරන තෙක් මෙම ගොඩනැගිල්ල සහ යන්ත්‍ර තෝරාගත් සුදුසු නිෂ්පාදකයකු වෙත බදු පදනම මත ලබාදීමට තීරණය කර ඇත.	අපේක්ෂිත අරමුණු සඳහා මෙතෙක් කටයුතු මෙහෙයවා නොතිබුණි.

	කිරීමේ යන්ත්‍රයක් ද ලබා දී තිබුණි. එම ව්‍යාපෘතියේ නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබාගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් ලෙස දක්වා තිබුණ ද ඒ සඳහා සපුරාලිය යුතු භෞතික අවශ්‍යතා සම්පූර්ණ කර නොතිබීම මත, එම තත්ත්ව සහතිකය ලබා ගත නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදන, විදේශීය වෙළඳ පොළට මෙන්ම දේශීය වෙළඳ පොළට ද ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. එම සහතික ඉදිරියේදී හෝ ලබාගැනීමට සුදුසු නිෂ්පාදනාගාර පරිසරයක් මෙහි නිරීක්ෂණය නොවීය. මෙම ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යාපෘතියේ නිෂ්පාදනයන් වර්තමානයේදී තාවකාලිකව නවතා දමා තිබුණු අතර, ඒ අනුව ක්‍රියාත්මක කර තිබුණු ගොටුකොළ ආශ්‍රිත අගය එකතු කිරීමේ නිෂ්පාදන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත නොහැකි වී තිබුණි.				
11.	බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන	2023	ඌන උපයෝජිත උපකරණ හඳුනාගෙන	දැනට ලබාදී ඇති භාණ්ඩ පිළිබඳ විධිමත් සමීක්ෂණයක් සිදුකර ඇති අතර එහිදී	අස්ථානගත වූ භාණ්ඩ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින

	වැඩසටහහන යටතේ ක්‍රියාත්මක කළ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම් සඳහා ප්‍රතිලාභීන් 72 දෙනෙකු වෙත රු.6,492,054 ක් වටිනා මල් පෝච්චි අච්චු, සෙවිලි තහඩු සහ GI බට ද ලබා දී තිබුණ ද ක්‍රියාත්මක කර තිබුණු සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ ප්‍රගතිය පිළිබඳව ප්‍රතිලාභීන් 20 දෙනෙකු පිළිබඳව විගණනය විසින් සිදුකරන ලද නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 14 දෙනෙකු වෙත ලබාදී තිබුණු රු.1,312,475 ක් වටිනා එම උපකරණ 2024 ජනවාරි 19 වන විගණිත දින වන විටත් ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳව නිරන්තර අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.		උනන්දුවක් දක්වන්නන් වෙත ලබාදියුතු අතර උපකරණ ඌන උපයෝජනය සම්බන්දයෙන් වගකිවයුත්තන් ගෙන් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	හඳුනාගත් භාණ්ඩ විකුණා හෝ උකසට තබා ඇති පුද්ගලයන් වෙත නැවත භාණ්ඩ භාරදෙන ලෙස ලිඛිතව දන්වා සිහිකැඳවීම් ද නිකුත් කර ඇත.	අතර 2024 සැප්තැම්බර් මාසය දක්වාත් ක්‍රියාමාර්ග නිමකර නොතිබුණි.
12.	බුලත්සිංහල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම යටතේ රු.2,762,677 ක් වටිනා	2023	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු	ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති ද්‍රව්‍ය හා උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද සහ ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය මාර්ගය	2024 සැප්තැම්බර් 30 දින වන විටත් එක් පොහොර නිෂ්පාදන වැඩසටහනක් පමණක් සිදුකර තිබුණි.

යන්ත්‍ර ඇතුළු උපකරණ ප්‍රදානයන් සිදුකිරීමේදී විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව ඒවා ප්‍රතිලාභීන් වෙත ලබාදී තිබුණි. ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති ද්‍රව්‍ය හා උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද සහ ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය මාර්ගය වැඩිදියුණු කරන්නේද යන්න පිළිබඳ නිරන්තර අධීක්ෂණයක් සිදුවන බවට ලිඛිත සාක්ෂියක් නොවීය. ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන උපකරණ සමිතියේ පොදු පරිහරණය සඳහා ලබාදී ඇති අවස්ථාවල එම උපකරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොග ලේඛනයට ඇතුළත් කොට සෞභාග්‍යා සමිති භාරයට පත් කළ යුතු නමුත් උපකරණ ලබාදීමේදී එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. කොම්පෝස්ට් සැකසුම් මධ්‍යස්ථානයේ වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී, කාබනික පොහොර නිෂ්පාදන	සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකලයුතුය.	වැඩිදියුණු කරන්නේද යන්න පිළිබඳ වසම භාර සංවර්ධන නිලධාරීන් අධීක්ෂණයට ලක් කර ඇත.

ගොඩනැගිල්ල තුල කිසිදු පොහොර නිෂ්පාදනයක් සිදු නොවන බවත් කාබනික පොහොර හැලීම සඳහා ලබාදී තිබුණු යන්ත්‍රය භාවිතා කර පිටතින් රැගෙන එන පොහොර හැලීම පමණක් සිදුකරන නමුත් එම යන්ත්‍රයද දීර්ඝ කාලයක සිට භාවිතා කර නොතිබුණු බවත් දක්නට ලැබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ලබා දී තිබූ අතු කැබලි කැපීමේ යන්ත්‍ර දෙකෙන් ,එක් යන්ත්‍රයක් පමණක් දක්නට ලැබුණු අතර එම යන්ත්‍රයද දීර්ඝ කාලයක සිට භාවිත කර නොතිබුණි . කොම්පෝස්ට් නිෂ්පාදන පිළිබඳ වාර්තා කිසිවක් සමිතිය සතුව නොතිබුණු අතර , අගෝස්තු 2022 මාසයෙන් පසුව කිසිදු කාබනික පොහොර නිෂ්පාදනයක් සිදුව නොතිබුණි. ඒ අනුව ඉදිකළ කාබනික පොහොර සැකසුම් මධ්‍යස්ථානය හා එම මධ්‍යස්ථානය වෙත ලබාදී ඇති යන්ත්‍ර උපකරණද වසර 1 ½ කටත් වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පැවතීණි.

13.	මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කුරුඳු වගාව හා අතුරු නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා රු.6,016,447 ක් වැය කර තිබුණු අතර, විගණනය විසින් සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී කුරුඳු තෙල් නිස්සාරණ කටයුතු 2022 ජූලි මාසයේ ආරම්භ කර අත්හදා බැලීම් පමණක් සිදුකර 2022 දෙසැම්බර් මස 14 දින සිට ප්‍රාදේශීය ලේකම් සමග වූ ගිවිසුමක් මගින් පෞද්ගලික පාර්ශවයක් වෙත කුරුඳු තෙල් නිස්සාරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ වගකීම පවරා තිබුණි. එතැන් සිට විගණිත දිනය දක්වා කුරුඳු තෙල් බෝතල් 14.5 ක් පමණක් නිෂ්පාදනය කර එයින් බෝතල් 3.5 ක් පමණක් අලෙවි කර ගත හැකිව තිබුණි. ව්‍යාපෘති වාර්තාවට අනුව කුරුඳු ආශ්‍රිත අපේක්ෂිත අතුරු නිෂ්පාදනයන් 05 ක් දක්වා තිබූ නමුත් අදාල ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව අතුරු නිෂ්පාදන 02ක් පමණක් සුලු වශයෙන් සිදු කරන නමුත් අනෙකුත් නිෂ්පාදන	2023	නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි ව්‍යාපෘති යෝජනා තෝරාගත යුතු අතර පවත්නා අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීම සිදුකල යුතුය.	2023 අගෝස්තු මාසයේ අග වන විට කුරුඳු පොතු ගැලවීමට නොහැකි වන බැවින් කුරුඳු තැලීම තාවකාලිකව නතර කරන ලද අතර, කුරුඳු පොහොර ඉතා මිල අධික බැවින් ඇතැම් කුරුඳු ගොවීන් කුරුඳු කොළ පොහොර සඳහා යොදා ගෙන ඇති බව. එම නිසා ලැබෙන කොළ ප්‍රමාණය අඩු වී ඇති බව. ඉදිරියේදී කුරුඳු කැපෙන කාලය වන විට අපේක්ෂිත කොළ ප්‍රමාණයක් ලබාගත හැකි වීමත්, පොහොර සඳහා යොදන කොළ සඳහා විකල්ප ක්‍රමයක් භාවිතා කිරීමට උපදෙස් ලබා දී ඇත.	සැලසුම් සකස් කර තිබුණද නිර්දේශ පරිදි ප්‍රගතියක් පෙන්වා නොතිබුණි.

	සඳහා කිසිවෙකු විගණිත දිනය දක්වා යොමු වී නොතිබුණි.				
14.	විගණනයට ඉදිරිපත්වූ තොරතුරුවලට අනුව ගණනය කිරීමේ දෝෂ, වංචනික කටයුතු හෝ වෙනත් කරුණු මත කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක විශ්‍රාමිකයන් 35 දෙනෙකු වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති මුදල රු.4,276,202 ක් විය.	2023	වැඩිපුර ගෙවීම් නොපමාව අයකරගතයුතු අතර වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූලව කටයුතු කිරීම කල යුතුය.	සාවද්‍ය හේතු මත සිදුවී ඇති වැඩිපුර ගෙවීම් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2022 අනුව කඩිනමින් අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇති අතර, වංචනික විශ්‍රාම වැටුප් ලබාගත් අය වෙනුවෙන් අවශ්‍ය නීතිමය කටයුතු ආරම්භ කර තිබේ. ඉදිරියේදී වංචා අවම කිරීම සඳහා පූර්ණ අධීක්ෂණ ක්‍රියාවලියක් සිදුකිරීම පිණිස නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.	රු.1,548,361 ක් පමණක් අයවී ඇති අතර රු.2,727,841 ක් තවදුරටත් අයවීමට ඇත.
15.	කළුතර දිස්ත්‍රික්කයේ සිදුවූ ස්වභාවික ආපදාවලින් පූර්ණ හානියට පත් වූ සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කළ යුතු ලෙස හඳුනාගත් පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම පිණිස ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී තිබූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක	2023	ප්‍රතිලාභීන් වෙත නිදහස් කළ මුදල් අදාල කාර්යය සඳහා යොදවන බවට තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් හා පසුවිපරමක් සිදුකළ යුතුය . එලෙස අදාල කාර්යය සඳහා යොදවා මුදල් නොමැති ආපසු රජයට අයකර ගැනීමට කටයුතුකළ යුතුය.	මිලදිගත් ඉඩම්වල සහ නිවෙස්වල අයිතිය අදාල ප්‍රතිලාභීන් නමින් පවරාගෙන හෝ පවරාගත් බවට තහවුරු කරගැනීම සඳහා කටයුතු කරමින් පවතී.	නිර්දේශ පරිදි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ප්‍රතිලාභීන් 16 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.24,075,000 ක ප්‍රතිලාභ මුදල් මගින් මිලදීගත් ඉඩම්වල සහ නිවෙස්වල අයිතිය අදාල ප්‍රතිලාභීන් නමින් පවරාගෙන හෝ පවරාගත් බවට විගණිත දින වනවිටත් තහවුරු කරගෙන නොතිබුණි. තවද මේ යටතේ තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක (03) ප්‍රතිලාභීන් තිදෙනෙකු වෙත රු.4,600,000 ක් ගෙවා තිබූ නමුත් එම ප්‍රතිලාභීන් විසින් තමන් විසින් රජයේ අරමුදල් මගින් මිලදී ගත් නිවාස සහිත ඉඩම් පසුව වෙනත් පාර්ශවයන්ට විකුණා තිබුණ ද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි .ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ප්‍රතිලාභීන් 06 දෙනෙකු වෙත ගෙවා තිබුණු රු.9,500,000 ක ප්‍රතිලාභ මගින් මිලදී ගෙන තිබුණු ඉඩම් සහ නිවාස වල අයිතිය එම ප්‍රතිලාභීන් නමට නොවීය.				
16.	ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිඳුකම තුරන් කිරීමේ	2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වැඩසටහන ක්‍රියාත්මක කලයුතුය.	සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛ උපදෙස් පරිදි සමාගම් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් සමිති අහෝසි	චක්‍රලේඛ උපදෙස් පරිදි සමිති අරමුදල් මගින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතරතුර අක්‍රීය සමිති සතු මුදල් සක්‍රීය

	පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක 103 ක් ලියාපදිංචිකර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 80 ක් එනම් සියයට 78 ක්ම අක්‍රීයව පැවති බැවින් එදිනට එම සමිතිවල බැංකු ගිණුම්වල ශේෂව පැවති රු.28,323,210 ක මුදලක් ඌන උපයෝජිතව පැවතුණි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක එකී ක්‍රියාකාරීව පැවති සමිතිවල සාමාජිකයන් හට ලබා දී තිබූ ස්වයං රැකියා ණය අතරින් රු.2,285,874 ක් ද 2023 දෙසැම්බර් 31 දිනට අය නොවූ අක්‍රීය ණය වශයෙන් පැවතුණි.			කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන තෙක් සෞභාග්‍යා අක්‍රීය සමිති සතු රජයේ අරමුදල් සක්‍රීය සමිති වෙත ලබාදීමට උපදෙස් ලබාදී ඇත.	සමිති වෙත ලබාදීමේ කටයුතු නිමකර නොමැත.
17.	විගණනයට ඉදිරිපත් වූ තොරතුරුවලට අනුව 2024 පෙබරවාරි 27 දිනට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක පවතින ගොඩනැගිලි 65 ක් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතා නොකිරීම නිසා දිරාපත් වීමට ලක්වෙමින් පවතින අතර, එම	2023	ප්‍රයෝජනයට ගත හැකි ගොඩනැගිලි සම්බන්ධයෙන් නොපමාව සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ පිළිබඳව අවදානය යොමු කර භාවිතයට ගතහැකි ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගැනීම හා නවීකරණය කර භාවිතයට ගතහැකි ගොඩනැගිලිද ප්‍රයෝජනයට ගතහැකි කාර්යයක් සඳහා යොදාගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත	අදාල ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණ ද පූර්ණ උපයෝජනය කර නොතිබුණි.

	ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 26 ක අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුව පවතී. මෙම ගොඩනැගිලි අතරින් ගොඩනැගිලි 19 ක්ම නැවත අලුත්වැඩියා කර නවීකරණය කිරීමෙන් ප්‍රයෝජනවත් කාර්යයකට භාවිතා කළ හැකි මට්ටමේ පවතී. ඉතිරි ගොඩනැගිලි 39 වෙනත් බාහිර රාජ්‍ය ආයතන සතුව පවතින අතර, ඉන් ගොඩනැගිලි 29 ක්ම අලුත්වැඩියා හෝ නවීකරණයෙන් පසු නැවත භාවිතා කළ හැකි මට්ටමේ පවතී.				
18.	නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් කට්ටි 129 ක පැවරුම් කටයුතු සිදුකිරීමටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව පළාත් පාලන ආයතන වෙතින් පවරාගත යුතු ඉඩම් කට්ටි 10 ක් පවරා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	2023	පවරා ගත යුතු සහ පැවරිය යුතු ඉඩම් සම්බන්ධයෙන් කාලීනව කටයුතු කළ යුතුය.	පළාත් පාලන ආයතනවලින් පවරා ගතයුතු ඉඩම් හා පළාත් පාලන ආයතන වෙත පැවරිය යුතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන පවරාගැනීම් හා පවරාදීම් කටයුතු සිදුකරන ලෙස දැනුවත් කර ඇත.	මෙතෙක් ඒ සම්බන්ධයෙන් කටයුතු සිදුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.
19.	දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලීන බදුකර යටතේ බදු දී තිබූ හෙක්ටයාර 3.6 ක ඉඩමක් වෙනුවෙන්	2023	අයවිය යුතු බදු සම්බන්ධයෙන් සහ ගිවිසුමේ කොන්දේසි සම්බන්ධයෙන් ප්‍රමාණවත්	ඇවරකරු වෙත හා අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිඟ බදු ගෙවන ලෙස දන්වා යවා ඇතත් හිඟ බදු මුදල් මේ දක්වා	දඩ මුදල් ද ඇතුළුව අයවිය යුතු මුළු හිඟ මුදල රු.1,782,000 කි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිපති වෙතින් හා

	ඇවර කර තිබූ පෞද්ගලික සමාගමකින් රු.1,620,000 ක හිඟ බදු මුදලක් සහ දඩ මුදලද අයවිය යුතු ව තිබුණු අතර, 2006 නොවැම්බර් 10 දින සිට වූ ඉහත දීර්ඝ කාලීන බදු ගිවිසුමේ කොන්දේසිවලට අනුව බදු ආරම්භක දින සිට වසරක් ඇතුළත එම ඉඩමෙහි තාප විදුලි බලාගාරයක් ඉදිකළ යුතු ව තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එවකට පසු විපරම් සිදුකර නොතිබුණි. පසු කාලීනව මෙම ඉඩම බදුකරු වූ පෞද්ගලික සමාගම විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතියකින් තොරව වෙනත් සමාගමක් වෙත පවරා තිබුණ ද මේ පිළිබඳව ප්‍රාදේශිය ලේකම් දැනුවත් වී නොතිබුණි.		අධීක්ෂණයකින් හා පසු විපරමකින් කටයුතු කළ යුතු අතර ඒලෙස කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ගෙවා නැත.	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් විමසීම පමණක් සිදු කර තිබුණි.
20.	ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ 14 තුළ සමාලෝචිත වර්ෂයේ ආරම්භයට අනවසරයෙන් අල්ලා ගෙන තිබුණු ඉඩම් කට්ටි 6766 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය ලේකම්	2023	නියමිත පරිදි ඉඩම් කච්චේරි පැවැත්වීම හා අනවසර ඉඩම් නියමානුකූල කිරීම යාවත්කාලීනව සිදුකළ යුතුය	2023 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉඩම් කච්චේරි 5 ක්ද, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 1 ක්ද හා අගලවත්ත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 5ක්ද	ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු ආරම්භ කර ඇතත් මේ දක්වා නිම කර නොමැත.

	කාර්යාල 11 ක් විසින් ඉඩම් කච්චේරි 137 ක් පවත්වා අනවසර ඉඩම් කැබලි 956 ක් පමණක් නියමානුකූල කර තිබුණි.			වශයෙන් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් නියමානුකූල කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර අවසන් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	.
21.	විමධ්‍යගත අයවැය වැඩසටහන - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන - 2017 යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2018 ජනවාරි 30 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත රු.1,710,759 ක් වටිනා චෙක්පතක් නිකුත් කර තිබුණ ද 2022 මාර්තු 28 දින දක්වා වසර 04 කට වැඩි කාලයක් අදාළ ව්‍යාපෘතිය ඉටු නොකර එම මුදල මණ්ඩලයේ ගිණුමක රඳවා තබාගෙන පසුව බදු සඳහා රු.223,142 ක මුදලක් ද අයකර ගෙන ඉතිරි මුදල් වශයෙන් රු.1,487,617 ක් පමණක් ආපසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යවා තිබුණු අතර, ආරම්භක සැලසුම් සැකසීමේ සහ අධීක්ෂණ අකාර්යක්ෂමතා හේතුවෙන් රජය විසින් විවිධ ව්‍යාපෘති සඳහා	2023	අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරිම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් වෙතින් කරුණු විමසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	වැට් බදු මුදල් හා අනෙකුත් වියදම් අඩුකරගෙන ජලසම්පාදන මණ්ඩලය වෙතින් ලද රු.1,487,617 ක මුදල රජයේ ආදායමට බැර කිරීම පමණක් සිදුකර තිබුණි.	රු.1,487,617 ක මුදල රජයේ ආදායමට බැර කිරීම පමණක් සිදුකර තිබුණි.

ප්‍රමුඛතාවයක් ලබාදී යෙදවීමට ලබාදුන් මුදල් රු.1,710,759 ක් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වසර 05 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

3.10 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	6,872,610,020	384,460,628	6,488,149,392	තත්ත්වාගණනය කළ
2022	7,973,258,620	1,052,403,983	6,920,854,637	තත්ත්වාගණනය කළ
2023	7,293,998,977	205,283,522	7,088,715,455	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ගඟඉහළ කෝරළේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක වැනිලා ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැනිලා කරල් විජලනය කර විකිණීමේ අරමුණින් රු.852,200 ක පිරිවැයක් දරා වැනිලා විජලන යන්ත්‍රයක් හා එය ස්ථාපිත කිරීම සඳහා රු.1,144,218 ක පිරිවැයක් දරා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එසේ වුවද, 2022 දෙසැම්බර් මාසයේදී පරීක්ෂාවට ලක්කළ වැනිලා වගාකරුවන් අස්වැන්න නෙලා අමුකරල් බාහිර වෙළෙඳුන්ට අලෙවිකර තිබුණි.	2022	අදාළ ව්‍යාපෘති ඵලදායීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ යුතුය.	නොවැළක්විය හැකි මෙවැනි තත්වයක් හමුවේ මෙම ව්‍යාපෘතිය සඳහා රජය විසින් වැය කළ මුදල ඵලදායී ලෙස යොදා ගැනීම පිණිස විකල්ප අවස්ථාවකට යාමට කටයුතු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විට මෙම යන්ත්‍රය හා පොදු කාර්ය ගොඩනැගිල්ල රු. 10,000 ක මාසික කුලියකට පෞද්ගලික ආයතනය වෙත ලබා දීම පමණක් සිදු කර තිබුණි.
02	2014 ජනවාරි 27 දිනැති EST/8/ALLOW/03/121 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ	2023	චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය.	චක්‍රලේඛන උපදෙස් අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.	නිර්දේශයේ පරිදි චක්‍රලේඛ උපදෙස් අනුව කිසිදු ක්‍රියාමාර්ගයක්

	කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව, අය වැය යෝජනා මත ග්‍රාමීය මට්ටමෙන් සංවර්ධන ව්‍යාපෘති 2022 අප්‍රේල් මාසයෙන් පසුව ක්‍රියාත්මක නොවී පැවතියදී 2022 අප්‍රේල් 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක නිලධාරීන් 20 ක් වෙත රු. 2,084,000 ක විශේෂ දීමනා ගෙවා තිබුණි.				ගෙන නොමැත.
03	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ඉඩම් අත්පත් කර ගැනීමේ හා ඉඩම් පැවරීමේ කටයුතු සම්බන්ධයෙන් ලිපිගොනු 350 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ගොනු ආරම්භ කර වර්ෂ 03 ක සිට වර්ෂ 40 ක් අතර කාලයක් ගත වී තිබුණත් ඉඩම් අත්පත් කර ගැනීමේ හෝ ඉඩම් පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ඉඩම් පැවරීමේ හා අත්පත් කර ගැනීමේදී මතුවී ඇති ගැටළු හඳුනාගෙන ඒවා නිවැරදි කර ගැනීමට ක්‍රියා කළ යුතුය.	ප්‍රමාද වීමට හේතු සොයා බලා අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කරන ලෙසඋපදෙස් ලබා දී ඇති අතර එහි ප්‍රගතිය දිස්ත්‍රික් විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කරන බව	නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.
04	මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක පවුල් 1845 ක් හඳුනාගෙන තිබුණු අතර 2023	2023	නැවත පදිංචි කිරීමේදී මතුවන ගැටළු හඳුනාගෙන එම ගැටළුවලට පිළියම් ලබා දෙමින්	ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සමඟ සාකච්ඡා කර ඇති අතර මේ සම්බන්ධයෙන් නැවත සමීක්ෂණය කර විකල්ප අවස්ථාවලට යොමු විය යුතු බවට	නිර්දේශය ක්‍රියාත්මක වී නොතිබුණි.

දෙසැම්බර් 31 දින වන විට පවුල් 1386 ක් අධි අවදානම් ප්‍රදේශයේම පදිංචි වී සිටින බවට නිරීක්ෂණය විය.	පුද්ගලයන්ගේ ජීවිත අවදානම වැළැක්වීමට පියවර ගත යුතුය.	උපදෙස් ලබා දී ඇත.

3.11 කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,594,932,529	327,747,388	1,267,185,141	තත්ත්වාගණනය කළ
2022	1,701,418,844	246,101,954	1,455,316,890	තත්ත්වාගණනය කළ
2023	2,105,476,624	129,511,372	1,975,965,252	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.48,942,000 ක ඇස්තමේන්තුවක් මත 2014 ඔක්තෝබර් මස වැඩ ආරම්භ කර තිබූ වරකාපොල බස් නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම් භූමියේ හිමිකාරීත්වය පිළිබඳ ගැටළු මත 2015 අගෝස්තු 31 දින ලද අධිකරණ වාරණ නියෝගයක් හේතුවෙන් රු.15,189,389 ක කළ වැඩ වටිනාකමකින් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර තිබුණි.	2021	වැයවන මුදලට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කල යුතුය.	නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන උපදෙස් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් ව්‍යාපෘතිය නිමවී නොතිබුණි.
2.	දරිද්‍රතාව තුරන් කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී හඳුන්වා දුන්	2022	නිවැරදිව සැලසුම් කර උපයෝජනය	සෞභාග්‍යා කාර්යංශයෙන් ඉල්ලීම් කළ ද මේ වනතෙක්	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු ග්‍රාම ශක්ති සමිති 130න් 115ක් 2022 දෙසැම්බර් 31 දින වනවිට අක්‍රීය වී තිබුණි. ග්‍රාම ශක්ති මව් සමිති ගිණුම්වල හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ වන ගිණුම්වල 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.57,605,311 ක් අරමුණුගත කාර්යයට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතිණි		කළ යුතු වීම.	අදාළ ලියාපදිංචිය සමාගම් මැදූරෙන් අහෝසි නොවීම මත සමිති ප්‍රතිසංවිධාන කටයුතු ඉටු කිරීමට නොහැකි අතර දිස්ත්‍රික්කයේ ග්‍රාම ශක්ති ජනතා සමිති කීපයක් සාර්ථක ලෙස මේ වනවිටත් ක්‍රියාත්මක කරමින් ඇත. ජාතික මට්ටමින් පවතින මෙම ගැටළුව විසඳීම සඳහා සෞභාග්‍යා සංවර්ධන කාර්යංශය මඟින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අදාළ ගැටළුව නිරාකරණය කර දීම සම්බන්ධයෙන් කටයුතු ඉටු කරමින් ඇත.	
3.	කෑගල්ල දිස්ත්‍රික්කය තුළ 2016 වර්ෂයේදී ඇති වූ නායයෑමේ අවදානම නිසා විපතට පත් පවුල් 154 කට නැවත පදිංචිය සඳහා රු.150,505,800 ක් ගෙවා තිබුණි. එහෙත්, ඔවුන් අවදානම් සහිත නිවාසයේම පදිංචි වී සිටීම, ගෙවූ මුදලට සරිලන ලෙස නිවසේ වැඩ අවසන් නොකිරීම, මිලදීගත් ඉඩම හා වැඩ අවසන් කළ නිවස විකිණීම, මුදල් ලබා දී ඇතත් වැඩ ආරම්භ නොකිරීම වැනි හේතු මත නැවත පදිංචි කිරීමේ එම ව්‍යාපෘතියේ සාර්ථකභාවය ගැටළු සහගත විය. එමෙන්ම,	2022	මේ සම්බන්ධයෙන් නිසි අධ්‍යානයක් සිදුකර සුදුසු තීරණගත යුතු වේ.	මෙම නැවත පදිංචි කිරීමේ වැඩසටහන අත්හිටුවා ඇති අතර, ඒ සඳහා තවදුරටත් මුදල් ගෙවීමේ හැකියාවක් නොමැත. කෙසේ වුවද ජනතාවට ආරක්ෂිතව ජීවත්වීමේ දි පැනනගිනු ලබන කුමන හෝ ගැටළුකාරි තත්වයක් මේ සම්බන්ධයෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය දැනුවත් කර අවශ්‍ය කටයුතු සිදුකරන බවද පෙන්වා දෙමි.	2024 සැප්තැම්බර් 30 දක්වාත් හිඟ මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

	මෙම නායයෑම් හේතුවෙන් එම පවුල් නැවත පදිංචි කිරීම සඳහා 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.393,161,033 ක් 2022 දෙසැම්බර් 31 දක්වාම ගෙවා නොතිබුණි.				
4.	ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 වෙත ලද රු.9,303,465 ක් තැන්පතු ගිණුමට බැරකර වර්ෂ 5 කට වඩා පැරණි වුවද, මේ දක්වාම අත්පත් කර ගැනීම් අවසාන කර නොතිබුණි.	2023	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වීම.	අධිකරණයේ නඩු පවරා තිබීම හා ඒවා අවසන් නොවීම, වවුචර්පත් ඉදිරිපත් වී නොමැති වීම ආදී කරුණු හේතුවෙන් මෙම තැන්පතු නිරවුල් කිරීම ප්‍රමාද වී ඇති අතර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් නිරවුල් වී නොතිබුණි.
5.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක සමෘද්ධි බැංකු විසින් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද රු.156,315,710 ක් මේ දක්වා ප්‍රතිපූර්ණය කර නොතිබුණි.	2023	කඩිනමින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කළ යුතුවීම.	දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා සමෘද්ධි අධිකාරිය වෙතින් ඉල්ලා ඇති අතර, රු.33,624,628 ක මුදලක් පමණක් ලබාදී ඇත.	2024 ජූනි 30 දිනට තවදුරටත් රු.122,691,082 ක මුදලක් ප්‍රතිපූර්ණය කළ යුතුව පැවතුණි.
6.	කෑගල්ල පුරවර විශ්ව විද්‍යාලයේ ඉදිකිරීම් සඳහා රු.61,029,229 ක් වැයකර තිබුණි. පසුව එම ඉදිකිරීම් අසම්පූර්ණව පැවැතිය දී , සියලු ඉදි කිරීම් අත්හැර දමා තිබුණි.	2023	වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම.	2022 වර්ෂයේ රාජ්‍ය ප්‍රතිපත්ති අනුව නියමු ව්‍යාපෘතිය ලෙස කෑගලු දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරිම සඳහා විශ්ව විද්‍යාලය ආරම්භ කිරිමට කටයුතු සම්පාදනය කර තිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකිරීම අතරමඟ නවතා දැමීම සිදු කරනු ලැබුවේ ,	අදාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නවතා දමා තිබුණි.

				අදාල අමාත්‍යාංශය විසින් ගන්නා ලද තීරණයක් අනුවය.	
7.	නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු243,993,402 ක් වැයකර තිබුණි. එහෙත්, ඉදි කිරීම් ප්‍රගතිය සියයට 88 ක් වීමෙන් අපේක්ෂිත අරමුණු මේ දක්වාම ඉටුකර ගැනීමට නොහැකිව පැවතුණි.	2023	වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම.	අදාළ සංශෝධිත ඇස්තමේන්තුව උපදේශන ආයතනයේ නිර්දේශ සහිතව ලද විගස අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දැනුවත් කර ඇති අතර එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව මෙම වර්ෂය තුළම ගොඩනැගිල්ල දිස්ත්‍රික් ලේකම් වෙත භාර ගෙන වැඩ කටයුතු ආරම්භ කිරීමට සූදානම් කර ඇත.	2024 සැප්තැම්බර් මාසය වනවිටත් වත්කම භාවිතයට ගෙන නොතිබුණි.
8.	ග්‍රාම ශක්ති ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා තිබුණු සමිති 130 න් 2023 දෙසැම්බර් වන විට සමිති 119 ක් ම අක්‍රීය ව පැවැතිණි. ක්ෂුද්‍ර මූල්‍ය ගිණුමේ සහ සක්‍රීය හා අක්‍රීය සියලු සමිති ගිණුම්වල පැවැති රු.60,004,996 ක ශේෂය නිෂ්කාර්යව පැවැතීම මත වැඩසටහන අසාර්ථක වී ඇති බව නිරීක්ෂණය කෙරේ.	2023	අක්‍රිය සමිති සක්‍රිය කර ගැනීමට හා අක්‍රිය ගිණුම් ශේෂ සක්‍රිය වන පරිදි වැඩසටහන් සකස් කිරීම.	ණය වැඩසටහනේ අරමුදල් භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇති අතර සෞභාග්‍යා කාර්යාංශය මඟින් මෙම ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහනේ අරමුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් කැබිනට් පත්‍රය කෙටුම්පත් කර විරෝධතා තිබේනම් ඉදිරිපත් කිරීම සඳහා සමාගම් මැදුර වෙත යොමුකර ඇති අතර ඒ අනුව ඉදිරියේදී අක්‍රීය සමිති ගිණුම්වල පවතින මෙම නිශ්කාර්ය අරමුදල් ක්‍රමවත්ව භාවිත කිරීමට හැකිවීමෙන් වැඩසටහන සාර්ථක කරගැනිමට හැකිවනු ඇත.	වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදී ඇතත්, වැඩසටහන් ක්‍රියාත්මක වී නොතිබුණු බව.

9.	දිස්ත්‍රික්කය තුළ ග්‍රාම නිලධාරී කාර්යාල 107 ක් රජය සතු ඉඩම්වල පැවැතිය ද, එම ඉඩම්වල අයිතිය පවරාගෙන නොතිබුණි.	2023	ඉඩම්වල අයිතිය පවරාගත යුතුවීම.	සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත උපදෙස් ලබාදී ඇති අතර 2024 වර්ෂය තුළදී කෑගල්ල, දැරණියගල ආදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ග්‍රාම නිළධාරී කාර්යාල වල වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.	සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්වෙත අවශ්‍ය උපදෙස් ලබාදී තිබුණ ද සියලුම ඉඩම් පවරාගෙන නොතිබුණි.
10.	කෑගල්ල, දීවෙල වසමේ 2018 වර්ෂයේ ආරම්භ කළ ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම් අත්හැර දැමීම නිසා ඒ වෙනුවෙන් රු.1,733,622 ක් වැයකර ඉදිකළ ජල ටැංකිය අභාවිතව පැවැතිණි.	2023	වත්කම් අභාවිතව නොතැබිය යුතු වීම.	අසුපිණි ඇල්ල ව්‍යාපෘතිය මඟින් ජලය ප්‍රමාණවත්ව නොලැබුණහොත් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පොම්පාගාර, තෙකලා විදුලිය හා පොම්ප සවිකිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඇත.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් නිමකර නොතිබුණි.
11.	රුවන්වැල්ල සහකාර ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදුන් කුලී නිල නිවාසය සඳහා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 උපවගන්තිය අනුව වැටුපෙන් සියයට 10 ක් වූ රු.264,272 ක් අයකර නොතිබුණු අතර, එය ගිණුම්වල ද හෙළිදරව් කර නොතිබුණි.	2023	ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවීම.	අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ඉදිරියේදී අයකිරීමට කටයුතු කළ හැකිය.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.12 කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,374,381,444	31,028,210	1,343,353,234	තත්ත්වාගණනය කළ
2022	1,374,121,186	10,513,831	1,363,607,355	තත්ත්වාගණනය කළ
2023	1,373,014,684	7,508,012	1,365,506,672	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1	ඉඩම් සංවර්ධන පනතේ 464 පරිච්ඡේදයේ 19(2) වගන්තියට පටහැනිව, 2014 වර්ෂය තුළ නිකුත් කළ ඉඩම් බලපත්‍ර 702 ක් 2022 මාර්තු මාසය වන විටත් අදාළ ප්‍රතිලාභීන්ට භාර නොදී කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි.	2021	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් ඔවුන් දැනුවත් කර බලපත්‍ර නිකුත් කරමින් පවතී.	බලපත්‍ර 316ක් අදාල ප්‍රතිලාභලාභීන් වෙත ලබා දිය යුතු අතර, බලපත්‍ර 100ක් අත්හිටවීමට කටයුතු කරමින් පවතී.
2	නිෂ්පාදන සමුපකාර ව්‍යාපෘතිය යටතේ ලබා දුන් රු.13,475,211ක ගොඩනැගිලි හා උපකරණ වර්ෂ 03කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පවතී.	2021	වත්කම් අභාවිතව නොතැබිය යුතුය.	එක් සමුපකාර සමිතියක හැර ලබාදුන් සියලු උපකරණ හොඳින් භාවිතා වන බවට පිළිතුරු දී තිබුණද, එම සියලු උපකරණ අභාවිතව පවතින බව භෞතික පරීක්ෂණවල දී තහවුරු විය.	2024 සැප්තැම්බර් 30 දක්වාත් උපකරණ භාවිතා කර නොතිබුණි.
3	වටිනාකම රු.21,552,983 ක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බංගලා 02 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි.	2021	වත්කම් නිෂ්කාර්යව නොතැබීමට පියවරගත යුතුය.	වර්තමාන මිල ගණන් වැඩිවීම් හේතුවෙන් බංගලා 02ක වැඩි දියුණු කිරීම් සිදුකළ නොහැකිව පවතී. එහෙත් කඩි නමින් භාවිතා කිරීමට කටයුතු	2024 සැප්තැම්බර් 30 දක්වාත් අදාල බංගලා දෙක භාවිතා කර නොතිබුණි.

				කරනු ලැබේ.	
4	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103 (1) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සොරකම් කළ වර්ග 09ක අයිතම්වල රු. මිලියන 0.246 පාඩුව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ.	පොලීසියේ පැමිණිලි කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
5	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනට අනුව 2021 වර්ෂයේ කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන 03ක පිරිවැයකින් ඉදිකළ වෙළෙඳපොල සංකීර්ණය අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට මහජනතාවට විවෘත නොකර පසුගිය වර්ෂයේ සිට අත්හැර දමා තිබුණි.	2022	ප්‍රයෝජනයට ගත හැකි ලෙස ඉදි කර අවසන් වූ වහාම විවෘත කර ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	මහජනතාවට භාවිතය සඳහා ලබා දී නොතිබුණි.
6	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් ඉඩම් 20ක වටිනාකම රු.334,395,000ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් ඉන් රු.202,870,000ක් වටිනා ඉඩම් 13ක හිමිකාරිත්වය සනාථ	2023	ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට නඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් පැවරීමේ කාර්යයන් අවසන් නොවී තවදුරටත් කටයුතු කෙරීගෙන යන ඉඩම් සම්බන්ධයෙන් නිලධාරී කමිටුවක් ස්ථාපිත කර, රැස්කරනු ලබන නිවැරදි තොරතුරු කඩිනමින් ලබාදී	හිමිකාරිත්වය ලබා ගැනීමට හෝ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	කිරීමේ නීතිමය ලිපි ලේඛන නොපැවැතුණි.			අවසන් කරන බව.	
7	සමාලෝචිත වර්ෂයේ ලබාදුන් ඉඩම් හිමිකම් ඔප්පු 132ක් අදාල ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව පුද්ගලයින්ට ලබා දීමට කටයුතු නොකර කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තබා තිබුණි.	2023	පනත ප්‍රකාරව කටයුතු කර අදාල පුද්ගලයින් වෙත හිමිකම් ඔප්පු කඩිනමින් ලබා දිය යුතුය.	ඉඩම් හිමිකම් ඔප්පු අදාල පුද්ගලයින්ට ලබාදීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.
8	කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බදු දී තිබූ ඉඩම් වෙනුවෙන් 2005 සිට 2023 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතු වාර්ෂික හිඟබදු සහ දඩ ගාස්තු එකතුව රු.3,129,750ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර හිඟ බදු අයකර ගත යුතුය.	එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව.	හිඟමුදල් අයකර නොතිබුණි.
9	විවිධ අමාත්‍යාංශ හා වැඩසටහනෙහි මූල්‍ය ප්‍රතිපාදනයෙන් හකුරු නිෂ්පාදනය සහ තෙලිජ්ජ ඇසුරුම් කිරීම්, රා ඇසුරුම් කිරිම්, පළතුරු සහ එළවළු සැකසීම, පපඩම් නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය සහ ඇසුරුම් කිරිම, කොම්පෝස්ට් නිෂ්පාදනය, මුරුංගා කොළ කුඩු නිෂ්පාදනය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එකතුව රු. මිලියන	2023	අදාල ව්‍යාපෘති සක්‍රීය කිරීමට විධිමත් වැඩපිළිවෙලක් සකසා ක්‍රියාත්මක කළ යුතුය.	දෛනිකව අමුද්‍රව්‍ය ලැබීම් ප්‍රමාණවත් නොවීම, නිෂ්පාදන වියදම් අධික වීම, වෙළෙඳ පොල අවස්ථා නොමැති වීම්, තෙකලා විදුලිය නොමැති වීම, නිෂ්පාදන පිරියත හා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කළ ගොඩනැගිල්ලෙහි ඉඩ පහසුකම්වල ප්‍රමාණවත් නොවීම වැනි හේතු නිසා මෙහෙයුම් ක්‍රියාත්මක නොවීය.	අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඵලදායි පියවර ගෙන නොතිබුණි.

	62.64ක් වැයකර යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමත්, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා නිෂ්පාදන මධ්‍යස්ථාන ඇති කිරීමත් සිදුකර සමූපකාර සමිති 04කටත් ග්‍රාමීය සංවර්ධන සමිති 02කටත් 2018 සහ 2019 වර්ෂයන්හිදී භාරදි තිබූ නමුත් ඒවා වර්ෂ 05කට අධික කාලයක් භාවිතා නොකර අභාවිතව පැවතුණි.				
10	පච්චිලෙයි පල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පදිංචිය සඳහා ගෙයක් නොමැති ජනතාව හඳුනාගෙන රු.31,590,000ක් වැයකර ඉදිකළ නිවාස 55කින් පසුගිය වර්ෂ 01 ක සිට 04ක් දක්වා කාලයක් ජනතාව පදිංචි නොවී එම නිවාස වටා කැලෑ වැවී නිෂ්කාර්යව පැවැතීම නිරීක්ෂණය විය.	2023	ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට යොමු කර නැවත විමර්ශනය කිරීමකින් පසු ප්‍රතිලාභ අවශ්‍යම පුද්ගලයන්ට නිවාස ලබා දීමට කටයුතු කළ යුතුය.	රජය විසින් ලබාදුන් ස්ථිර නිවාසවලින් නිවාස 55ක වෛද්‍ය ප්‍රතිකාර සඳහා යෑම්, සහකරු නොමැතිව තනිව ජීවත් වීම, වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවූවන් ඇතුළත්ව තිබුණි. ඔවුන් නැවතත් පැමිණ පදිංචි වන බව.	මේ වන විටත් එම නිවාස භාවිතා කර නොතිබුණි.
11	කන්දාවලෛයි සමෘද්ධි බැංකුවේ මුදල් ලැබීම් කුවිතාන්සි මුද්‍රිත පොත් ශේෂය හා භෞතික පොත් ශේෂය සැසඳීමේදී පොත් 200ක හිඟයක් පැවතුණි. මේ පිළිබඳව සමෘද්ධි බැංකු සමිති අත්පොත 12හි 3.6 ඡේදය ප්‍රකාරව, සමෘද්ධි කළමනාකරු සහ	2023	මෙම විෂයට අදාල බලයලත් නිලධාරියා වෙත වාර්තා කර විධිමත් පරීක්ෂණයක් පවත්වා නීති රීති ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතුය.	මෙම කරුණ සම්බන්ධ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය බලය පවරා නොමැත. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මෙම කරුණට විගණන පිළිතුරු දීම සුදුසු නොවන බව.	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	සම්බන්ධිත පාර්ශවයන් ගෙන් මුදල් ලැබීම් පොත් නැතිවීම සම්බන්ධයෙන් එක් පොතක් සඳහා රු.25,000ක් බැගින් සම්පූර්ණයෙන් රු.5,000,000ක් අයකළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.				
12	2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වර්ෂ 05කට අධික කාලයක් ස්ථාන මාරුවීම් නොලබා නිලධාරීන් 315ක්, එකම සේවා ස්ථානයක අඛණ්ඩව රාජකාරි ඉටුකරමින් පැවති බව නිරීක්ෂණය විය.	2023	චක්‍රලේඛය ප්‍රකාරව, ක්‍රියාකිරීමට කටයුතු කළ යුතුය.	සේවා කාලය සැලැකිල්ලට ගෙන ස්ථාන මාරුකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකිරීමට පියවර ගොන නොතිබුණි.

3.13 කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	4,751,615,349	769,850,291	3,981,765,058	තත්ත්වාගණනය නොකළ
2022	4,782,087,167	535,005,154	4,247,082,013	තත්ත්වාගණනය කළ
2023	4,907,454,850	266,123,702	4,641,331,148	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කල අඹන්පොල ජල ව්‍යාපෘතිය හා අංක 425 කටුපොත යුනිට් 03 ජලයෝජනා ව්‍යාපෘතිවල ඉතිරි වැඩ නිම කිරීම සඳහා පිළිවෙලින් රු.1,979,418 ක් හා රු.3,959,328 ක් 2020 වර්ෂයේදී වැය කර තිබුණද, ජල මූලාශ්‍රයේ සිට ටැංකිය දක්වා ජල නල එලීම සම්පූර්ණ කර නොතිබීම, ජල ටැංකියේ සිට පාරිභෝගිකයන් දක්වා ජලය ගෙන යාමට නල පද්ධතියක් සකස් කර නොතිබීම, විදුලිය ලබා නොගැනීම යන කරුණු හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමෙන් වැය කළ මුදල නිෂ්කාර්ය බවට පත්ව තිබුණි.	2023	ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණ ඉටුවන ආකාරයට හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරයට ක්‍රියාක්මක කළ යුතුය.	ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු ඉටුකිරීමට සූදානම් කර ඇති බව.	ව්‍යාපෘතීන් නිම නොකල තත්වයේම පවතී.

2.	කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් මොන්නැකුලම සේවා පියස කාර්යාලයට ඒකාබද්ධව තැපැල් කාර්යාලය හා සමුපකාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.1,000,000 ක ඇස්තමේන්තුවක් යටතේ රු.970,000 ක් වැයකර ඉදිකිරීම් කටයුතු කොන්ක්‍රීට් කුළුණු සකස් කිරීමට පමණක් සීමා වී තිබූ අතර මෙම ඉදිකිරීම් කටයුතු අවසන් වී වසරක් පමණ ගතවී තිබුණ ද, ගොඩනැගිල්ල හා අවට භූමිය කැලෑවෙන් වැසී කොන්ක්‍රීට් කුළුණු සඳහා යොදා ඇති කම්බි මලකඩ සහිතව දිරායාමට ලක්වෙමින් තිබුණි.	2022	ඉදිකිරීම් ව්‍යාපෘති ඵලදායී ලෙස අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය.	ග්‍රාමීය කම්ටුවේදී නිකවැරටිය විවිධ සේවා සමුපකාර සමිතිය පොරොන්දු වූ පරිදි මේ වන විට ව්‍යාපෘති දෙකේම ඒකාබද්ධ ඉදිකිරීම් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	ඉදිකිරීම් සම්පූර්ණ කර නොමැතිව එසේම පවතී.
3.	2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රු.9,627,428 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල වාරියපොල කළුගමුව මාර්ගයේ ගොන්නව පාලම සිට බමුණාකොටුව මංසන්ධිය දක්වා ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය හා රු.4,746,457 ක ප්‍රතිපාදන මත	2023	මනා අධ්‍යනයකින් පසුව ව්‍යාපෘති විධිමත්ව සැලසුම් කළ යුතු අතර ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂමව, ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට	ජල සම්පාදන මණ්ඩලයෙන් දිගින් දිගටම ප්‍රගතිය විමසීමේදී දැනට පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ජලනල මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවක් සකස් කරමින් පවතින බව දැනුම් දෙන ලදි. බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අවසර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු	ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොමැත.

	ක්‍රියාත්මක බමුණාකොටුව හන්දියේ සිට තිම්මාගම දක්වා ජලනල දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට 2014 වර්ෂයේදී මුදල් ගෙවා තිබුණ ද, වසර 10 කට ආසන්න කාලයක් මෙම ව්‍යාපෘති දෙකෙන්ම ජනතාවට ජලය ලබාගැනීමට නොහැකිවීමෙන් වැයකරන ලද රු.14,373,885 ක මුදල නිෂ්කාර්ය වී තිබුණි.		හැකිවන ආකාරයට ඉටුකල යුතුය.	සිදු කර ඇති බව.	
4.	කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වඩුගෙදර ග්‍රාම නිලධාරි වසමේ වඩුගෙදර ජල ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂයේ පළාත් නැඟුම සංවර්ධන වැඩසටහන යටතේ රු.1,990,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඉදිකිරීමේ කටයුතු සිදුකිරීම වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කාර ආයතනය සමූපකාර සමිතිය වෙත රු.381,998 ක් ගෙවා තිබුණ අතර කාර්මික නිලධාරී නිර්දේශය නොමැති වීම හේතුවෙන් තවදුරටත් රු.1,589,208ක මුදලක් අදාළ ආයතනය වෙත ගෙවිය යුතුව තිබුණි.	2023	ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි වැඩ අවසන් කර අදාළ ප්‍රතිලාභීන්ට ප්‍රයෝජනවත් වන පරිදි ව්‍යාපෘති වල ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කළ යුතුය.	2014 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා රු.381,997ක මුදල 2015 වර්ෂය සඳහා අවිච්ඡේද කරන ලද අතර, සංවර්ධන කටයුතු නැවත ආරම්භ කළ පසු ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු ප්‍රාදේශිය සභා පොදු අරමුදල් යොදවා නිම කිරීමට ප්‍රාදේශිය සභාව එකඟතාව පලකර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	ඉදිකිරීම් කටයුතු සිදුකර වර්ෂ 8ක් පමණ ගතවී ඇතත්, විදුලි සම්බන්ධතාවයන් හා වතුර මෝටර් ලබාදී නොතිබීම හේතුවෙන් ජල හිඟයෙන් පීඩා විඳින පවුල් 150 ක පමණ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දී තිබූ අතර, ව්‍යාපෘතියට වැයකල මුදල නිෂ්කාර්ය වී තිබුණි.				
5.	රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2022 වර්ෂයේ ගම සමඟ පිළිසඳරක් මිලියන 20 වැඩසටහන යටතේ රු.960,874 ක වියදමින් තෙළඹුගල්ල පාසැල් ක්‍රීඩාපිටිය මායිමේ ඇති ඇළ පිලිසකර කර ඉදිකර තිබූ ආරක්ෂිත බැම්ම සම්පූර්ණයෙන්ම ගැලවී ගොස් තිබුණ අතර, මේ හේතුවෙන් වැයකර තිබූ මුදල් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.	2023	ව්‍යාපෘති ඉටුකිරීමේදී අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකල යුතුය.	පාසල් සංවර්ධන සමිතිය වෙත මෙම බැම්ම නැවත ප්‍රතිසංස්කරණය කරන ලෙස උපදෙස් ලබා දී ඇති අතර රැඳවුම් මුදල් මේ වන තෙක් ගෙවා නොමැති බව.	ආරක්ෂිත බැම්ම නැවත ඉදිකර නොතිබුණි
6.	කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි ප්‍රාදේශිය ලේකම් කාර්යාල 30 හි සම්පත් පැතිකඩ අනුව, තාවකාලික නිවාස 4,744 ක්, අනවසර පදිංචි 6,596 ක්, විදුලිය රහිත නිවාස 3,908ක්, අනාරක්ෂිත ළිං 17,372 ක්, අර්ධ ස්ථිර නිවාස 33,513ක්, වල වැසිකිළි	2022 2023	දිස්ත්‍රික්කය තුළ පවතින ගැටළු වලට විසඳුමක් ලෙස ව්‍යාපෘති සැලසුම් කර ඵලදායිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	අදාල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.	ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණද ප්‍රමාණවත් ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

	3,818 ක්, වැසිකිළි නොමැති නිවාස 7,654ක්, පදිංචියට නිවසක් නොමැති පවුල් 4,505ක් පැවතියදී දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම ගැටළුවලට විසඳුම් ලැබෙන පරිදි යෝජනා සකස් කර ප්‍රතිපාදන උපයෝජනය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.				
7.	ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජයන්තිපුර ග්‍රාම නිලධාරී වසමේ රාජංගනය යාය 04 හි පිහිටි කලාඔය දූපතේ හෙක්ටයාර 49.6122 ක ඉඩමෙන් (අක්කර 124.0305) කොටසක් අනවසර පදිංචිකරුවන් 07 දෙනෙකු විසින් සහ ස්වාමීන් වහන්සේ නමක් විසින් අනවසරයෙන් අල්ලාගෙන භුක්ති විදිමින් තිබූ අතර, එසේම මෙම ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ රක්ෂිත භූමියක් ලෙස නම් කිරීමට තීරණය කිරීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර වසරකට වැඩි කාලයක් ගතවී ඇතත්, එමගින්ද නිශ්චිත විසඳුමක් ලැබී නොතිබුණි.	2022	අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	අනවසර පදිංචිකරුවන් 07 ක් සඳහා නඩු 07 ක් ගොනු කර ඇති අතර, නඩු කටයුතු අවසන් වන තෙක් ඉඩම පිළිබඳව කටයුතු කිරීම නැවතී ඇත.	නඩු කටයුතු අවසන්ව නැත .

8.	ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සඳගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාතෘ සායනය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.1,150,000 ක මුදලින් සකස් කර එයට ලබාදී තිබුණු පුටු ඇතුළු උපකරණද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අදාල මාතෘ සායනය අත්හැර දමා තිබුණි.	2022	නිශ්කාර්යව පවතින උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය.	සඳගල සායන මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයට කි.මී.4 ක් දුරින් සෝල්වැව තවත් සායන මධ්‍යස්ථානයක් පවතින බැවින් මෙම මධ්‍යස්ථානය බර කිරන ස්ථානයක් ලෙස භාවිතා කරනු ලැබේ.	ඉදිකිරීම් ඌන උපයෝජිතව පැවතුණි.
9.	කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යටතේ ඇති කුරුණෑගල නාගරික සීමාව තුළ පිහිටි රජය සතු ඉතා වටිනාකමැති දේපළ 26 ක් කුරුණෑගල මහ නගර සභාවට පවරාදෙන ලෙස ඉල්ලා තිබූ අතර, ඒවා විධිමත් පරිදි පැවරීමක් සිදුකර නොතිබුණි. එසේම මෙම දේපළවලින් බොහෝමයක් වාණිජ පරමාර්ථයෙන් පවරා ගැනීම සඳහා ඉල්ලා තිබූ අතර, මේවා දිගු කාලීන බදු පදනම මත ලබාදී රජයට ආදායමක් උපයාගත හැකිව තිබියදී, මේ සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණි.	2021, 2022	රජය සතු වටිනා දේපළ පැවරීමේදී ඒ ගැන සොයා බලා පැවරිය යුතු දේපළ පමණක් විධිමත් පරිදි පැවරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	කුරුණෑගල මහා නගර සභාවට පැවරිය හැකි දේපළ පවරා දීමටත් අනෙකුත් දේපළ දිගු කාලීන බදුදීමේ හැකියාවක් ඇති බැවින් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.
10.	බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ගම	2021, 2022	රජයට සිදුවී ඇති අලාභය අදාල	සන්නිවේදන කුළුණ ඉදිකර ඇති කොටස දීර්ඝකාලීන බදු පදනම	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

	පත්තුව කෝරලේ 1201-වැදණ්ඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දික්වැහැර ග්‍රාමයේ අංක 47/19/1 මු.පි.කු 1326 දරන පිඹුරෙහි අංක 54 දරන කොස් කැලය නමැති බිම් කැබැල්ල ප්‍රදාන පත්‍ර හිමිකරු විසින් පෞද්ගලික සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී සමාගමක් වෙත ලබාදී තිබුණ බැවින්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2018 ජූලි 16 දිනැති අංක 2007/3(iii) චක්‍රලේඛය ප්‍රකාරව අදාල කොටස නැවත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරාගෙන නොතිබීම හේතුවෙන් රු.1,015,000 ක ගණනය කළ අලාභයක් රජයට සිදුවී තිබුණි.		පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	යටතේ අදාල සමාගම වෙත පවරා දීමටත් දැනට මෙම ඉඩම රජයට පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	
11.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 කට අදාලව පසුගිය වර්ෂ 03 ක කාලපරිච්ඡේදය තුළ වන අලි හානි සඳහා එකතුව රු.10,574,971 ක් දේපළ, ශාරීරික හා ජීවිත හානි වශයෙන් වන්දි මුදල් පිරිනමා තිබුණද, පසුගිය කාලපරිච්ඡේදයට අදාලව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක	2021 2022	සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වන අලි උවදුර විසඳීම සඳහා පියවර ගත යුතුය.	මෑත කාලීනව සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී එහි නායකත්වය දේශපාලන අධිකාරිය සතු වීම සහ ගැටලුකාරී ව්‍යාපෘති ඉටුකිරීමට ප්‍රමාණවත් මුදල් වෙන් නොවීම හේතුවෙන් මෙම තත්ත්වය ඇතිවී ඇති අතර, වන අලි උවදුර පාලනය කිරීම සඳහා යම් ක්‍රියාමාර්ග ගනු ඇත.	නිර්දේශ ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක වී නොතිබුණි.

කිරීමේදී වන අලි ගැටලුවලට විසඳුම් ලබාගත හැකි සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

3.14 මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,777,521,508	442,095,110	2,335,426,398	තත්ත්වාගණනය කළ
2022	3,114,183,397	294,173,158	2,820,010,239	තත්ත්වාගණනය කළ
2023	3,126,992,902	199,279,597	2,927,713,305	තත්ත්වාගණනය කළ

	විගණන වාර්තාවට ඇතුළත් කර ඇති ප්‍රධාන අඩුපාඩු	විගණන වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	එකතුව රු.69,576,920 ක්වූ වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු 290 කට අදාළ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් රු. 8,110,371 ක්වූ තැන්පතු 22 ක් වර්ෂ 05 ක් ඉක්මවා තිබුණි.	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රමාණවත් අක්මුදල් නොමැති වීම, ව්‍යාපෘතිය සම්බන්ධ විගණන විමසුම් පැවතීම, ලිපිගොනුවල අඩුපාඩු සහිත වීම මත වවුචර් ඉදිරිපත් නොකිරිම වැනි හේතූන් මත මෙම තැන්පතු නිරවුල් කිරිමට නොහැකි වූ බව දන්වා තිබුණි.	තැන්පතු අතරින් රු.3,821,418 ක තැන්පතු ශේෂ 17 ක් තවදුරටත් නිරවුල් කිරීමට පවතී.
2.	කෝට්ටගොඩ උම්බලකඩ හා කරවල නිෂ්පාදන කර්මාන්ත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමත වී තිබූ රු.6,000,000 ක මුදලින් අදියර 2ක් යටතේ මෙම ව්‍යාපෘතිය ඉටුකිරීමට 2021 දෙසැම්බර් 16 දින ග්‍රාම සංවර්ධන සමිති 2 ක් සමග ගිවිසුම්ගත වී තිබුණි. 2022 පෙබරවාරි 23 දින විගණන භෞතික පරික්ෂාව වන තෙක්ම	2021	මෙම කටයුතු කඩිනමින් අවසන් කොට ජනතාවට ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කර දීමට කටයුතු කළ යුතුය.	රටේ පවතින අර්බුදකාරී තත්ත්වය මත වෙළඳපොළ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟයක් ඇතිවීම නිසාත් කාලය ප්‍රමාණවත් නොවීම නිසාත් 2022 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස මෙතෙක් අනුමැතිය නොලැබීමත් මත ඉදිකිරීම් කටයුතු නතර වී ඇති බව දන්වා තිබුණි.	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් ඉදිකිරීම් නිම කර නොතිබුණි.

	ගොඩනැගිල්ලේ අත්තිවාරම දක්වා පමණක් කොන්ක්‍රීට් කණු 24 ක් පමණක් ඉදිකර තිබූ අතර එම කණු සඳහා යෙදූ කම්බි මළකෑමට ලක්වී තිබූ බව නිරීක්ෂණය විය. විගණන අවස්ථාව වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සඳහා දින දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.				
3.	අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 368B දොල මාවත ග්‍රාම නිලධාරී වසමේ එරනවිලහේන නැමැති රජයේ ඉඩමෙහි පවත්වාගෙන යනු ලබන ගල්කොරිය කිසිදු බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොමැතිව මාස තුනකට ආසන්න කාලයක් පවත්වාගෙන ගොස් තිබුණද අදාළ වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. විගණන පරීක්ෂාවට ලක් වූ 2022 ජුනි මස වන විටද එම කළුගල් කැනීමේ කටයුතු සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් කාර්මික කැනීම් බලපත්‍ර ද මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික ආරක්ෂණ	2021	මේ සම්බන්ධව වගකිවයුතු නිලධාරීන්ගේ අවධානය යොමු කරවන අතර මේ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත්කොට නිසි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට හා මධ්‍යම පරිසර අධිකාරියට මේ පිළිබඳව නීත්‍යානුකූලව කටයුතු සිදුකළ හැකි බව දන්වා ඇත.	වගකිව යුතු ආයතන මේ සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර නොතිබුණු අතර, ගල්කොරිය මේ වනතෙක් අක්‍රීය තත්ත්වයේ පවතී.

	බලපත්‍රය ද දිස්ත්‍රික් පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත්කරන ලද පුපුරණ ද්‍රව්‍ය අවසර පත්‍රයද ලබාගෙන නොතිබුණි. විගණන පරික්ෂණ අවස්ථාව වනවිට එම ස්ථානයෙහි කළුගල් කැනීම් සිදුකර ඇති බවට නිරික්ෂණය වූ අතර ගල් ඇඹරුම් යන්ත්‍රයක්, එක්ස්කැවේටර් යන්ත්‍ර 02ක් හා කොම්ප්‍රෙෂර් යන්ත්‍රයක් ද පැවති බවත්, ගල් මෝල්ද ක්‍රියාත්මක තත්වයේ පවතින බවත් නිරික්ෂණය විය.				
4.	ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල, අතුරලිය හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල එකතුව රු.4,286,251 ක් වැයකර ක්‍රීඩාපිටි 03 ක් සංවර්ධනය කර තිබුණු අතර ක්‍රීඩාපිටි අරමුණුගත කාර්යයට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.	2023	ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන අයුරින් කටයුතු කළ යුතුය.	පානීය ජලය, වැසිකිළි පහසුකම්, ඇඳුම් මාරු කිරිමට ස්ථානයක් නොමැතිවීම හා ක්‍රිකට් ක්‍රීඩා කිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත මෙම ක්‍රීඩා පිටියේ අරමුණු ඉටුකර ගැනීම ගැටළුවක් වී ඇති බව.	ක්‍රීඩා පිටි 03 ම අරමුණු ගත කාර්ය සඳහා යොදා නොගන්නා බව.
5.	වැලිගම ප්‍රදේශීය ලේකම් බල ප්‍රදේශයේ කුඹල්ගම රතුමැටි ආශ්‍රිත නිෂ්පාදන	2023	ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර	අමුද්‍රව්‍ය සොයාගැනීමට ඇති දුෂ්කරතාවය නිසා කර්මාන්තය තාවකාලිකව නතර වී	ප්‍රතිලාභීන් 19 දෙනා අතරින් එක් ප්‍රතිලාභීයෙකු පමණක් ඉදිකිරීම්

	ගම්මානයක් ආරම්භකර එක් ප්‍රතිලාභියෙකුට රු.75,000 ක් වශයෙන් ප්‍රතිලාභීන් 19 ක් සඳහා එකතුව රු.1,425,000 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා දී තිබුණද, භෞතික පරික්ෂාවේදී ප්‍රතිලාභීන් එම ද්‍රව්‍ය අරමුණුගත කාර්යයන්ට යොදා ගෙන නොතිබුණි.		ගත යුතුය.	ඇති අතර ප්‍රතිලාභීන්හට වැඩහල් ඉදිකිරීම සඳහා ලබා දුන් ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිවසට යාබදව ඉදිකිරීම් සිදු කර වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගන්නා බව.	කළ කොටසෙහි මැටි කර්මාන්තය සිදුකරන බව.
6.	අතුරලිය, මුලටියන හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි ග්‍රාම නිලධාරී වසම්වල පිළිවෙලින් බතික් නිෂ්පාදනය, කුරුදු බේල් කිරීම හා බට ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් 83 කට රු.5,566,376 ක වටිනාකම සහිත උපකරණ අයිතම 611 ක් අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි. තවද අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බතික් නිෂ්පාදනයට මිලදීගෙන තිබුණු රු.524,480 ක් වටිනා රසායනික ඩයි වර්ග නිෂ්පාදන කටයුතුවලට යොදා නොගෙනම කල් ඉකුත් වී තිබුණි.	2023	පසුවිපරම් නිසි පරිදි සිදු කළ යුතු බවත් අදාළ සියළුම ප්‍රතිලාභීන් බතික් කර්මාන්තයට යොමුවීම දිරිමත් කළ යුතුය	ඉදිරියේදී මේ තත්ත්වයන් මගහැරීමට පසුවිපරම් සිදුකරන බව.	ප්‍රතිලාභීන් 13 කු බතික් නිෂ්පාදනයේ නිරත වන බව. කුරුඳු බේල් කිරීමේ යන්ත්‍ර 18 ක් භාවිතා නොකරන බැවින් කොට්ඨාශයේ එම කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන්ට ලබාදෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වී ඇත. බට ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරිමට ඉදිකල ගොඩනැගිල්ලට අවශ්‍ය ජලසැපයුම , විදුලිය හා වැසිකිළි නොමැතිවීමත්,මිලදී ගත් උපකරණ ඌණ උපයෝජිතව පවතී.

7.	2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් නියමානුකූල කිරීම සඳහා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 22 ක පසුගිය වසර 04 තුළ ඉඩම් කච්චේරි පවත්වා නොතිබූ අතර පර්චස් 1070 කට අදාළව පදිංචිකරුවන් 10 කගේ දීර්ඝ කාලීන බදුකර සකස් කිරීමට පසුගිය වසර 03 ක කාලය තුළ පියවරගෙන නොතිබුණි.	2023	කඩිනමින් දීර්ඝ කාලීන බදුකර සකස් කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය	අදාල ආයතනවලින් අනුමැතිය ලද පසු පැවරීම් සිදු කරන බව.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් පැවරුම් කර නොතිබුණි.
8.	කිරින්ද පුහුල්වැල්ල, කඹුරුපිටිය, මාලිම්බඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචිකරුවන් 79 ක් රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විදිනු ලැබුවද ඒවා පසුගිය වර්ෂ 02 ක සිට වර්ෂ 16 ක් අතර කාලය තුළ නියමානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි.	2023	අනුමැතිය කඩිනමින් ලබා ගෙන පැවරීම් කටයුතු නිම කළ යුතුය	ඉඩම් කොමසාරිස්ගෙන් අනුමැතිය ලද පසු පැවරීම් කටයුතු සිදු කරන බව.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් නියමානුකූල කර නොතිබුණි.
9.	මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසමක වසා දමන ලද පාසලක් නවීකරණය කර එම පාසල තුළ කුරුඳු නිෂ්පාදනයට අවශ්‍ය පුහුණු පාඨමාලා	2023	අදාල ගොඩනැගිල්ල සුදුසු කටයුත්තක් වෙනුවෙන් උපයෝජනය කළ යුතුය.	රටේ පවතින ගැටළුකාරී තත්ත්වය මත ප්‍රතිපාදන නොලැබීමත් පලොල්පිටියේ පුහුණු මධ්‍යස්ථානයක් පැවතීමත් වැනි හේතූන් නිසා අපේක්ෂිත පරිදි පුහුණු පාඨමාලා සිදු	2024 සැප්තැම්බර් මාසය දක්වාත් විධිමත් පරිදි උපයෝජනය කර නොතිබුණි.

	පැවැත්වීම හා ඊට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.6,905,652 ක් වැයකර අදාළ ගොඩනැගිල්ල නවීකරණය කර උපකරණ මිලදීගෙන තිබුණි. මීට ආසන්න ස්ථානයක රජය මගින් කුරුඳු පර්යේෂණායතනයක් පවත්වාගෙන යන බැවින් මෙම ගොඩනැගිල්ල හා උපකරණ ඌන උපයෝජිතව පැවතුණි.			කිරීමට නොහැකි බව.	
10.	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටුවිට I ග්‍රාම නිලධාරී වසමේ පර්චස් 8.78 ක ඉඩම රජයට පවරා ගැනීමකින් තොරව රු.2,903,630 ක් වැයකර සේවා පියසක් ඉදිකර තිබුණද ඉඩම රජයට පවරා නොගැනීම නිසා යටිතල පහසුකම් සංවර්ධනය යන අරමුණ ඉටුවී නොතිබුණි.	2023	ඉඩම අත්පත් කර ගැනීම කඩිනම් කළ යුතුය	අත්පත් කර ගැනීම් සිදු කර නොමැති බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
11.	ග්‍රාම නිලධාරී වසම් දෙකක සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමෘද්ධිලාභීන්ගේ	2023	වැඩිපුර ගෙවූ මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය.	මූලික විමර්ශණයක් සිදුකර මුදල් අයකරගන්නා බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	නාමලේඛනය යාවත්කාලීන නොකිරීම නිසා 1995 සිට 2016 මාර්තු 21 දින දක්වා විහාරස්ථානයක හා පිරිවෙනක වැඩවාසය නොකරන ලද ස්වාමීන් වහන්සේලාට සමෘද්ධි සහනාධාරය ලෙස රු. 1,264,610 ක් වැඩිපුර ගෙවා තිබුණි.				
12.	2007 වසරේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.11,816,497 ක් වැයකර තිබුනද එම නිල නිවස පසුගිය වසර 16 තුළම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.	2023	රජයේ මුදල් අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් ආර්ථිකභාවයෙන් යුක්තව යෙදවීමට අවධාරණය කරගත යුතුය.	නිල නිවසේ කිසිවකු පදිංචි වී නොමැති බව.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් නිල නිවසේ කිසිවකු පදිංචි වී නොතිබුණි.
13.	දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු උපලේඛනගත නිවාසයක් 2022 වර්ෂයේදී රු.722,975 ක් වැයකර අලුත්වැඩියා කර මාස 15 ක් ගතවී තිබුණද නිල නිවස ඌන උපයෝජිතව පැවතුණි. සහකාර ප්‍රාදේශීය ලේකම්වරියට පෞද්ගලික නිවසක් කුලී පදනමට ගෙන පදිංචි වී සිටි ඉහත කාලය තුළ රු.	2023	නිලධාරින් වෙනුවෙන් වෙන්කළ රජයේ නිවසක් තිබියදී පෞද්ගලික කුලී නිවාසයක් සඳහා රජයේ මුදල් වැය නොකළ යුතුය.	මෙම නිල නිවසේ කිසිදු නිලධාරියෙක් පදිංචි විමට අකමැති බව.	2024 සැප්තැම්බර් මාසය දක්වාත් නිල නිවසේ කිසිවකු පදිංචි වී නොතිබුණි.

	300,000 ක නිල නිවාස දීමනාවක් ගෙවා තිබුණි.				
14.	කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගතාර ග්‍රාම නිලධාරී වසමේ රජයට අයත් වැලිහේන්ගොඩ කුට්ටිය නම් ඉඩමෙහි පර්චස් 20 ක ඉඩම් කොටසක් 2004 වර්ෂයේදී හා විටියල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ රජයට අයත් හෙක්ටයාර 0.0365 ක්වූ ඉඩමක කොටසක් දූරකථන සමාගමක් විසින් අනවසරයෙන් අත්කරගෙන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකර තිබුණි. අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර විගණිත දිනය වූ 2023 නොවැම්බර් 24 දින දක්වාත් අදාළ සමාගමෙන් කිසිදු බදු මුදලක් අයකරගෙන නොතිබුණි.	2023	අදාල සමාගමෙන් හිඟ බදු අය කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය.	අනවසර අල්ලාගැනීම් සම්බන්ධව පනත ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත කරුණු විමසා ලිපියක් යොමු කළ බව හා සහකාර ප්‍රාදේශීය ලේකම් ප්‍රමුඛ කමිටුව මගින් ලබා ගන්නා ලද දළ තක්සේරුව මත දූරකථන සමාගම වෙත බදු ගෙවන ලෙස දැනුම් දුන් බව.	අදාල සමාගම වෙත බදු ගෙවන ලෙස දැනුම් දී ඇති අතර, 2024 සැප්තැම්බර් මාසය දක්වා අය වී නොතිබුණි.

3.15 මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,794,480,115	139,165,309	2,655,314,806	තත්ත්වාගණනය කළ
2022	2,789,816,872	87,156,688	2,702,660,184	තත්ත්වාගණනය කළ
2023	2,922,165,391	71,750,180	2,850,415,211	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරාගැනීමේ දීගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දඬුයාය ග්‍රාම නිලධාරි වසමේ ඉඩම් කැබැල්ලක වටිනාකම පළාත් ප්‍රධාන තක්සේරුකරු විසින් පළමුව කුඹුරු ඉඩමක් ලෙස සළකා රු.91,000ක සංවර්ධන වටිනාකමක් වන්දි ලෙස තිරණය කර තිබුණද අවස්ථා කිහිපයකදී තක්සේරු වටිනාකම වෙනස් කිරීම මත අවසානයේදී රු.2,905,800ක් ගෙවා තිබීමේ පදනම විගණනයේ දී තහවුරු නොවුණි.	2021	විධිමත් පරීක්ෂණයක් කර වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් එය වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගත යුතුය.	ඉඩම් අමාත්‍යාංශය මඟින් පරීක්ෂණයක් සිදුකිරීම	2024 සැප්තැම්බර් 30 දින වන විටත් පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නැත.
2.	මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය	2021	ව්‍යාපෘතිවල වැඩ කොටස් සම්පූර්ණ කර උපයෝජනය	ව්‍යාපෘති 03 ක් භාවිතයට ගැනීමට කටයුතු සිදුකිරීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් කෝවිල් ප්‍රතිසංස්කරණ 02 ක්

	දක්වා ගොඩනැගිලි ව්‍යාපෘති 06 ක් හා ක්‍රීඩාපිටියක් ඉදිකිරීම සඳහා රු.5,975,482 ක් වැය කර තිබුණි ද, තවදුරටත් නිමකළ යුතු වැඩකොටස් පැවතීම හේතුවෙන් එම ඉදිකිරීම් ව්‍යාපෘති භාවිතයට යොදා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.		කළ යුතු ය.		හා ක්‍රීඩා පිටියක් ඌන උපයෝජිතව පැවතුණි.
3.	ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරගොල්ල ග්‍රාම නිලධාරි වසමේ දෙමහල් ස්වයං රැකියා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ ගිවිසුම අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 30 දින වන විට වැඩ අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 22 වන විට ද වැඩ අවසන් කර නොතිබුණි.	2021	ගොඩනැගිල් ලේ වැඩ නිම කර උපයෝජනය කළ යුතුය.	ප්‍රාදේශීය සභාව මඟින් ඉදිකිරීම් සිදුකර පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යෝජනාවක් සිදුකර තිබීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.
4.	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියට අදාළව උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාබනික පෙහොර නිෂ්පාදකයින් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.1,000,000 ක ඉදිකිරීම් ද්‍රව්‍ය	2021	ඉදිකිරීම් අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	නව ප්‍රතිලාභීන් 03දෙනෙකු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොමු කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පවතින බව.	2024 සැප්තැම්බර් 30 වන විට නිෂ්පාදකයින් 03 දෙනෙකු නිෂ්පාදන කටයුතු නතර කර ඇත.

	ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබාදී තිබුණි. එහෙත් 2022 ජනවාරි 26 දින වන විටද අදාළ ඉදිකිරීම් අවසන් කර කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කර නොතිබුණි.				
5.	2022 අප්‍රේල් 07 දින වන විට රු.2,608,000ක වියදමක් දරා තිබුණු නමුත් තව දුරටත් සිදු කළ යුතු වැඩකොටස් පැවතීම හේතුවෙන් රත්තොට, අඹගස්තැන්න ගම්මිරිස් සැකසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිෂ්කාර්යයව පැවතුණි.	2022	ඉදිකිරීම් අවසන් කර අරමුණු ගත කාර්යය සඳහා යොදවා ගත යුතුය.	ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා සැකසූ රු.මිලියන 3.17 ක ඇස්තමේන්තුව අනුමැතියට යොමු කිරීම.	2024 සැප්තැම්බර් 30 දිනවන විටද ඉදි කිරීම් කටයුතු අවසන් කර නොතිබුණි.
6.	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිනිරන්කැටිය බෑග් හා සපත්තු නිෂ්පාදකයින්ගේ සමිතිය වෙත 2022 ඔක්තෝබර් 03 දින ලබා දී තිබුණු රු. 88,900 ක මුද්‍රණ යන්ත්‍රය හා ග්‍රාම නිළධාරි වසම් 02ක ප්‍රතිලාභීන් සඳහා 2022 ඔක්තෝබර් 03 හා 20 දිනවලදී ලබාදී තිබුණු එකතුව රු. 1,100,000 ක ගම්මිරිස් ඇඹරුම් යන්ත්‍ර 04 ක් හා ගම්මිරිස් එළ කිරීමේ	2022	අදාළ යන්ත්‍ර උපයෝජනය කිරීමට හැකිවන ලෙස අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුය.	බෑග් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදීම හා ගම්මිරිස් අස්වනු ඉහළ නැංවීම පිළිබඳ ඉදිරියේදී පුහුණුවක් ලබාදීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් භාවිතයට ගෙන නොමැත.

	යන්ත්‍ර (Pepper Thresher) 04 ක් 2023 පෙබරවාරි 24 පරීක්ෂණ දිනය වනවිටත් භාවිතයට ගෙන නොතිබුණි.				
7.	2023 සැප්තැම්බර් 19 දිනැති අංක 2023/04 දරන ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛයේ 1 ඡේදය අනුව 2024 වර්ෂය සඳහා දිස්ත්‍රික්කයේ සියලුම ගිනි අවි බලපත්‍ර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රථම අලුත් කිරීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණද, ගලේවෙල, දඹුල්ල හා අඹන්ගග කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පුද්ගලයින් 60 දෙනෙකු 2024 පෙබරවාරි වන විටත් ගිනි අවි බලපත්‍ර අලුත් කර නොතිබුණි.	2023	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.	ග්‍රාම නිලධාරීන් මඟින් ගිනි අවි ලාභීන් වෙත දැනුවත් කිරීම් සිදුකිරීම	2024 සැප්තැම්බර් 30 දක්වා චක්‍රලේඛ උපදෙස් අනුව බලපත්‍ර ලබාගෙන නැත.
8.	බිරිඳවෙල සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ සිදුකර තිබුණු රු.4,590,500 ක මූල්‍ය වංචාව සම්බන්ධව 2023 දෙසැම්බර් 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු අවසන් කර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.	විමර්ශනයේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලා ඇති බව.	2024 සැප්තැම්බර් 30 දක්වා පරීක්ෂණ කටයුතු අවසන් කර නැත.

9.	රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආපදාවට පත් පුද්ගලයින් නැවත පදිංචි කිරීම වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා 2018 - 2021කාලය තුළ රු. 5,400,000 ක ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් 06 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ඉදිකිරීම් කටයුතු නිම කර නැවත පදිංචි කරවීමට කටයුතු කර නොතිබුණි.	2023	ප්‍රතිපාදිත මුදල්වලින් අපේක්ෂිත ප්‍රගතිය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	අදාල ඉදිකිරීම් සිදු කරන තෙක් වාරික නිදහස් නොකිරීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නැවත පදිංචි කිරීම සිදුකර නොතිබුණි.
10.	කර්මාන්ත අමාත්‍යාංශයෙන් 2022 ඔක්තෝබර් 27 දිනලැබුණු රු.15,904,651 ක මුදල් භාවිතා කර ඇඹුල්අඹේ කර්මාන්තපුරයේ වැට ඉදිකිරීම අදියර - I හි වැඩ 2022 දෙසැම්බර් 29 දිනට අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් වැඩ අවසන් නොකර රු.6,774,590 ක ඉතිරි මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. වැට ඉදිකිරීම II වන අදියරෙහි වැටෙහි දිග මීටර් 38.6 ක් ඉටු නොකර ඒ සඳහා රු. 127,380 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. වැට ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුවක්	2023	ශක්‍යතා අධ්‍යයනය කර අවශ්‍යතාව නිවැරදිව හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුග ත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කර ඉටුකළ වැඩ සඳහා ගෙවීම් කළ යුතුය	නිරීක්ෂණ සම්බන්ධයෙන් දඹුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් තොරතුරු ඉල්ලා ඇති බව.	නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	පිළියෙල නොකර, අදියර 02 ක් යටතේ වැට ඉදිකිරීම හේතුවෙන් පළමු අදියර යටතේ කර්මාන්ත පුරයේ අභ්‍යන්තරය හරහා මීටර් 340 ක වැට ඉදිකිරීම සඳහා වැය කර තිබුණු රු.1,700,000ක මුදල අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි.				
11.	උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල ඉදිකිරීම (B -කොටස 6 වන අදියර) ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 19 ක වැඩ ආරම්භකර හෝ නොතිබියදී හා ඉටු නොකළ වැඩ විෂයයන් 04 ක් සඳහා ඉටුකළ බවට බිල්පත් නිර්දේශ කර රු. 1,585,976ක් ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ කාර්යසාධන සුරක්ෂණය 2024 ජනවාරි 15 දිනෙන් අවසන් වී තිබුණු අතර වැඩ අවසන් කළ යුතු දිනය 2023 දෙසැම්බර් 11 වුවත් 2024 පෙබරවාරි 05 දින වන විටත් වැඩ අවසන් නොකිරීම හේතුවෙන් අයකළයුතු රු.814,165 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.	2023	නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුව අවසන් කළ වැඩ සඳහා ගෙවීම් කළ යුතුය.	විගණන හා කළමනාකරණ කමිටු තීරණ අනුව කමිටුවක් පත්කර වාර්තාවක් කැඳවීම.	නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

12.	උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ "අතිරේක වැඩ නිමකිරීම" ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 11 ක් සඳහා රු.1,504,218 ක් ගෙවා තිබුණද එම වැඩ විෂයයන් සිදුකර නොතිබුණි. කාර්යසාධන සුරක්ෂණය2024 ජනවාරි 31 දිනෙන් කල් ඉකුත් වී තිබුණු අතර 2023 දෙසැම්බර් 28 දින වන විට අවසන් කළ යුතු වුවද2024 පෙබරවාරි 05 දින වන විටත් වැඩ අවසන් නොකිරීම හේතුවෙන් අයකළ යුතු රු.164,717 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.	2023	නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ ඇස්තමේන්තුගත ප්‍රමිතියට අනුව වැඩ අවසන් කර ඉටුකල වැඩ සඳහා ගෙවීම් කළ යුතුය.	විගණන හා කළමනාකරණ කමිටු තීරණ අනුව කමිටුවක් පත්කර වාර්තාවක් කැඳවීම.	නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
13.	මාතලේ දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජා මූල බැංකු 11ක නියැදියක් පරීක්ෂාවේදී 2023 ජූනි 30 දිනට ප්‍රතිලාභීන් 176 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු එකතුව රු.19,347,350 ක ණය ප්‍රමාණයෙන් රු. 10,274,194 ක හිඟ ණය ශේෂයක් පැවතුණු අතර එම ප්‍රතිලාභීන්ගෙන් මාස 09 සිට 15 දක්වා කාල පරාසයක් තුළ කිසිදු වාරිකයක් අයකර නොතිබුණි.	2023	හිඟ ණය අයකරගැනීමට කටයුතු කළ යුතුය.	ණය අයකරගැනීමට කටයුතු කරන ලෙස කළමණාකරුවන්ට උපදෙස් ලබාදීම.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් පුද්ගලයින් 113 ගෙන් අයවී නොමැති ශේෂය රු.7,712,192 ක් විය.

14.	2020 මැයි 17 දිනැති අංක DSD/HO/MF/2020/05 හා 2021 පෙබරවාරි 17 දිනැති අංක 2021/02 දරන සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ප්‍රකාරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදලින් අඩු ආදායම් ලාභී පවුල් වෙත 2020 වර්ෂයේදී එකතුව රු.357,309,399 ක ප්‍රතිලාභ ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් එම මුදල් ප්‍රතිපූරණය කර නොතිබුණි.	2023	චක්‍රලේඛය අනුව ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.	ප්‍රතිපූර්ණය කරගැනීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

3.16 මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,503,418,783	92,036,934	2,411,381,849	තත්ත්වාගණනය කළ
2022	2,512,904,502	174,788,696	2,338,115,806	තත්ත්වාගණනය නොකළ
2023	2,533,329,686	99,514,576	2,433,815,110	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් විදුලි වැට නඩත්තුව හා පසු විපරම් ක්‍රියාවලියට අදාළව විදුලි වැට ආශ්‍රිතව මුරකුටි ඉදිකිරීම් සඳහා 2020 මාර්තු මස 08 දින රු.36,451,618 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර, ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා පැකේජ 05 කට වෙන් කර තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු සමඟ පැකේජ අංක 1/2/3 සහ 5 යටතේ රු.25,009,958 කට ගිවිසුම්ගතව තිබුණි. 2022 මාර්තු 22 දින වන විටත් මෙම ඉදිකිරීම් කටයුතු නිමකර හෝ ව්‍යාපෘතියේ ගිවිසුම් ගත කාලය දීර්ඝ කර නොතිබුණි.	2021	ඇස්තමේන්තු වැඩ කොටස් ගිවිසුම්ගත කාලය තුළ නිම කළ යුතුය.	මෙම කර්මාන්තයට අදාළව අතරුඳවුම් මුදලද ඇතුළු සියළු ගෙවීම් මේ වන විට ගෙවා ඇති බව හා තැන්පත් ගිණුමෙහි ඉතිරිව පවතින එම රු.33,572 ක මුදල රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව.	ගිවිසුම අවලංගු කර ඇත. අවලංගු කරන ලද පැකේජවලට අදාලව අතරුඳවුම් හා කාර්ය සාධන ඇපකර මුදල් 2023 මාර්තු 13 දින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට යවා ඇති අතර, ව්‍යාපෘතිය නිමකර නැත.

2.	පරිසර හා වනජීවී අමාත්‍යාංශයේ 2020 ජනවාරි 03 දිනැති පරිසර චක්‍රලේඛ අංක 01/2020 අනුව 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 28 වැනි වගන්තියට අනුකූල නොවන ලෙස බොරළු කැපීමේ වලංගු කැණීම් බලපත්‍රයක් ලබාගෙන නොතිබියදී වැල්ලවාය හා මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ව්‍යාපෘති 2 ක් සඳහා රු.2,228,190 ගෙවා තිබුණි.	2022	චක්‍රලේඛ ප්‍රකාරව අදාල ආදායම් රැස් කලයුතුය.	නිරීක්ෂණය පිළිගනිමි.අහිමිවූ ආදායම රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කරමි.	අහිමිවූ ආදායම රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කර නැත.
3.	මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ වෙහෙරයාය රන්ලිය ව්‍යවසායකත්වය සංවර්ධන පදනම සඳහා රටකජු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට 2020 ඔක්තෝම්බර් 14 දින රු.1,925,569 ක වටිනාකමට ග්‍රාමීය වැඩිහිටි සංවිධානයක් වෙත පවරා වැඩ අවසන් කර තිබූ අදාළ ගොඩනැගිල්ල විගණන දිනය වූ 2022 නොවැම්බර් 15 දින වන විට වසර 02	2022	අපේක්ෂිත අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කලයුතුය.	ව්‍යපෘතිය ක්‍රියාත්මක කිරිමේ වගකීම කුඩා පරිමාණ කෘෂි ව්‍යපාර සහභාගිත්ව වැඩසටහන සතුය.	රටකජු සැකසුම් මධ්‍යස්ථානය අරමුණුගත කාර්ය සඳහා යොදා ගෙන නැත.

	කට වැඩි කාලයක් ගතවී තිබුණද, අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි.				
4.	මොණරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021 හා 2022 වර්ෂවල ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කෝමාරිකා වගා ව්‍යාපෘතිය සඳහා රු.3,776,390 ක් වැය කර තිබුණි. කෝමාරිකා පැල මිලදී ගෙන ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා රු.1,697,090 ක් වැය කර තිබුණද, කෝමාරිකා පත්‍ර නිෂ්පාදනයේ අස්වනු නෙලීමේ කාලය එළඹ තිබුණද, පත්‍ර එලදාව මිලදී ගැනීමට ගැනුම්කරුවන් නොමැතිවීමෙන් හා සරු එලදාවක් නොතිබීමෙන් වගාකරුවන් වගාව අත්හැර දැමීමට නැඹුරු වී තිබුණි. තවද දිලීර රෝග වැලදී කෝමාරිකා පත්‍ර විනාශවී යන ස්වරූපයක් පවතින බව සංවර්ධන නිලධාරී වාර්තා හා ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	2022	වෙළඳපල අධ්‍යනයකින් යුතුව ව්‍යාපෘති හඳුනාගත යුතුවේ.	ගණුදෙනුකරුවන් ගෙන්වා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දී ඇත.	ගැනුම්කරුවන් ගෙන්වාගෙන කටයුතු කල බවට ලිඛිත සාක්ෂි නොමැත.

5.	සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන - 2021 යටතේ මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොලොන්වින්න පන් කර්මාන්ත ගම්මානයක් සංවර්ධනය කිරීම සඳහා රු. 2,390,641 ක් වැයකර තිබුණි. ව්‍යාපෘතිය යටතේ රු. 853,000 ක් ඇස්තමේන්තු කර පන් කර්මාන්ත ශිල්පින්ගේ නිර්මාණ අලෙවිහලක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණද, විගණන දිනය වූ 2022 දෙසැම්බර් 20 දින වන විටත් අදාළ ඉඩම මැනුම් කිරීම සඳහා ඉල්ලීම කිරීම පමණක් සිදුකර තිබුණි. තවද වැඩහල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ද්‍රව්‍යාධාර ලබාදුන් ප්‍රතිලාභීන්ගේ ඉදිකිරීම පිළිබඳ 2022 දෙසැම්බර් 20 දින සිදුකළ නියැදි පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 4 දෙනෙකු ඉදිකිරීම් නිම කර නොතිබුණි.	2022	අදාල බිම් කොටස් වෙන්කර ප්‍රතිපාදන උපරිම ඵලදායි ලෙස උපයෝජනය සිදුකල යුතුය.	මෙම ඉල්ලීම කඩිනමින් ඉටුකල නොහැකිබව මිනින්දොරු දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
6.	මොනරාගල දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආහාර මළු 30,283ක් බෙදාහැරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.3,513,127ක්	2023	ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ඒ සඳහා යෝග්‍ය බවට සහතික කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කලයුතුය.	අදාල නිර්ණායක අනුව ප්‍රතිලාභින් තෝරා ගැනීම සිදුකර ඇත.	ප්‍රතිලාභින් තෝරාගත් නිර්ණායක වල නිවැරදිතාවය විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

	වැයකර තිබූ අතර, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව ආහාර සුරක්ෂිතතාව අවම අඩු ආදායම්ලාභී පවුල් ඒකකයන් තෝරාගැනීම නිර්නායක 11ක් යටතේ සිදුකල යුතු බව දක්වා තිබුණි. ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී එක් එක් ප්‍රතිලාභියා සඳහා භාවිතා කල නිර්ණායක නිවැරදිව භාවිතා කර තිබේද යන්න තහවුරු කිරීම සඳහා සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීය.				
7.	සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අභාවයට යමින් පවතින සෙරමික් කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් 2014 වර්ෂයේ කොවුල්ආර සෙරමික් ගම්මානය ආරම්භකර තිබූ අතර, ජාතික ශිල්ප සභාවේ ග්‍රාමීය හා සම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන යටතේ 2021 හා 2022 වර්ෂවලදී ව්‍යාපෘති 06ක් සඳහා රු.4,187,281ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන	2023	ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හරහා පසු විපරම් සිදුකරමින් ප්‍රතිලාභීන් වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කලයුතුය.	කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් නම්කරන ව්‍යවසායකයකු සම්බන්ධ කර ගනිමින් ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	විටත් එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ඉහත අරමුණු ඉටු වී නොතිබුණි.				
8.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කල දින සිට වර්ෂ 02 ඉක්මවූ තැන්පතු නියාදනය කල යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07කට අදාල රු.49,099,014ක් වූ තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	වසර 02 ඉක්මවූ තැන්පතු හඳුනාගෙන නියාදනය කිරීමට කටයුතු කලයුතුය.	විවිධ හේතුන් මත රඳවාගෙන ඇත. ඉදිරියේදී නියාදනය කිරිමට කටයුතු කරමී.	නියාදනය කිරිමට කටයුතු කර නැත.
9.	වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අත්පත්කරගෙන තිබුණු ඉඩම් කැබලි 03ක් වෙනුවෙන් ප්‍රධාන තක්සේරුව ලැබෙන තෙක් ඉඩම් අත්පත් කර ගැනීමේ අත්තිකාරම් ලෙස රු.850,000ක් 2013 වර්ෂයේදී ප්‍රතිලාභීයෙකු වෙත ගෙවා තිබූ අතර 2014 දෙසැම්බර් 04 දින එම ඉඩම් කැබලි වල ප්‍රධාන තක්සේරු වටිනාකම රු.1,350,000ක් ලෙස තීරණය කර 2015	2023	මූල්‍ය අක්‍රමිකතා සිදු නොකල යුතු අතර වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අයකර ගතයුතුය.	දෙපාර්තමේන්තු පරීක්ෂණයක් පවත්වන අතර අවසන් වාර්තාව කඩිනමින් ඉදිරිපත් කරමී.	වසර 13 ක් ගතවී තිබුණත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නැත.

	පෙබරවාරි 09 දින 2013 වර්ෂයේ ගෙවූ අත්තිකාරම් මුදල අඩුකර නොගෙන සම්පූර්ණ තක්සේරු වටිනාකම වූ රු.1,350,000ක් ගෙවා තිබුණි. වැඩිපුර ගෙවූ රු.850,000ක මුදල අයකර ගැනීමට වැල්ලවාය දිසා අධිකරණයේ 2018 නොවැම්බර් 19 දින M11836 නඩුව පවරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 08ක් ගතවී තිබුණද, වැඩිපුර ගෙවා තිබූ රු.850,000ක මුදල අයකරගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව එම ගෙවීම් සිදුකල වගකිවයුතු නිළධාරීන්ගෙන් අදාල මුදල අයකරගැනීමට ද කටයුතු කර නොතිබුණි.				
10.	මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05කට අදාලව 1995 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දීර්ඝකාලීනව බදු වශයෙන් ප්‍රතිලාභීන් 30 දෙනෙකුගෙන් අයවිය යුතු රු.116,517,935ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	2023	අයවිය යුතු දීර්ඝකාලීන බදු මුදල් අයකරගැනීමට කටයුතු කලයුතුය.	බදු අයකර ගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර බදු ගෙවීම පැහැරහරින්නන්ගේ බදු අනුමැතිය අවලංගු කර ඉඩමේ අයිතිය රජය වෙත ලබා ගැනිමට කටයුතු කරමී.	2024 සැප්තැම්බර් 30 දිනට රු.98,780,125ක දීර්ඝකාලීන බදු මුදල් අයකර ගැනීමට ඇත.

11.	මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් මිල නියමකිරීමේ කමිටුව විසින් 2023 අගභාගය වෙනුවෙන් ඉහත කාර්යයට යොදාගත හැකි 2 WEEL හෝ 4 WEEL වාහන සපයා ගැනීමට මිලගණන් තීරණය නොකර ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරුවන් වෙත රු.21,960,000ක් ගෙවා තිබුණි. එම කාර්යයට යොදාගත හැකි තත්ත්වයේ පැවති බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2023 අගභාගය වෙනුවෙන් තීරණය කර තිබුණු මිලගණන් වලට අනුව කැබ්රථ යොදවා ගෙන තිබුණු වාර 572කට අදාල සත්‍යවශයෙන් ධාවනය කල කිලෝමීටර් 28,984ක් වෙනුවෙන් සියලු ගාස්තු ඇතුලත් කර ගෙවිය යුතු මුළු මුදල රු. 3,970,909ක් විය. ඒ අනුව මාසික පදනමින් වාහන සත්‍යවශයෙන් භාවිතා කල කිලෝමීටර ප්‍රමාණය සඳහා ගෙවීමට කටයුතු නොකර මාසික පදනමින් අසාමාන්‍ය රේටයක් ඇතුලත් කර ආර්ථිකමය භාවයකින් තොරව කටයුතු කරමින් රු.17,989,091ක අධි	2023	ධාවනය කර ඇති කිලෝමීටරය ක් සඳහා රු.758ක් ගෙවා ඇති අතර, අධි ඇස්තමේන්තු සකස්කර ඇත.නිවැරදිව ඇස්තමේන්තු සකස්කල යුතු අතර අධිගෙවීම් සිදුකිරීම සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළයුතුය.	දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් තීරණය කරන මිල ගණන් යොදා ගැනීමට නොහැක.	ධාවනය කර ඇති කිලෝ මීටරයක් සඳහා රු.758 ක් බැගින් ගෙවීම් කර ව්‍යාපෘතිය අවසන් කර ඇත.

	ගෙවීමක් සිදුකර තිබුණි.				
12.	මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 හි තෝරාගත් සමෘද්ධි ප්‍රතිලාභීන් 110ක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී වසර 08 සිට වසර 28ක් දක්වා කාලයක සිට සමෘද්ධි ප්‍රතිලාභ ලබමින් සිට තිබූ අතර, වර්තමානයේ අස්වැසුම ප්‍රතිලාභ හිමිකමද හිමිව ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඔවුන්ගේ දිළිඳුභාවය අවසන් කර ආර්ථිකය නගාසිටුවීම සඳහා රාජ්‍ය නිලධාරීන් මෙන්ම ප්‍රතිලාභීයාද අවධානය යොමුකර නොතිබුණි.	2023	ප්‍රතිලාභීන්ගේ ආර්ථිකය නඟා සිටුවීමට කටයුතු කලයුතුය.	එක් එක් පුද්ගලයාගේ පෞද්ගලික හේතුමත ආර්ථිකය නඟාසිටුවීමට නොහැකි වී ඇත.	සමෘද්ධි ප්‍රතිලාභින්ගේ ආර්ථිකය නඟාසිටුවීමට නොහැකි වී ඇත.

3.17 නුවර එළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,609,232,167	266,382,289	2,342,849,878	තත්ත්වාගණනය කළ
2022	2,673,297,155	210,511,673	2,462,785,482	තත්ත්වාගණනය කළ
2023	2,791,108,348	166,331,366	2,624,776,982	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	රජයේ නිවාස අදියර 1 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා රු.4,044,166 ක් වැය කර නිවාස ඉදිකිරීම කර තිබුණද එහි කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් 2022 මාර්තු වන විටත් භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	2021	අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරවා ගෙන ඉදිකිරීම් නිම කළ යුතුය.	දෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන ලබා ගැනීමට ඉදිරිපත් කළත් 2021 වර්ෂය සඳහා ලබා දී තිබුණේ මිලියන 05 ක ප්‍රමාණයකි. එබැවින් එම මුදලට සරිලන සේ බිම් මහලේ හැකිතරම් ප්‍රමාණයක් ඉදිකරන ලදී. 2022 වර්ෂයට ද මිලියන 05 ක් වෙන්කර ඇති බැවින් මෙම වර්ෂයේ ද බිම් මහලේ වැඩ නිමකර පළමු මහලේ කොටසක් ඉටු කිරීමට ඇස්තමේන්තු සකස්කර ප්‍රතිපාදන ඉල්ලා ඇති බව දන්වා ඇත.	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් ඉදිකිරීම් නිම කර නොතිබුණි.
2.	ආපදා සහන සේවා යටතේ නැවත පදිංචි කිරීමේ වැඩ සටහනේ ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා තිබුණද, කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ	2021	ව්‍යාපෘතිය සම්පූර්ණ කර එම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	නිවාස 98 න් 40ක් ගිවිසුමට අනුව එක් නිවසක ලක්ෂ 2 ක වැඩ සිදුකර ඇත. වතු නිවාස සමූපකාර සමිතිය සමගින් ගිවිසුම්ගත වී ඉදිකිරීම් ආරම්භකර	2024 සැප්තැම්බර් 30 දින දක්වා ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොතිබුණි.

	නායයෑම් නිසා නැවත පදිංචි කළ යුතු පවුල් 105 ක් වෙනුවෙන් නිවාස 105 ක් ඉදිකිරීම සඳහා රු. 126,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටද ඉදිකර නොතිබුණි.			ඇත. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	
3.	2022 මැයි 04 දිනැති අංක DMC/Miti/Pro/NuwaraEliya/2021/01 දරන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් වලපනේ ගංගාරගොල්ල ගමෙහි ගල් පෙරලීමේ අවධානම අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට කටයුතු කර තිබුණු අතර, උක්ත ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.18,912,660ක් ගෙවා තිබුණද, ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන ලද අරමුණ හා ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	2022	ප්‍රතිපාදන ලබාගෙන විධිමත් අධීක්ෂණයක් තුලින් වැඩ නිම කර ගැනීමට කටයුතු කළ යුතුය. .	කර්මාන්තය සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනාවක් අදාල අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින දක්වා ව්‍යාපෘතිය අවසන් කර නොමැත
4.	නාය යෑමේ අධි අවදානම් කලාපයක් ලෙස 2017 වර්ෂයේ හඳුනාගෙන තිබුණු අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හැටන්,	2023	අදාල ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර පදිංචි කිරීමේ කටයුතු අවසන් කළ යුතුය.	ඉවත් කිරිමට යෝජිත පවුල් සමඟ සාකච්ඡා කොට අවදානම් ස්ථානයෙන් ඉවත් කිරීම සහ ඉදිකරන නව නිවසේ පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු මේ වන	2024 සැප්තැම්බර් 30 දක්වා පදිංචි කිරීම් සිදු කර නොමැත

	සමනලගම ස්ථානයේ පවුල් 12 ක් එද ස්ථානයෙන් ඉවත් කිරීමට තීරණය කර ඉන් පවුල් 06 ක් සඳහා රජයේ ඉඩමක රු.6,300,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 06 ක් ගත වී ඇතත් ඉදාකිරීම් කටයුතු අවසන් නොකර අතරමග නවතා තිබුණි.			විට සිදුකරමින් පවතින බව.	
5.	ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දොඩම්කුඹුර ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය සුරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා 2020 අගෝස්තු 31 දින රු 940,500.ක් හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වැයකර තිබුණද , සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	2023	වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය.	අඩුපාඩු නිවැරදි කර ගනිමින්අලුත් වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව	2024 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සකස් කර නොතිබුණි.
6.	රජය ලබාදෙන රුපියල් ලක්ෂ 04ක මුදලින් ප්‍රතිලාභියා විසින් මිලදී ගන්නා ඉඩමක රජය විසින් ලබාදෙන මුල්‍යාධාර මත නිවාසයක් ඉදිකිරීමේ	2023	අවදානම් ප්‍රදේශවලින් පදිංචි කරුවන් ඉවත් කර නැවත පදිංචි කිරීම කඩිනම් කල යුතුය.	ආපදා අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාල තොරතුරු යොමු කර ඇති බව.	ආරක්ෂිත ස්ථාන වල පදිංචි කිරීම 2024 සැප්තැම්බර් 30 දින දක්වා සිදු කර නොතිබුණි.

	අවස්ථාව යටතේ , ආපදා සහන සේවා ඒකකය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05ක අවදානම් ලෙස හඳුනාගත් පවුල් 159 ක් සඳහා නිවාස ඉදිකර නැවත පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද , ඉන් පවුල් 115ක් එසේ නැවත පදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම රජය විසින් ලබාදෙනු ලබන ඉඩමක රජයේ මුල්‍යාධාර වලින් නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ, ආපදා සහන සේවා ඒකකය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පවුල් 970ක් වර්තමාන පදිංචි ස්ථානයෙන් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද, ඉන් පවුල් 798 ක් ආරක්ෂිත ස්ථානයන්හි ස්ථාන ගත කිරීමට කටයුතු කර නොතිබුණි.				
7.	අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යෑම් හා අධි අවදානම් තත්ත්වයන් හේතුවෙන් 2019 වර්ෂයේ ඉවත් කරනු ලැබූ පවුල් 04 කට කළුගල මිල්ලගහමුල ප්‍රදේශයේ ඔවුන් විසින් මිලදී ගත් ඉඩමක නිවාස ඉදිකිරීම සහ ඉඩම මිලදී ගැනීම	2023	අවදානම් ප්‍රදේශවලින් පදිංචි කරුවන් ඉවත් කර නැවත පදිංචි කිරීම කඩිනම් කල යුතුය.	ඉදිකිරීම්වල ප්‍රගතිය අනුව වාරික නිදහස් කිරීම තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ සිදුකරන බව.	2024 සැප්තැම්බර් 30 දින දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

	සඳහා රු.2,700,000 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් මූලික අදියරේ පැවති අතර ප්‍රගතිය සියයට 30 ක පමණ පහල මට්ටමක පැවතුණි.				
8.	ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාතිය යටතේ 2018 වර්ෂයේදී හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.6,900,000 ක් වැයකර බීජ බෝංචි ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් හා ශිතාගාරයක් ඉදිකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුණු ගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	2023	ව්‍යාපෘති අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපාති සැලසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිම කල යුතුය.	වර්තමාන බිජ බෝංචි මිල හමුවේ ප්‍රතිමිලදී ගැනිමක් සිදු කිරිමට අවශ්‍ය නොවූ බවත්, අනාගතයේදී බීජ බෝංචි මිල අස්ථාවර වුවහොත් එවන් අවස්ථාවක අවම වශයෙන් බීජ බෝංචි කිලෝ 10000 ක් මිලදී ගැනීමට කටයුතු කරන බව.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී.
9.	තලවාකැලේ හා නුවරඑළිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනයේ දක්වා ඇති වැඩිහිටි , ආබාධිත හා වකුගඩු දීමනා ඉල්ලුම්කරුවන් 881දෙනෙකුට දීමනා ලබා ගැනීමට පැමිණෙන ලෙස නිලධාරීන් විසින් නිසි පරිදි දැනුවත් කිරීම සිදු නොකර නොසැලකිල්ලෙන් හා අනවධානයෙන්	2023	සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ට දීමනා ගෙවීමට කටයුතු කළ යුතු අතර, අදාළ දීමනා නොගෙවූ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	නිලධාරි හිඟය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වි ඇති බව.	2024 සැප්තැම්බර් 30 දක්වා නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

කටයුතු කර 2023 ජූලි හා අගෝස්තු මාස වලට අදාල රු.8,810,000 ක දීමනා අදාල ප්‍රතිලාභීන්ට ගෙවා නොතිබුණි.

3.18 පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,898,814,757	553,195,622	2,345,619,135	තත්ත්වාගණනය කළ
2022	2,994,112,902	426,000,766	2,568,112,136	තත්ත්වාගණනය නොකළ
2023	3,068,106,751	330,999,040	2,737,107,711	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	**වාර්තා වූ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය**
1.	ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 04 ක ගැමිදිරිය ජනතා සමාගම් 74 කින් 49 ක් අක්‍රීය බවට තොරතුරු වාර්තා වී ඇති අතර, එම සමාගම් වලට අයත් බැංකු ගිණුම්වල රු.24,728,866 ක මුදලක් නිශ්කාර්යව පැවතුණි.	2022	සමිති ක්‍රියාකාරි මට්ටමින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර, අවශ්‍ය තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගත යුතුය.	අක්‍රීය සමිති වල අරමුදල් සක්‍රීය සමිති වෙත මාරු කිරීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
2.	2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව රජයේ ඉඩම්වල ඛණිජ ද්‍රව්‍ය කැණීම්වලට අදාල ගාස්තු වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා අයවිය යුතු රු.මිලියන 137.54 ක මුදලක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය	2023	ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම.	පිළිගෙන ඇත.	2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ හිඟ ගාස්තු අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

	ලේකම් කොට්ඨාශ 04 ක පවත්වාගෙන ගිය බලපත්‍රලාභී කළුගල් වැඩපොළවල් 40 කින් අයකරගෙන නොතිබුණි.				
3.	2021 යල කන්නයේ දී පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් හරහා ගොවීන් වෙතින් වී මිලදී ගෙන, මිලට ගත් වී තොග සහල් කර නැවත රජය වෙත භාර දීමේ වැඩසටහනේදී දිඹුලාගල, තමන්කඩුව, ලංකාපුර, ඇලහැර හා හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මිලට ගන්නා ලද වී සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ 2021 ජූලි 22 දිනැති අංක DFD/Paddy/2021-3 චක්‍රලේඛයේ 7(1) වගන්තිය ප්‍රකාරව රු.මිලියන 215 ක් වටිනා සහල් කිලෝ මිලියන 2.18 ක් රජයට ලබාදීමට වී මෝල් හිමියන් විසින් කටයුතු කර නොතිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රටේ පැවති ආර්ථික ගැටළු තත්වයන් හමුවේ වී කෙටීම ගිවිසුම්ගත මිලට කළ නොහැකි බව වී මෝල් හිමියන් පවසා සිටි අතර, කෙසේ වුවද වී මෝල් හිමියන් වෙතින් හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත.	2024 අගෝස්තු 31 දිනට තවදුරටත් අයකර ගත යුතු හිඟ මුදල රු. මිලියන 188.73 ක් විය.
4.	2021 යල කන්නයේදී සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් 19 ක් හරහා ගොවීන් 294 ක් මඟින් වී ලබා නොගෙන, වී ලබාගත් බවට අධීක්ෂණ කටයුතු	2023	විධිමත් පරීක්ෂණයක් පවත්වා විනයානුකූල පියවර ගත යුතුවීම.	නිලධාරීන් විසින් වංචනික ක්‍රියාවන් සිදු කර නොමැති බවත්, ගොවීන්ට ව්‍යාජ මුදල් ගෙවා නොමැති බවත් දන්වා සිටින අතර, මේ සම්බන්ධව විධිමත්	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	භාර සංවර්ධන නිලධාරීන් මඟින් අදාළ ආකෘති පත්‍ර සකස් කර, වී සඳහා රු.මිලියන 87.46 ක් හා ඇසුරුම් මලු හා වියලුම් කුලී ලෙස රු.මිලියන 7.68 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් මඟින් ගෙවීම් කර තිබුණි.			පරීක්ෂණයක් පවත්වා විනයානුකූලව පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.	
5.	පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීම සඳහා අදියර 02 ක් යටතේ ගිවිසුම්ගතව 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 1,030.84 ක් වියදම් දරා තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කරවා ගැනීම සඳහා දෙවන අදියර සඳහා සැපයුම්කරුවකු තෝරා ගැනීම ප්‍රසම්පාදනයෙන් බැහැරව සිදුකර තිබුණද අපේක්ෂිත ඉදිකිරීම් කාලය අවුරුදු 05 කින් ප්‍රමාද වී තිබුණි.	2023	ව්‍යාපෘතිය ඉටුකිරිමේදි ආර්ථිකමය, කාර්යක්ෂමව, ඵලදායි ආකාරයට අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය.	මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සිදුකර ඇති බවත්, II වන අදියර 2020/2021 වර්ෂවලදී ඇති වූ කොවිඩ් වසංගතය නිසා මන්දගාමීව සිදු වී ඇති බවත් දන්වා ඇත.	2024 නොවැම්බර් 21 දිනය වන විටත් ඉදිකිරීම් කටයුතු නිම වී නොතිබුණි.
6.	පිබිදෙමු පොළොන්නරුව රජරට නවෝදය සංවර්ධන වැඩසටහන යටතේ රු.මිලියන 1,303.86 ක කොන්ත්‍රාත් වටිනාකමට පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක	2023	ගොඩනැගිල් ලේ ඉදිකිරීම් නිමකර ඵලදායිව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.	2018 දෙසැම්බර් 15 දින ව්‍යාපෘතිය අවසන් වීමට නියමිතව තිබුණ ද, එය 2021 සැප්තැම්බර් 30 දක්වා කාලය දීර්ඝ කර ඇති නමුත් අරමුදල් නොමැති වීම මත ඉදිකිරීම් නතර වී ඇති බව දන්වා ඇත.	දැනට මෙම ගොඩනැගිල්ල තුළ අවම පහසුකම් යටතේ ආයතන පහක් ස්ථාපිත කර ඇති නමුත් අත්‍යවශ්‍ය ඉදිකිරීම් අවසන් වී නොතිබුණි.

කාර්යාංශය වෙත 2016 දෙසැම්බර් 15 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර, එම ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 15 දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඉදිකිරීම් අවසන් කර භාර දී නොතිබුණි.

3.19 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,919,898,037	246,271,475	2,673,626,562	තත්ත්වාගණනය කළ
2022	2,952,014,921	169,032,596	2,782,982,325	තත්ත්වාගණනය කළ
2023	3,146,527,012	54,312,676	3,092,214,336	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම නගර සීමාව තුළ පිහිටි රූඩ් 02 යි පර්චස් 22 කින් යුත් අශෝක සිනමාහල පිහිටි ඉඩම 2014 වර්ෂයේ සිට නව බදුකරු වෙත වසර 30ක් සඳහා බදු ලබාදී තිබූ අතර, 2011 වර්ෂයේ සිට 2021 දක්වා අයවිය යුතු එකතුව රු.25,000,000 ක් වූ බදු මුදල් කපාහැර තිබුණි.	2023	රජයට අයත් ඉඩම් බදු ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු බදු ආදායම අයකර ගැනීමට කටයුතු කළයුතුය.	බදු මුදල් කපා හැරීමට ඉඩම් ඇමතිතුමාගේ අනුමැතිය 2021 අගෝස්තු 18 දින ලැබී ඇති බව 2021 අගෝස්තු 19 දින ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/10/12226 ලිපිය මගින් දන්වා ඇත. මෙම බදු කපා හැරීම පිළිබඳ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කරමි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
2.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මඟපෙන්වීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බොරළු කියුබ් එකක ස්ථානීය මිල (පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල	2021	වැඩිපුර ගෙවීම් කරන ලද මුදල අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ පළමු අර්ධය සඳහා මිල කමිටුව පවත්වා මිල ගණන් නිශ්චය කල අතර මෙම ව්‍යාපෘති පළාත් පාලන ආයතන මගින් සිදු කල අතර ඔවුන් පළාත් මිල කමිටු වාර්තා භාවිතා කරන බැවින් ද පළාත් මිල කමිටු වල අගයන් දිස්ත්‍රික් මිල	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	කමිටුවේ ස්ථානීය මිල භාවිතා කර තිබුණු ද , පුත්තලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක / (1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බොරළු කියුබ් එකක් පැටවීම හා රාජ්‍ය භාගය ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා භාවිතා කරන ලද බොරළු ඝන මීටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් භාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුවී තිබුණි.			ගණන්වලට වඩා අඩු බැවින් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඇස්තමේන්තු මත ව්‍යාපෘති ඉටුකිරීමට කොන්ත්‍රාත්කරුවන් ප්‍රතික්ෂේප කළ බැවින් පළාත් මිල ගණන් යොදා ගන්නා ලෙස දැන්වුවද ලිඛිතව නොමැත. ඒ අනුව වැඩිපුර ගෙවීමක් සිදුවී නැත.	
3.	කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සෞභාග්‍යා සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ 2021 හා 2022 වර්ෂවල එකතුව රු.6,837,484 වැයකර ඉදිකර තිබූ කන්දකුලිය අගය එකතු කල කරවල නිෂ්පාදන ගම්මානය 2023 දෙසැම්බර් 31 දින වනවිට ද කරවල වේලීමෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. එසේම දැල් වැට	2023	ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළයුතුය.	රට තුළ පැවති අයහපත් ආර්ථික තත්ත්වයෙන් මෙම ව්‍යාපෘතිය මේවන විට අක්‍රීය මට්ටමේ පවතින අතර අදාල සමිතිය සමඟ මේ වනවිට සාකච්ඡා පවත්වා ඇත. තීන්ත ආලේප කර අවශ්‍ය උපාංග සවිකර තිබුණද ක්‍රීඩාපිටියට පැමිණෙන පිරිස් අනවසරයෙන් ඇතුල් වී විනාශ කර ඇත. දැනට අඩුපාඩු නිවැරදි කර ඇත. ගේට්වැල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	සඳහා යොදා තිබූ 25 mm GI බටවල නිසි පරිදි තීන්ත ආලේප කර නොතිබීම හා බට සම්බන්ධ වන ස්ථානවලට යොදා තිබූ PVC කොටස් ගැලවී ගොස් තිබූ බැවින්, බට තුලට ජලය යාම නිසා බට මළබැඳ තිබුණි. එසේම රු.50,000 ක් වැය කල ගේට්ටු පියන් දෙක හා රු.113,388 ක් වැයකල ජලනල උපකරණ කඩා දමා විනාශ කර තිබුණු අතර රු.29,850 ක් ගෙවා තිබූ අඟල් 1 ½ PVC Gate value 25 ක් සවිකර නොතිබුණි.			භාරයේ තබා ඇත.	
4.	ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැඟිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ශේෂ කර තිබූ අතර, බේරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි.	2021 2022 2023	14 වන බිල්පත ගෙවීම ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු නොකිරීමෙන් පොලී ගෙවීමට සිදුවී තිබූ බැවින්, ඒ පිළිබඳ වගකීම් නිශ්චය කළයුතුය.	ඉදි කිරීමේ පැවති අඩුපාඩු මත එවකට සිටි නිලධාරීන් විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියා කර ඇත. ඒ අනුව, ආරවුල් විනිශ්චය මණ්ඩල ක්‍රියාවලිය, බේරුම්කරණ ක්‍රියාවලියට යාම හේතුවෙන් මෙම ගෙවීම් ප්‍රමාද වූ අතර බේරුම්කරණයේ තීරණය අනුව මෙම ගෙවීම් සිදු කරන ලදී. එම නිසා මෙම ප්‍රමාද පොලී ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට සිදුවිය.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

5.	පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වර්තමාන තක්සේරු වටිනාකම රු.255,800,000 ක් වූ නිල නිවාස 08 පිහිටි අක්කර 01 යි රූඩ් 02 යි, පර්චස් 14.7 ක් වූ ඉඩම පුත්තලම නගර සභාව විසින් ඉදිකරනු ලබන ඇල්ෆා වෙළඳ සංකීර්ණය හා එහි රථවාහන අංගනය සඳහා පුත්තලම නගර සභාවට පවරා ගෙන ඒ වෙනුවට පුත්තලම ඩිපෝව අංගනය අසල නගර සභාවට අයත් ඉඩමෙන් අක්කර 01 ක් ලබාදී, නිල නිවාස 08 හි වර්තමාන තක්සේරු වටිනාකමට සමාන නිල නිවාස 04 ක් ඉදිකිරීමට අවශ්‍ය මුදල් දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදීමට එකඟතාවය ලබාගෙන තිබුණ ද, පුද්ගලයින්ට පදිංචියට සුදුසු තත්ත්වයේ ඇති මෙම නිල නිවාස 08 න් 04 ක් තක්සේරු කිරීමටත් පෙර කඩා ඉවත් කර තිබුණ ද, 2024 මාර්තු වන විටත් ඉඩම පැවරීමේ කටයුතු අවසන් කර නොතිබුණු අතර තීරණය කරගත් පරිදි නිල නිවාස 04හි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර	2021 2022 2023	ප්‍රමාදයකින් තොරව ඉඩම් ලබාගෙන සැලසුම් කල පරිදි කටයුතු කළයුතුය.	2023 ජූනි 07 දින අදාළ පාර්ශව සමග විශේෂ සාකච්ඡාවක් පවත්වා ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන තීරණ ගෙන ඇත. නව නිල නිවාස 04 ඉදිකිරිමට අවශ්‍ය ඇස්තමේන්තු 2023 සැප්තැම්බර් 20 පුත්තලම නගර සභාවේ ලේකම් වෙත යොමු කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

නොතිබුණි.

6.	ග්‍රාම ශක්ති පලමු සහ දෙවන අදියර යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අයත් සමිති 166න් සමිති 121 ක් අක්‍රීයව පවතින අතර මෙම සමිතිවල 2023 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.102,385,768 ක මුදල් ශේෂයක් නිශ්කාර්යව පැවතුණි.	2021 2022 2023	ව්‍යාපෘතියේ අපේක්ෂිත පරමාර්ථ ඉටුවන ආකාරයට කටයුතු කළයුතුය.	වර්තමානය වන විට සෞභාග්‍යා සංවර්ධන කාර්යංශය යටතේ ග්‍රාම ශක්ති සමිති ක්‍රියාකාරිත්ව මෙහෙයවන අතර අක්‍රිය ග්‍රාම ශක්ති සමිති සතු අරමුදල් සක්‍රිය සමිති වෙත ලබාදී ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩ සටහන් ශක්තිමත් කිරිමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි.	ග්‍රාම ශක්ති සමිතීන්හි කාර්තුමය ප්‍රගතිය 2024 ඔක්තෝම්බර්04 දිනට යාවත්කාලීන කර එවන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට දන්වා යැවීම පමණක් කර තිබුණි.
7.	ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බත්තුළුඔය, සෙංගල් ඔය සහ සුරුවිල යන ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යන අනවසර ඉස්සන් ගොවිපලවල් 22 ක් සහ වර්තමානය වනවිට අක්‍රීය තත්ත්වයේ පවතින ගොවිපලවල් 04 ක් පිළිබඳව තොරතුරු වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2019 හා 2020 වර්ෂවලදී යොමු කර තිබුණ ද, එම අනවසර ඉස්සන් ගොවිපලවල් විගණිත දිනවන 2022 ජනවාරි 14 දින වන විටත්, නවතා දැමීමට කටයුතු කර නොතිබුණි. තවද, මෙම	2021	කාර්යක්ෂමව ක්‍රියාමාර්ගගත යුතුය.	මේ වන විට මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී	42/2019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කටයුතු කිරීමට දන්වා යවා ඇති නමුත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ඉස්සන් ගොවිපලවලින් බදු මුදලක් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
8.	2019 - 2021 කාලය තුළ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදී ගැනීමට 2020/21 මහ හා 2021 යල කන්නවලදී ආණමඩුව, නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වී මෝල් හිමියන් 20 දෙනෙකු වෙත ලබාදුන් මුදල්වලින් ලංකා ස.තො.ස. වෙත 2022 මාර්තු 15 දිනට ලැබිය යුතු සහල් කිලෝග්‍රෑම් 1429338 ක් වෙනුවෙන් රු.111,208,565 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණු අතර, රජයේ උක්ත පරමාර්ථය වූ ගොවියාගේ අතිරික්ත වී තොගය සාධාරණ මිලකට ලබා ගැනීම හා සතොස මගින් පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට සහල් ලබාදීම යන	2021 2022 2023	මුදල් අයකර ගැනීමට කාර්යක්ෂමව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	ලබාදිය යුතු සහල් වල මූල්‍ය අගය රජයට ගෙවන ලෙස ලබා දුන් තීන්දුව මත කොටස් වශයෙන් මුදල් ගෙවීම සිදුකල අතර 2024 අප්‍රේල් 30 දින වන විට තවදුරටත් අයවිය යුතු මුදල රු.106,773,565.39න් එම මුදල අයකර ගැනිම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි.	නිර්දේශ පරිදි අයකිරීම් සඳහා කාර්යක්ෂම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	පරමාර්ථ ඉටුවී නොතිබුණු අතර රජයේ මුදල් අවභාවිතයට හා අයථා පරිහරණයට ඉඩහැර තිබුණි.				
9.	දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ 2021 පෙබරවාරි 25 දිනැති ලිපියට අනුව කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීගේ නිර්දේශය නොසළකා ගොවිජන සේවා කාරක සභා විසින් සකස් කර ඇති පොහොර නාම ලේඛන ඇසුරෙන් වගාකල කුඹුරු අක්කර ගණන නිෂ්චය කර ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් හට දන්වා තිබුණ ද, නවගත්තේගම හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් එම අවශ්‍යතාවය ඉටුනොකර 2021 යල කන්නයේ දී පොහොර නාම ලේඛනවල නම සඳහන් නොවූ පුද්ගලයින් 142 දෙනෙකුගෙන් වී කිලෝ 710,000 ක් සඳහා මිලදී ගත් බවට ලේඛන සකස් කර රු.31,240,000 ක් ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	මෙම වී මිලදි ගැනිමේ වැඩසටහන ක්‍රියාත්මක වන අවස්ථාවේ කෘෂි පර්යේෂණ නිලධාරින් වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළැඹීම නිසා පොහොර නාම ලේඛනය පරික්ෂා කර වී මිලදි ගැනිමට උපදෙස් දුන්නද කඩිනමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කල යුතුව පැවතිම හේතුවෙන් එවකට සිටි කෘෂිකර්ම අධ්‍යක්ෂක විසින් වී සපයන තැනැත්තන්ගෙන් තමා ගොවියකු බව ප්‍රකාශ කරන ලද ලිපියක් ලබාගෙන වි මිලදි ගන්නා ලෙස වාචිකව ප්‍රාදේශිය ලේකම්වරුන්ට උපදෙස් ලබා දීම හේතුවෙන් ඒ අනුව ක්‍රියා කර ඇත.	චක්‍රලේඛය අනුව කටයුතු කර කොතිබුණි.

10.	2021 යල කන්නයට අදාල වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ගොවි නාම ලේඛනයේ නම් සඳහන් ගොවීන් 11 දෙනෙකු විසින් ලබාදුන් ලිඛිත ප්‍රකාශවලට අනුව කිසිදු වී ප්‍රමාණයක් වී මෝල් හිමියන් වෙත ලබාදී නොතිබිය දී වී කිලෝ ග්‍රෑම් 55,000 ක් සඳහා රු.2,420,000 ක් ගොවීන්ගේ ගිණුම්වලට බැරවූ පසු එම මුදල ගොවීන් විසින් මෝල් හිමියන් වෙත ලබා දී තිබුණි. තවද නවගත්තේගම කොට්ඨාසයේ ගොවීන් 14 දෙනෙකුගෙන් වී කිලෝ ග්‍රෑම් 5000 බැගින් එකතුව කිලෝ ග්‍රෑම් 70,000 ක් ලබාගත් බවට පත්‍රිකා සකස් කරමින් ගොවීන්ගේ ගිණුම්වලට රු. 3,180,000 ක් බැරකර තිබුණද, ගොවීන්ගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශවලට අනුව ඔවුන් ලබාදී තිබුණේ වී කිලෝ ග්‍රෑම් 28000 ක් පමණක් වූ අතර වෙනස වූ වී කිලෝ ග්‍රෑම් 42000 ක මුදල වන රු.1,848,000 ක් මෝල් හිමියන් විසින් ගොවීන්ගෙන් ආපසු ලබාගෙන තිබුණි.	2023	වක්‍රලේඛ උපදෙස් පරිදි බලධාරීන් විසින් නිසි අධීක්ෂණය කරමින් කටයුතු කළයුතුය.	වී මිලදි ගැනිමේ ක්‍රියාවලිය තුල වංචාවක් හෝ වැරදිමක් සිදු නොවන ආකාරයට සියළුම කටයුතු සැලසුම් කල අතර එම කටයුතු හොඳින් අධීක්ෂණය කිරීම සඳහා කෘෂිකර්ම අංශයේ සංවර්ධන නිලධාරීන්ට අමතරව අදාළ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන නිලධාරීන්ට වී මිලට ගන්නා අවස්ථාවල වී මෝල තුල රැදී සිටින ලෙසට උපදෙස් ලබා දී තිබුණි. ඔවුන්ද එලෙස කටයුතු කර තිබුණි. වී මිලදි ගැනිමේදී මිලදි ගත් ප්‍රමාණ තහවුරු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ආකෘති පත්‍ර 03 ක් හඳුන්වා දි තිබුණි. ඒ අනුව එක් එක් ආකෘති පත්‍රය නිවැරදිව පුරවා සකස් කිරීමට නිලධාරීන්ට රාජකාරි පවරා දි තිබුණි. එලෙස ලැබෙන ලියවිලි වල නිරවද්‍යතාවය තහවුරු කරගෙන ප්‍රාදේශිය ලේකම් විසින් ගෙවීම් කටයුතු කරන ලදි.ඒ අනුව ව්‍යාජ බලපත්‍ර සැකසීම අදාළ පාර්ශව සන්ධානගතව සිදුකර තිබුණා විය හැකි නමුත් අදාළ වී ප්‍රමාණය මෝලට භාරදුන් බවට අදාළ ගොවියන් විසින් අදාළ ආකෘතිපත් අත්සන් කර ලබා දි	නිසි අධීක්ෂණයක් සිදු කර විධිමත් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

				ඇත.මේ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි මේ වන විට අවධානය යොමුකර ඇත.	
11.	පුත්තලම හා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021 වර්ෂයේ දී සැලසුම් කර තිබුණු රු.69,629,383 ක් වූ ව්‍යාපෘති 46 ක ප්‍රගතිය සියයට 20 - 25 ත් අතර, පරාසයක වූ අතර, ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අතරමඟ නවතා දමා තිබුණි.	2021	අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන සැලසුම් කල පරිදි ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කළයුතුය.	එකඟ වෙමි.	සැලසුම් කල පරිදි ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.
12.	වෙන්නප්පුව ජෝෂප්වාස් විද්‍යාලයේ ක්‍රීඩාගාරයේ වහලය සකස් කිරීමට 2014 වර්ෂයේ දී රු.48,638,504 ක් වැයකර තිබුණ ද, 2022 වර්ෂය වනවිට ද, ක්‍රීඩාගාරය ප්‍රතිලාභයක් නොලබා අසම්පූර්ණ ව්‍යාපෘතියක් ලෙස පවතින බව නිරීක්ෂණය විය.	2021	ඉදිකිරීම ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.	රේඛීය අමාත්‍යාංශ යටතේ ප්‍රතිපාදන සැලසූ මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ශක්‍යතා අධ්‍යනය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කල යුතු අතර පුත්තලම දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කරන ලද්දේ ලබාගත් ඇස්තමේන්තුවට අනුකූලව ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කිරීම පමණි.	වැඩ නිමි නොමැති බැවින්, ප්‍රයෝජනයට ගත නොහැකි වී ඇත.

3.20 රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,305,907,126	314,449,608	1,991,457,518	තත්ත්වාගණනය කළ
2022	2,444,476,229	182,174,408	2,262,301,821	තත්ත්වාගණනය කළ
2023	12,693,035,425	101,169,419	12,591,866,006	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ රු.2,000,000 ක් බැගින් දින 68 තුල ඉදිකිරීමේ පදනම මත 2017 ඔක්තෝබර් 25 දින ගිවිසුම්ගත පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව ගල්ලින්න හා මොරතොට නිල සෙවන කාර්යාලය ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ විෂයයන් 16 කට අදාලව රු. 567,269 ක් වූ වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2022 පෙබරවාරි 02 වන විටත් පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021	මුදල් රෙගුලාසි 156 (i) ප්‍රකාරව වැඩිපුර ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	විමර්ශන නිලධාරී කණ්ඩායමක් මගින් මේ පිළිබඳව කරුණු සොයා බලන ලදී.	විමර්ශණ කටයුතු නිම කර වැඩිපුර ගෙවීම් අයකර නොතිබුණි.
2.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලි පරිපථ පුවරුව ගිනි	2022	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ.	මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු වෙමින් පවතී.	විෂයභාර අමාත්‍යාංශය විසින් 2024 ජූලි 11 දිනැති

	ගැනීමෙන් රු.4,143,204 ක හානියක් සිදු වී 2023 මාර්තු මාසයට මාස 14 ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි 104 පරිදි වගකීම නිශ්චය කර හානිය ප්‍රතිපූරණය කර ගැනීමට ඇති හැකියාව සොයා බලා නොතිබුණි.				ලිපියෙන් ස්වාධීන පරීක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර පරීක්ෂණ කටයුතු නිම කර නොමැත.
3.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලක පවත්වා ගෙන යන ආපන ශාලාවෙන් හා සුභසාධන වෙළඳසැලෙන් 2013 - 2022 වර්ෂ අතර කාලය තුළ ලද ගොඩනැගිලි කුලී රු. 2,671,760 ක් සුභ සාධන සංගමයක් වෙත ලබා දී තිබුණි. මෙම කුළී ගාස්තු රජයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර රජයේ ගොඩනැගිල්ලකින් උපයන කුළී ආදායම් සුභ සාධක සංගමයකට ලබා දීමට පවතින නෛතික හැකියාව සනාථ කරගත නොහැකි විය. එමෙන්ම, කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව 2020 වර්ෂයේ සිට මේ දක්වාම එකම කොන්ත්‍රාත්කරු විසින් ආපනශාලාව පවත්වා ගෙන යන අතර, ඔහු	2022	රජයේ ආදායම් නොපමාව අයකර ගත යුතු වේ.	2023 මාර්තු මස සිට අදාළ කුලිය අය කර රජයේ ආදායමට බැර කිරීමට පියවර ගැනීම.	2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අතර කාලය තුළ ආපනශාලාව හා සුභසාධන වෙළෙඳසැල වෙතින් අය කරන ලද කුලිය රජයේ ආදායමට බැර කර නොතිබුණි.

	විසින් 2022 හා 2023 වර්ෂ සඳහා රු. 60,533 ක ජල බිල්පත් ද, සුභසාධන වෙළඳසැලෙන් රු.35,459 ක විදුලි බිල්පත් ද පියවා නොතිබුණි.				
4.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 38 න් නිවාස 07 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අභාවිතව තිබීම නිසා එම නිවාස කැලෑවෙන් වැසී පැවති අතර දොර ජනෙල් සොරුන් රැගෙන ගොස් තිබුණි. එම නිවාස මත්ද්‍රව්‍ය ඇතුළු විවිධ දුරාචාර සඳහා භාවිතා කරන අතර අනවසරකරුවන් පදිංචි වීමේ අවදානමක් ද පැවැතිණි. නිවාස පොරොත්තු ලේඛනයේ සිටින නිළධාරීන් 77 දෙනෙකුට රජයේ නිවාස ලබා ගැනීමේ ප්‍රමාදයක් ද මේ නිසා පැවැතිණි.	2023	වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ.	ප්‍රතිපාදන ලැබී නොමැති බැවින් මෙම නිවාස අළුත්වැඩියා කිරීමට නොහැකි වී ඇති බව.	නිවාස 04ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.
5.	රු.25,850,000 ක වියදමින් ඉදිකළ නිවාස 22 ක ගොඩනැගිලි අයදුම්පත්, 2017 වර්ෂයේ සිට මේ දක්වා කුරුවිට ප්‍රාදේශීය සභාව මඟින් අනුමත නොකිරීම නිසා යළි පදිංචි කිරීමේ කටයුතු අවසන් කළ නොහැකි වී තිබුණි.	2023	අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබා ගත යුතු විම.	මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව	නිර්දේශය ක්‍රියාත්මක වී නොමැත.

6.	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක ක්‍රියාත්මක සමෘද්ධි බැංකු 36 ක් විසින් ලබා දුන් ණය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට මාස 09 ට අඩු කල් පසු වූ ණය සහ මාස 09 ට වැඩි බොල් ණය පිළිවෙලින් රු.357,478,987 සහ රු.208,148,406 ක් විය.	2023	බොල් ණය හා කල් පසු වූ ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මඟින් දැනුවත් කර අයකර ගැනීම් සිදු කිරිම. සිහි කැඳවීමේ ලිපි නිකුත් කිරිම. සමථ මණ්ඩල සඳහා යොමු කිරිම. එන්තරවාසි යැවීම සහ අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමු කිරිම. ප්‍රාදේශීය ලේකම් මගින් ලිපි යොමු කිරිම.	සමස්ථ හිඟ ණය මුදල අය කර නොතිබුණි.

3.21 ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,673,916,770	113,754,422	1,560,162,348	තත්ත්වාගණනය කළ
2022	4,034,187,197	46,574,794	3,987,612,403	තත්ත්වාගණනය කළ
2023	5,621,286,938	31,609,633	5,589,677,305	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	සේරුවිල සහ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි අඩු ආදායම්ලාභි ආබාධිත පුද්ගලයින් සඳහා රුපියල් 5000 දීමනාව ලබා දීමේදී අදාල ප්‍රතිලාභීන් තෝරා ගැනීම චක්‍රලේඛයේ විධි විධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී පුද්ගලයින් 178 ක් සඳහා අවස්ථා 2,124 කදී එකතුව රුපියල් මිලියන 10.62 ක දීමනාවක් ගෙවා තිබුණි.	2021	චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	ප්‍රතිලාභීන් තෝරා ගැනීම චක්‍රලේඛ විධිවිධාන, ග්‍රාමීය කමිටු හා ග්‍රාම නිලධාරීන්ගේ නිර්දේශ මත සිදු කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
2.	2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021 ලිපියේ 2.4 ඡේදය අනුව විවිධාංගීකරණය වූ අයවැය අරමුදල් සැපයීම හා බෙදාහැරීම ප්‍රාදේශීය ලේකම්	2021	චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි අනුගමනය කළ යුතුය.	මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ **MF/NPD/01/2021** අනුව කටයුතු කර ඇත. විගනණයෙන් පෙන්වා දුන් පරිදි 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක MFNPD/07/2021	චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි අනුගමනය කර නොතිබුණි.

	කොට්ඨාශයේ ජීවත්වන ජනතාව, දිළිඳුකම සහ භූමීය මත පදනම්ව සාධාරණ ආකාරයකින් සිදු කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වෙන් කරන ලද එකතුව රුපියල් මිලියන 41.53 ක් වූ අරමුදලින් ඉහත විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 40.61 ක මුදලක් වියදම් කර තිබුණි.			ලිපියේ 2.4 ඡේදය අනුව කටයුතු සිදු කිරීමට පියවර ගනු ඇත.	
3.	2019/2020 මහ කන්නයේ වී මිලදී ගැනීමේ කඩිනම් වැඩපිළිවෙල යටතේ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සහල් මෝල් හිමිකරුවන් 04 දෙනෙකුගෙන් සහ ලංකා සතොස ආයතනයෙන් ලැබිය යුතු එකතු වටිනාකම රු. 6,490,269 ක් වූ සහල් කිලෝග්‍රෑම් 77,146 කට අදාල මුදල් වර්ෂ 03ක කාලයක් ඉක්ම ගියද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අයකරගෙන නොතිබුණි.	2023	අදාල මුදල් කඩිනමින් අය කර රාජ්‍ය ආදායමට බැර කල යුතුය.	නීතිමය පියවරක් ලෙස කන්තලේ පොලිසියට පැමිණිල්ලක් යොමු කර ඇත. මෙම ගැටළුව තුල සාපරාධී වරදක සලකුණු නොමැති බව කන්තලේ පොලිසිය දන්වා ඇති බැවින් නීතිපතිවරයාගෙන් වැඩිදුර උපදෙස් ඉල්ලා ඇත.	2024 සැප්තැම්බර් 30 දක්වාත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.22 වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,705,224,668	53,944,802	1,651,279,866	තත්ත්වාගණනය නොකළ
2022	1,702,852,987	24,143,871	1,678,709,117	තත්ත්වාගණනය කළ
2023	1,700,012,762	14,426,559	1,685,586,203	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	පසුගිය වර්ෂයේදී නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය විසින් වවුනියා දිස්ත්‍රිකක්යට වැසිකිළි 456 ක් ඉදි කිරීමේ කාර්යයට ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදනවලින් වෙංගලචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.700,000 ක් ප්‍රතිපාදන සලසා තිබූ වැසිකිළි 10ක් මේ දක්වා ඉදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	අක්මුදල් ලබාගෙන කඩිනමින් වැසිකිලි පද්ධති ඉදිකිරිමට සුදුසු පියවර ගතයුතු වේ.	අක්මුදල් ලැබූ විගස අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
2.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 02ක ඇතුළුවීමේ දොරටු සහ නිවාස දොරවල් කඩා සොරකම් සිදුවී තිබූ නමුත් මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව, කටයුතු කළයුතුය	එම නිවාසවල සොරකම් සිදුවීම සම්බන්ධයෙන් දැනගැනීමට ලැබුණු විගස වවුනියාව පොලිස් ස්ථානයේ පැමිණිලි ඉදිරිපත් කර පාඩු පිළිබඳව දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයා විසින් ඇස්තමේන්තු කර ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.

3.	ග්‍රාමීය නිවාස පුනර්ජීවන වැඩසටහන යටතේ 2016 ආරම්භ කර 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ නිවාස 3,541 කින් නිවාස 64ක් මේ දක්වා ප්‍රතිලාභීන් විසින් පදිංචිය සඳහා භාවිතයට නොගෙන තිබුණි.	2023	ව්‍යාපෘති යේ අරමුණු ඉටුකර ගැනීමට කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.	අභාවිත නිවාස, පදිංචි කරවීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව ගනිමින් පවතින බව .	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
4.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 වර්ෂයේ අයවැය යෝජනා අනුව එකතුව රු.291,639,356ක පිරිවැයකින් ඉදිකර තිබූ වවුනියා ආර්ථික මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් මහජනතාවගේ භාවිතය සඳහා විවෘත කර නොතිබුණු අතර, 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ ජල ගාස්තු සඳහා එකතුව රු.7,846,555ක් වැය කර තිබුණි.	2023	විධිමත් වැඩපිළිවෙලක් යොදා වත්කම අදාල අරමුණ වෙනුවෙන් භාවිතා කිරීමට පියවර ගතයුතුය.	ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය ලැබූ වහාම භාවිතයට ගැනීමට පියවර ගනු ලබන බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
5.	වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පරන්නට්ටකල් පෙරපාසල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යය රු.මිලියන 2 ක ඇස්තමේන්තුවක් යටතේ ප්‍රජා පාදන සංවිධානයකට කොන්ත්‍රාත්තුව ලබා දී	2023	ප්‍රතිපාදන හා අග්‍රිම මුදල් ලබා ගැනීම පිළිබඳ අවධානය යොමු කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග	අදාල වැඩසටහන රු.194,844,840 ක ඇස්තමේන්තුගත පිරිවැයක් මත කොන්ත්‍රාත් අත්සන් කර තිබුණි. එසේ වූවත්, එම මූල්‍ය වර්ෂයේ අක්මුදල් නොලැබීමෙන් මෙම වැඩසටහන අත්සන් කළ දිනයේ අවසන්	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර නොතිබුණි

	එකතුව රු.1,551,712ක් වැයකර තිබුණි. ඉදි කිරීම් කටයුතු 2019 දෙසැම්බර් 06 දින නිම කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදි කිරීම් සම්පූර්ණ කර නොතිබුණි.		ගැනීමත් කළ යුතුය.	කළ නොහැකි වූ බව.	
6.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ වෙංගඩවෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 16ක් පසුගිය මාස 03 සිට වර්ෂ 06කට අධික කාලයක සිට අළුත්වැඩියා කර භාවිතට ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	භාවිතා කළ නොහැකි වත්කම් පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	වෙංගඩවෙට්ටිකුලම් රජ සමූහ (වමරිය) නිවාසය භාවිතා කළ නොහැකි තත්ත්වයක පැවැතීම නිසා එය ඉවත් කරන ලෙසට 2024.04.15 දින ඉල්ලීමට අනුව ඉදිරි ක්‍රියාමාර්ග දිස්ත්‍රික් ඉන්ජිනේරුවරයාගේ වාර්තාවට අනුව ක්‍රියාමාර් ගනු ලබන බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
7.	වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් යතුරුපැදි 08ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර වර්ෂ 02ක සිට වර්ෂ 07ක් දක්වා කාලයක් අනාරක්ෂිතව ගාල් කර තිබුණි.	2023	අළුත්වැඩියා හා නඩත්තු කටයුතු විධිමත්ව සිදු කර ඵලදායී ලෙස වාහන භාවිතයට පියවර ගත යුතුය.	අළුත්වැඩියා කර භාවිතා කළහැකි යතුරු පැදි භාවිතා කිරීමටත් ඉතිරි ඒවා චක්‍රලේඛ ප්‍රකාරව අපහරණයටත් කටයුතු කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දක්වාත් වාහන භාවිතයට ගෙන නොතිබුණි.
8.	සමාලෝචිත වර්ෂයේ එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය යටතේ වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක එකතුව	2023	චක්‍රලේඛ කොන්දේසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගතයුතු අතර රක්ෂණ මුදල්	ලබාදුන් සම්පූර්ණ ප්‍රතිපාදන සඳහා එළුවන් මිලදී ගෙන ලබාදෙන ලෙසටත්, රක්ෂණ වියදම් ප්‍රතිලාභීන් විසින්ම දරා	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

	රු.13,285,369 ක වියදමින් එළුවන් 525ක් ලබා දී තිබුණි. වවුනියා දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දුන් එළුවන් 49ක් විධිවිධාන ප්‍රකාරව රක්ෂණය කර නොතිබුණ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක මියගිය රක්ෂණය කළ එළුවන් 44 ක් සඳහා එක් එළුවෙකුට රු.2,935ක් බැගින් එකතුව රු.129,140ක රක්ෂණ වන්දි ආයතනය විසින් ප්‍රතිලාභීන්ට ලබා දී නොතිබුණි.		අදාල ආයතනයෙන් ප්‍රතිලාභීන්ට ලබාදීමට පියවර ගත යුතුය.	ගැනීමට එකඟවීමට අනුව මිලදී ගෙන බෙදා හරින ලදී. රක්ෂනය කළ අතරතුරදී රෝගාබාධවලට භාජනය වී මියගිය එළුවෙකු පිළිබඳ තොරතුරු අදාල පශු සම්පත් වෛද්‍යවරයාට නොදැන්වීමත්, වෛද්‍ය වාර්තා තහවුරු නොකිරීමත්, නිසා රක්ෂණ වන්දි ලබා දී නොමැති බව.	
9.	සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් බතික් විකුණුම් මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වී නොතිබුණ අතර ඒ සඳහා දරා ඇති වියදම් පරීක්ෂාවේදී එකතුව රු.354,184ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුය.	තාන්ඩිකුලම් බතික් විකුණුම් මධ්‍යස්ථානයේ ඔබ විසින් සඳහන් කළ වැඩසටහනේ කාර්යයන් 17 සහ 18 අවසන් වී ඇති අතර, ඉතිරි කාර්යයන් කඩිනමින් අවසන් කරන බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
10.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිවාස 04ක පදිංචි වී සිටි අයගෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු කුලී එකතුව රු.278,085ක් මාස එකේ සිට මාස 23කට අධික කාලයක් අයකර නොතිබුණි.	2023	හිඟකුලි අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ලිපි සහ සිහිකැඳවීම් ලිපි කිහිපයක් යවා තිබූ නමුත් අදාල දෙපාර්තමේන්තු විසින් හිඟමුදල් යවා නොතිබුණි.	හිඟකුලි අයකර නොතිබුණි.

11.	වවුනියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු යටතේ රජයේ බැංකුවක වවුනියා ශාඛාවට ලබා දී ඇති ඉඩමක් වෙනුවෙන් වර්ෂ 12ක් සඳහා ගෙවිය යුතු බදු වාරික හා දඩ ගාස්තු එකතුව රු.45,392,000ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2023	බදුකුලී සහ දඩ ගාස්තු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	වවුනියා ලංකා බැංකුව විසින් 2012 ඔක්තෝබර් 14 දින තක්සේරු වාර්තා ලැබී තිබුණි. බැංකු නිලධාරීන්ට කිහිප අවස්ථාවක් ලිපි යවා තිබූ නමුත් බදු මුදල් සහ දඩගාස්තු ගෙවා නොමැති බව.	හිඟමුදල් අයකර නොතිබුණි.

3.23 යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,455,009,928	127,189,405	2,327,820,523	තත්ත්වාගණනය කළ
2022	2,638,849,222	80,288,963	2,558,560,259	තත්ත්වාගණනය කළ
2023	2,775,414,851	50,248,085	2,725,166,766	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	නිර්වේලි අළුකෙසෙල් කැබලි (Chips) නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් අවශ්‍ය ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ ස්ථාපිත කර 2020 ජූනි මාසයේදී නිර්වේලි අළුකෙසෙල් නිෂ්පාදක, විකුණුම් සමූපකාර සමිතිය වෙත පවරා තිබුණි. එදින සිට මේ දක්වා වර්ෂ 02 ක කාලයක සිට එම සියලු වත්කම් භාවිතයෙන් තොරව හා නිසි නඩත්තුවක් නොමැතිව පවතී. නිෂ්පාදන වියදම් අධික බවත්, නිෂ්පාදන අවශ්‍යතාවට එම යන්ත්‍රය නුසුදුසු බවත් අදාළ සමූපකාර සමිති පරිපාලනයේ මතය වී තිබුණි. කෙසේවුවත්, නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කළ	2021	ව්‍යාපෘති සිදුකිරීමට ප්‍රථම නිවැරදිව සැලැසුම් කිරීමටත්, තාක්ෂණික ඇගැයීම් සිදුකිරීම මගින් ඒවා සාර්ථක කර ගැනීමටත් හා භාවිතයට නොගන්නා වත්කම් ඵලදායි ආකාරයෙන් භාවිතා කිරීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙම යන්ත්‍ර භාවිතා කර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන බව දිස්ත්‍රික් සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා විසින් දැනුම් දී ඇත.	අදාල ක්‍රියාමාර්ග 2024 සැප්තැම්බර් 30 දක්වාත් ගෙන නොතිබුණි.

	රු.10,325,421 ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.				
2.	යාපනය, වලිහාමම් නිරිත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලිවල පිරිවැය එකතුව රු.48,299,000 ක් සහ 2018 වර්ෂයේ නිල සෙවන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07 ක එකතුව රු.30,830,235 ක් වියදමින් ඉදිකර තිබු ග්‍රාම නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සඳහා කාර්යාල ගොඩනැගිලි 12 ක් ඉදිකර තිබු ඉඩම් 2021 මාර්තු මස දිනැති 05/2021 අංක දරන ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛයේ ඡේද අංක 2.1 අනුව දිස්ත්‍රික් ලේකම්ට හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ට අයිති වී නොතිබුණි. කෙසේවුවද, මෙම පුද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමට හෝ අත්පත්කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	2022	මෙම කාර්යාලවල ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	අදාල කටයුතු කෙරෙමින් පවතී.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.
3.	නැවත පදිංචි කිරීම් නිවාස පහසුකම් සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ 2016 සහ 2021 වර්ෂවල ක්‍රියාත්මක	2023	ඉදි කිරීම් සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 137, 138 හා 237(ආ)(1) ප්‍රකාරව කටයුතු	ගෙවීම් සම්පූර්ණයෙන් නිදහස් කිරීමට පියවර ගෙන ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

	කළ රු. මිලියන 1ක හා රු. මිලියන 0.6ක නිවාස යෝජනා ව්‍යාපෘතිවලින් රු. මිලියන 1ක්වූ ව්‍යාපෘති ප්‍රතිලාභීන් 1,458කගේ සහ රු. මිලියන 0.6ක නිවාස ව්‍යාපෘති ප්‍රතිලාභීන් 234කගේ නිවාස ඉදිකිරිමේ කාර්යයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සම්පූර්ණයෙන් අවසන් වී නොතිබුණද, එකතුව රු.65,958,938ක්වූ සියළුම ගෙවීම් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට බැර කර එම මුදල් ආපසු ලබාගත නොහැකි අයුරින් ස්ථාවර නියෝග මගින් අත්හිටුවා තිබූ බව නිරීක්ෂණය විය.		කළ යුතු අතර, විධිමත් පරීක්ෂාවක් කර ඒ අනුව කටයුතු කර නොමැති නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය.		
4.	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති සඳහා වැය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබී තිබූ එකතුව රු.20,996,124ක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග නොගෙන වර්ෂ 06ක කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.	2023	වියදම් පියවීම සඳහා ලැබී තිබූ තැන්පතු මුදල් නියමිත කාලවකවානුව තුළ අදාල පාර්ශව වෙත ආපසු ගෙවීමට පියවර ගත යුතුය.	මලාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය අවසන් කර ඇත. එම ගෙවීම් පියවීම සම්බන්ධ කමිටුවක් ස්ථාපිත කර ඇති අතර, ඉතා ඉක්මනින් මේවා පියවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	අදාල ක්‍රියාමාර්ග 2024 සැප්තැම්බර් 30 දක්වාත් ගෙන නොතිබුණි

5.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිශිෂ්ඨයේ 9 වගන්තිය ප්‍රකාරව, නිවාඩු දින වැටුප් ගෙවීමට අදාල පැය ගණන සාමාන්‍ය රාජකාරි ඉටුකරන කාලය පදනම් කරමින් පමණක් ගණනය කළයුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක සේවය කරන නිලධාරීන් 73ක් සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව රාජකාරියට වාර්තා කර තිබුණද, ඒ පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව ඔවුන්ට නිවාඩු දින වැටුප් ගෙවා තිබීමෙන් එකතුව රු. 1,763,047ක වැඩිපුර ගෙවීමක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.	2023	වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමට පියවර ගත යුතුය.	අමාත්‍යාංශයේ උපදෙස් අනුව වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
6.	2018 සහ 2020 වර්ෂවල පිළිවෙලින් වෙනත් අමාත්‍යාංශ දෙකක් විසින් ලබාදී තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් 2021 වර්ෂය අවසන් වනවිට එකතුව රු.196,039,247ක් වැය කර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මට්ටුවිල් ආර්ථික මධ්‍යස්ථානය ඉදිකර තිබූ නමුත් එම	2023	එම ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.	ආර්ථික මධ්‍යස්ථානයේ මෙහෙයුම් ආරම්භ කිරීමට පියවර ගෙන ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

	ව්‍යාපෘතිය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.				
7.	බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරිමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් රු.56,640,750ක් වැය කර 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ කිරි පාස්වරීකරණ ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් යන ව්‍යාපෘති දෙකම 2019 වර්ෂයේ නිමකිරීමට සැලැසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිම කර නොතිබුණි.	2023	සැලසුම් පරිදි ව්‍යාපෘති නිමකර වත්කම් උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය .	එම ගොඩනැගිලි ඉදිකර අවසන් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය 2024 ජූලි 02 දින කෘෂිකර්ම අමාත්‍යාංශයට යවා ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
8.	බන්ධනාගාර, ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරිමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් වෙන් කළ රු.75,323,600ක් වූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් 2018 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ මලාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය 2019 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබූ	2023	විධිමත් වැඩපිළිවෙලක් සකසා ව්‍යාපෘතිය සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය .	එම ගෙවීම් පියවීමට කමිටුවක් ස්ථාපිත කර ඇති අතර කඩිනමින් ටම්වා නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. තවද, ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ සහාය සහිතව එම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට කටයුතු කරමින් පවතින බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

නමුත් එම ව්‍යාපෘතිය සඳහා රු.65,955,381ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

3.24 මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	905,466,284	183,291,771	722,174,513	තත්ත්වාගණනය කළ
2022	957,155,766	160,765,533	796,390,233	තත්ත්වාගණනය කළ
2023	2,186,045,019	268,117,997	1,917,927,022	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	මුසලි සමෘද්ධි බැංකු මුදල් අයකැමි විසින්, බැංකු කවුන්ටරයේ ප්‍රතිලාභීන්ගේ සෘජු පැමිණීම හා පුද්ගල අනන්‍යතාව ආදිය තහවුරු කර නොගෙන මුදල් රෙගුලාසි 139ට පටහැනිව ප්‍රතිලාභීන් වෙත රු.3,392,000ක් ලබාදී තිබුණ අතර, මෙම මුදල අදාල නිලධාරියා විසින් වැරදි සහගත ලෙස භාවිතා කිරීමෙන් පාඩුවක් සිදුකළ බවට තහවුරු වී තිබුණි. ඒ අනුව එම මුදලින් රු.2,650,000ක් අයකර තිබූ නමුත්, ඉතිරි රු.942,000ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල ප්‍රතිලාභීන්ගේ පුද්ගල අනන්‍යතාව තහවුරු කර ගෙවීම් සිදුකළ යුතු අතර, තවදුරටත් අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමෘද්ධි බැංකුව විසින් සිදුකළ ඇතැම් ගනුදෙනු පිළිබඳව සම්පූර්ණ පැහැදිලි කිරීම් එම බැංකුවෙන් ලබාගෙන කඩිනමින් යැවීමට කටයුතු කරනු ලබන බව.	ඉතිරි රු.942,000 ක් මේ දක්වා අයකර නොතිබුණි.
2.	විවිධ කාර්යයන් සඳහා ලැබී තැන්පත් ගිණුම් ශීර්ෂ 02ක් යටතේ තැන්පත් කර තිබූ එකතුව රු.4,125,661ක	2023	නියමිත අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග	සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.

	තැන්පතු 66ක් මාස 03 සිට 40ක් නිෂ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා තිබුණි.		ගතයුතු වේ.		
3.	මාන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ, එකතුව රු.1,889,938ක් වටිනා චෙක්පත් 49ක් වර්ෂ 07ක සිට හඳුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ පැවැති නමුත් මේ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 104-110 ප්‍රකාරව ක්‍රියා මාර්ග ගත යුතු වේ.	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම වංචාව පිළිබඳව පත්කළ විශේෂ කමිටුවේ තීරණය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගනු ලබන බව.	මේ දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
4.	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රතිපාදනයෙන් නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු. 6,321,438ක් වැයකර 2021 හා 2022 වර්ෂවල සමෘද්ධි පෝෂණීය බොජුන්හල සහ විකුණුම් මධ්‍යස්ථානය ස්ථාපිත කර තිබූ නමුත් නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර මෙම ගොඩනැගිල්ල ඉදිකර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ළඟාකර ගෙන නොතිබුණි.	2023	ඉදිරියේ මෙවැනි ඉදි කිරීම් සිදු කිරීමේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු බවත්, මේ වනවිට ඉදි කර ඇති සමෘද්ධි පෝෂණීය බොජුන්හල කාර්යක්ෂම ලෙස මෙහෙයවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය වේ.	පිළිතුරු ලබාදී නොමැත.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.

5.	කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු. මිලියන 9.9ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ නොදියුණු ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය ඉහළ නැංවීම සඳහා 2023 වර්ෂයේ යෝජිත එළුවන් අභිජනන ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභීන් 120කට ලබාදුන් ගැහැණු එළුවන් 360කින් 2024 මැයි 06 දින වනවිට ලබාදුන් එළුවන් 20ක් දින 14ක් තුළ රෝගාබාධ හේතුවෙන් මියගොස් තිබූ බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේ වුවත්, ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරු විසින් මියගිය එළුවන් වෙනුවට අළුතින් එළුවන් මේ දක්වා ලබානොදීම හේතුවෙන් අපේක්ෂා කළ ප්‍රතිලාභ ළඟාකර ගත නොහැකිවී තිබුණි.	2023	ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, සැපයුම්කරු වෙතින් මියගිය එළුවන් වෙනුවට අළුතින් එළුවන් ලබාගැනීමට පියවර ගතයුතු වේ.	සැපයුම්කරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.
6.	මන්නාරම දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ සමෘද්ධි බැංකු 09ක් මගින් සමෘද්ධි සහනාධාර ලබාගන්නා සාමාජිකයින් 622කට ලබාදුන් ණය මුදලින් මාස 03 සිට 30 දක්වා කාලපරිච්ඡේදයක්	2023	ලබාදුන් ණය, ගිවිසුම් ප්‍රකාරව මාසිකව අයකර ගැනීමට සුදුසු පියවර ගතයුතු වේ.	හිඟහිටි ණය සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ට උපදෙස් ලබාදී අයකිරීම් සිදුකරමින් පවතී. තවදුරටත්, අයකළ නොහැකි ප්‍රතිලාභීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රගති සමාලෝචන කමිටුවේදී	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.

	මාසික ණය වාරික අය කර නොමැති හිඟහිටි ණය ශේෂයේ එකතුව රු.25,160,211ක් වූ අතර එම හිඟ ණය අයකිරීම් පිළිබඳ කාර්යක්ෂම ක්‍රියාමාර්ග කිසිවක් සමෘද්ධි කළමනාකරුවන් හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් ගෙන නොතිබුණි.			දිස්ත්‍රික් ලේකම් වරයා විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබාදී කටයුතු සිදුකරමින් පවතින බව.	
7.	මන්නාරම දිස්ත්‍රික් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වූ සමෘද්ධි බැංකුවල බැංකු ගිණුම් පරික්ෂාවට ලක්කිරීමේදි ප්‍රතිලාභින් සඳහා මාසික සමෘද්ධි ගෙවීම් සමෘද්ධි බැංකු ගිණුමෙහි අඛණ්ඩව තැන්පත් කර තිබූ නමුත් ප්‍රතිලාභීන් 223ක් එකතුව රු.17,739,811ක් මාස 10 සිට 48ක් දක්වා ආපසු නොගෙන තම අවශ්‍යතා සඳහා උපයෝජනය කර නොතිබුණ බව නිරීක්ෂණය විය. ඒ අනුව සහනාධාර අවශ්‍යතාවයක් නොමැති ප්‍රතිලාභීන් තෝරාගෙන තිබූ බව නිරීක්ෂණය විය.	2023	සමෘද්ධි ප්‍රතිලාභීන් තේරීම නිර්ණායක අනුව සිදු කිරීමටත් විධිමත් පරීක්ෂාවක් සිදු කර අනවශ්‍ය පුද්ගලයින් ඉවත් කර ප්‍රතිලාභ අවශ්‍යම පුද්ගලයන්ට ලබා දීමට පියවර ගත යුතුය.	වර්තමානය වන විට මේවා තහවුරු කර සුදුසු අයට ලබාදීමටත් අනෙකුත් අයට ලබාදීම නැවැත්වීමටත් ක්‍රියාකරමින් පවතින බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි.

3.25 මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,388,321,957	49,733143	1,338,588,814	තත්ත්වාගණනය කළ
2022	1,498,400,735	60,945,629	1,437,455,106	තත්ත්වාගණනය කළ
2023	1,424,902,250	11,618,159	1,413,284,091	තත්ත්වාගණනය කළ

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
1.	ඉඩම් මිල දී ගැනීමක් වෙනුවෙන් සී/ස ලංකා මිනරල් සැන්ඩ් සමාගම විසින් 2012 වර්ෂයේදී – දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදුන් රු.2,250,000 ක් අදාළ අරමුණු සඳහා භාවිතා නොකර පසුගිය වර්ෂ 09 කට වැඩි කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.	2021	අදාල අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය.	මුල් අයිතිකරුවන් මිය ගොස් ඇති බැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් ප්‍රමාද වී තිබුණි.	ඇගැයීම සිදු කෙරෙමින් පවතින අතර, මෙම මුදල අදාළ පාර්ශවය වෙත ගෙවා තිබුණි.
2.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් එකතුව රු.මිලියන 183.9ක පිරිවැයකින් ඉදිකර ජනතාවට ලබාදුන් නිවාස 118ක් පසුගිය වර්ෂ 06 සිට 10ක් දක්වා කාලයක් පදිංචිකරුවන් විසින් භාවිතා නොකර පැවතුණි.	2022	එම නිවාස තවදුරටත් ඵලදායි අන්දමින් භාවිතා කිරීමට කටයුතු සිදුකළ යුතුවේ.	ආර්ථික, අධ්‍යාපන හා සෞඛ්‍ය හේතූන් මත වෙනත් ප්‍රදේශ වෙත ගොස් ජීවත් වීම නිසා මේවා භාවිතා කිරීමට නොහැකි වී තිබේ.	නැවත පදිංචි කිරීමේ කාලය තුළ නිවාස ඉදිකර ඇත. එහෙත් පෞද්ගලික හේතු මත ප්‍රතිලාභීන් විවිධ ස්ථානවල පදිංචි වී ඇත.
3.	ජාතික ළමාරක්ෂක අධිකාරිය විසින් සලසා තිබූ මූල්‍ය ප්‍රතිපාදනයෙන් එකතුව	2022	අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර	විගණන නිරීක්ෂණයට අදාළ වන පරිදි පිළිතුරු ලබා දී නොතිබුණි.	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් ප්‍රයෝජනයට ගෙන නොමැත.

	රු. මිලියන 24.19ක පිරිවැයකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ භාණ්ඩ අයිතම 481ක් සහ පහසුකම් සහිතව සෙල්වපුරම්හි ඉදිකර තිබූ අනාරක්ෂිත හා අතවරයට ලක්වූ ළමුන් වෙනුවෙන් වූ ආරක්ෂිත මධ්‍යස්ථානය පසුගිය වර්ෂ 08ක කාලයක් අපේක්ෂිත ප්‍රතිලාභ අත්කර නොගෙන නිශ්කාර්යව පැවැතුණි.		ගතයුතු වේ.		
4.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් විදුලි ජනක යන්ත්‍රයක් වර්ෂ 06ක කාලයක් භාවිතා කර නොතිබුණි. එසේම, 2016 දෙසැම්බර් මාසයේදී රු. මිලියන 9.8කට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන විදුලි විසන්ධි වීමකදී පමණක් භාවිතා කිරීමට මිලදී ගෙන තිබුණු කි.වො. 502 (502KW) අධිබලැති තවත් විදුලි ජනකයක් යන්ත්‍ර පැය 385ක් ක්‍රියා කිරීමෙන් පසු අක්‍රීය වී තිබුණි.	2022	අළුත්වැඩියා කර ඵලදායි අයුරින් භාවිතා කිරීමට උචිත පියවර ගතයුතු වේ.	ප්‍රතිපාදන ලැබූ විට අළුත්වැඩියා කිරීමට කටයුතු කරනු ලැබේ.	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් භාවිතයට ගෙන නොතිබුණි.
5.	2019 සැප්තැම්බර් 10 දින මුල්ලියවලෙයිහි ලෝක ආහාර වැඩසටහන සඳහා ගබඩාවේ තබා තිබූ යතුරු පැදි 03ක් සහ ලොරි රථ 02ක්	2022	සම්බන්ධිත ලේඛන , පොත්පත් භෞතික පරීක්ෂාවට ඉදිරිපත් කිරීමට පියවර	අදහස් දක්වා නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	සමාලෝචිත වර්ෂයේ භෞතික පරීක්ෂාවන්ට ලක් වී නොතිබුණි.		ගතයුතු වේ.		
6.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06කට අයත් බවට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරමින් පැවැති ඉඩම් හිමිකම් ඔප්පු/ පවරා ගැනීමේ නියෝග සහ මිනින්දෝරු සැලැසුම් ආදිය පසුගිය වර්ෂ 10කට අධික කාලයක් විගණනයට ලබාදී නොතිබූ අතර ඒවා ලබාගෙන සාධාරණ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට මේ දක්වා ඵලදායි පියවරද ගෙන නොතිබුණි.	2022	හිමිකම් ඔප්පු සහ ඉඩම්වල වපසරියත් සනාථ කර ලබාගෙන එහි සාධාරණ වටිනාකම රජයේ තක්සේරුකරු මගින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට ඵලදායි පියවර ගතයුතු වේ.	මේ සම්බන්ධ මෙහෙයුම් කඩිනමින් ආරම්භ කෙරේ.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි
7.	2020/2021 කාලපරිච්ඡේදයේ කොවිඩ් වසංගතය පැවති කාල සීමාවේ විශේෂ ප්‍රතිලාභ ගෙවීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ මුදලින් ප්‍රතිලාභීන්ට නොගෙවා ඉතිරිව තිබූ රු.579,500ක් නැවත එම දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය නොකර පුදුකුඩියිරුප්පු ප්‍රජා බැංකුවේ රඳවාගෙන තිබුණි.	2023	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට නැවත ප්‍රතිපූර්ණය කිරීමට පියවර ගත යුතුය.	ආපසු ප්‍රතිපූර්ණය කිරීමට පියවර ගෙන ඇති බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

8.	සමෘද්ධි සමාජ පදනම් බැංකු 03ක් විසින් 2014 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයේ ප්‍රතිලාභීන් 31කට ලබාදුන් ණයවලින් එකතුව රු.1,421,364ක හිඟහිටි ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට පැවතුණි.	2023	හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට සුදුසු පියවර ගත යුතුය.	සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මාර්ගයෙන් ණය අයකර ගැනිමට පියවර ගනු ලබන බව.	හිඟමුදල් අයකර නොතිබුණි.
9.	සමෘද්ධි සමාජ පදනම් බැංකුවල පැවැති ගිණුම් වර්ග 05ක ප්‍රතිලාභීන් 6,172කගේ එකතුව රු.26,299,722ක අක්‍රිය බැංකු ගිණුම් ශේෂ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානයටත් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් සක්‍රීය කිරීමට විධිමත් පියවර ගත යුතුය.	මෙවැනි ගිණුම්වල සංඛ්‍යාව අඩුකරමින් පවතින බව.	සුදුසු ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන නොතිබුණි
10.	ගොවීන්ගෙන් වී මිලදීගෙන විකිණීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිදු ගිවිසුමකින් තොරව විවිධ සේවා සමූපකාර සමිති දෙකක් වෙත 2015 වර්ෂයේ ලබාදුන් එකතුව රු.20,729,785ක අත්තිකාරම් මුදලින් එකතුව රු.14,259,125ක් හෙවත් සියයට 69ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කර නොතිබුණි.	2023	අයවිය යුතු අත්තිකාරම් මුදල් ආපසු ලබා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	පනංගාමම්පත්තු වි.සේ.ස. සමිති ශේෂය රු.1,909,125ක් ලෙසත්, විසුවාමඩු වි.සේ.ස. සමිති ශේෂය රු.12,350,000ක් ලෙසත්, තවදුරටත් අයවිය යුතුව පවතින බව.	මේ දක්වා අත්තිකාරම් එකතුව රු. 14,259,125 ක් නිරවුල් කර නොතිබුණි.

11.	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ ග්‍රාමීය නිවාස, ඉදිකිරීම් කර්මාන්ත සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් කොටස් වශයෙන් දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 98කට ලබාදුන් නිවාස යෝජනා ව්‍යාපෘති සඳහා වූ ගෙවීමට නියමිත මුදල් රු.13,405,280ක් අදාල ප්‍රතිලාභීන්ට ලබානොදී පුදුකුඩියිරුප්පු, ඔඩ්ඩුසුඩාන්, උඩෛයාර්කට්ටු සමෘද්ධි බැංකු ගිණුම්වල වර්ෂ 01 ක සිට වර්ෂ 04ක් දක්වා කාල පරාසයක් අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් රඳවාගෙන තිබුණි.	2023	සමෘද්ධි බැංකු ගිණුම්වල ඇති එම මුදල් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට සුදුසු පියවර ගත යුතුය.	අදාල බලධාරීන්ගේ අනුමැතිය ලැබූ වහාම ගෙවීම් සිදුකිරීමට කටයුතු කරන බව	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන වී නොතිබුණි
12.	දිස්ත්‍රික්කයේ සමෘද්ධි ජීවනෝපාය සහනාධාර සම්බන්ධ ප්‍රතිලාභීන්ගේ ගිණුම් නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 135කගේ ගිණුම්වලට බැර කර ඇති රු.32,106 සිට රු.175,749ක් දක්වා පරාසයකින් සෑදුම්ලත් එකතුව රු.8,443,715ක සහනාධාර මුදල් ජීවනෝපාය ඉහළ	2023	ප්‍රතිලාභීන් සම්බන්ධව විමර්ශනය කර ජීවනෝපාය ගෙවීම් අදාල අරමුණු සඳහා උපයෝගි කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉහත ප්‍රතිලාභීන්ගේ විස්තර ලබාගෙන ක්ෂේත්‍ර නිලධාරීන් මාර්ගයෙන් ප්‍රතිලාභීන් හඳුනාගෙන ගෙවීම් සිදුකරමින් පවතින බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි

	නැංවීමේ අරමුණු සඳහා උපයෝජනය නොකර සමෘද්ධි බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවතුණි.				
13.	2019 වර්ෂයේදී තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරි කමිටුව විසින් තීරණය කර තිබූ තක්සේරු වටිනාකමට අනුව රජයේ ඉඩම් 19ක් වෙනුවෙන් අයකළ යුතු එකතුව රු.3,268,790ක බදුගාස්තු පසුගිය වර්ෂ 01 ක සිට වර්ෂ 05ක් දක්වා අයකර නොතිබුණි. එසේම, 2019 වර්ෂයට පෙර කාල පරිච්ඡේදයේ සිට එම රජයේ ඉඩම් සලකුණු කිරීමට පියවර නොගැනීමෙන් එම ඉඩම් පරිහරණය කළ විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු බදු ආදායම් අහිමි වී තිබුණි.	2023	හිඟහිටි බදුගාස්තු අයකර ගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ඇතැම් අය ගාස්තු ගෙවා තිබුණි. තවද, ඇතැම් අයට ලිපි මගින් දැනුම් දී ඇත. 2019 වර්ෂයට පෙර කාලපරිච්ඡේදය සම්බන්දයෙන් කටයුතු කරමින් පවතින බව.	හිඟමුදල් අයකර නොතිබුණි.
14.	තුනුක්කායි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ප්‍රතිලාභියෙකුට තාවකාලික බදු පදනමින් 2014 වර්ෂයේ ලබාදුන් අක්කර 29ක රජයේ ඉඩමට අදාල බදු ගාස්තු එකතුව රු.1,480,000ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් අයකර නොතිබුණි.	2023	හිඟහිටි බදුගාස්තු අයකර ගැනිමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාට යවා ඇත. උපදෙස් ලැබූ වහාම නියමිත ආදායම් අය කිරීමට පියවර ගනු ලබන බව.	හිඟමුදල් අයකර නොතිබුණි.

15.	පෙර දැනුම්දීමකින් තොරව රාජකාරියට වාර්තා නොකළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් 04කුට සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ සේවකයෙකුටත් ඔවුන් සේවයට වාර්තා නොකළ කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.712,675ක් වැඩිපුර වැටුප් ගෙවා තිබුණි.	2023	වැටුප් ආපසු අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු අතර, එම නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් මුදල් ආපසු අයකර ගැනීමට පියවර ගෙන ඇත. අපොහොසත් වුවහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවත් දැනුම් දී ඇති බව.	වැඩිපුර ගෙවා වැටුප් ආපසු අයකර නොතිබුණි.
16.	කරෙයිතුරෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමාජ සේවා ශාඛාව විසින් 2022 සහ 2023 වර්ෂවල ආබාධිත අය සඳහා දීමනා, වකුගඩු රෝග දීමනා, වයස 70න් ඉහළ හා වයස 100න් ඉහළ වැඩිහිටි දීමනා ලබාදෙමින් සිටි ප්‍රතිලාභීන් 154ට සමාලෝචිත වර්ෂය අවසානය වනවිට එකතුව රු.2,788,300ක් දීමනා මුදල් ලබා දී නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023	නියමිත කාලවකවානු තුළ ප්‍රතිලාභීන්ට හිමිවිය යුතු දීමනා ගෙවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.	මුදල් ලබාගෙන දීමනා සිදුකරිමට අඛණ්ඩව කටයුතු කරමින් පවතින බව.	අදාල ක්‍රියාමාර්ග මේ දක්වා අවසාන වී නොතිබුණි